# අ.පො.ස. සා.පෙළ ඉස්ලාම් කෙටි සටහන් පොත



A PROJECT BY THE

ROYAL COLLEGE ISLAMIC SOCIETY

# 1. අකීදා

අකීදා යනු අවසාන වූත් ස්ථිර වූත් සාධක තුළින් ගොඩනගන ලද විශ්වාසයයි.

අකීදා නැතහොත් අකාඉද් යන පදය විශ්වාසය හුවා දැක්වීමට භාවිතා කරනු ලබයි.

අල්ලාහ් විසින් තෝරා ගන්නා ලද දේව ධර්ම දූතයන් සියල්ලන්ම එකම අකීදාව දේශනා කළ බවට අල්කුර්ආනය සාක්ෂි දරයි.

අකීදා හී ප්‍රධාන විශ්වාස හයම ගෙනහැර දක්වයි.

**1) අල්ලාහ් පිළිබඳ විශ්වාසය**

අල්ලාහ් සිටින්නේය, ඔහුගේ ඒකත්වය සඳහා වන සාක්ෂි, ඔහුගේ ගුණාංග, ඔහුගේ අලංකාර නාම, ඔහුගේ හැකියාවන් හා ශක්තිය යනාදිය මෙහි විස්තර කර ඇත.

**2) මලක්වරුන් පිළිබඳ විශ්වාසය**

මලක්වරුන්, ජින්වරුන් පිළිබඳ විස්තර මෙහි අන්තර්ගත වේ. තවද "රූහ්" පිළිබඳ විස්තරද මෙහි අන්තර්ගත වී ඇත.

**3) ආගම් පිළිබඳ විශ්වාසය**

මිනිස් සමාජයට මග පෙන්වීම උදෙසා අල්ලාහ් පහළ කරන ලද සුහුෆ්, ආගම් පිළිබඳව මෙහි පැහැදිලි කර ඇත.

**4) නබිවරුන්, රසුල්වරුන් පිළිබඳ විශ්වාසය**

නබිවරුන්ගේ ගුණාංග, ඔවුන්ට ලබාදෙන ලද හාස්කම් ඔවුන්ගේ සේවා ගැන මෙහි පැහැදිලි කර ඇත.

**5) පරමාන්ත දිනය පිළිබඳ විශ්වාසය**

කබ්රය, බඃස්, හිසාබ්, මීසාන්, සිරාත්, ජන්නා, නාර් පිළිබඳ කරුණු මෙහි අඩංගු වේ.

**6) කළා කද්ර් පිළිබඳ විශ්වාසය**

මුළු විශ්වයම ක්‍රියා කරවන දෙවියන්ගේ අභිප්‍රාය පිළිබඳව මෙහි පැහැදිලි කර ඇත.

මෙම ප්‍රධාන විශ්වාස හය අකීදා ක්ෂේත්‍ර පිළිබඳ විද්වතුන් පහත ආකාරයට කොටස් හතරකට බෙදා ඇත.

1) අල් ඉලාහිශියාත්
2) අන් නුබුව්වාත්
3) අර් රූහානියියාත්
4) අස් සම්ඉයියාත්

**අකීදාවේ සරල බව ගිලිහී ව්‍යාකූල වීමට හේතු ;**

- දේශපාලනික අර්බුද
- අන්‍ය චින්තනයන්ගේ බලපෑම්
- විචාර බුද්ධියෙහි සීමාව ඉක්මවීම.

**අකීදා විෂයෙහි විවිධ මතවාද දරන්නන්ගේ අදහස් තුළින් මුස්ලිම් සමාජයෙහි බිහි වූ විවිධ කණ්ඩායම් ;**

- ජබරියියා
- කදරියියා
- මුර්ජිආ
- මුඃතසිලා, යනාදිය.

**ඉස්ලාමීය අකීදාව මෙවැනි වැරදි ක්‍රියාමාර්ග තුළින් බලපෑමට ලක්වීම වළක්වා ගැනීමට හා එහි පාරිශුද්ධත්වය රැකීමට කැප වූ විද්වතුන් නම්,**

- අහ්මද් බින් හන්බල් රහ්මතුල්ලාහ්
- අබුල් හසන් අල් අෂ්අරි රහ්මතුල්ලාහ්
- අබු මන්සූර් අල් මාදුරූදී රහ්මතුල්ලාහ්

මෙම ඉමාම්වරුන් "අහ්ලුස් සුන්නාහ් වල් ජමාආ" වට අයත් වූවෝ වෙති.

අහ්ලුස් සුන්නා වල් ජමාආ යනු මුහම්මද් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාගේ හා සහාබිවරුන්ගේ මඟ පිළිපදින්නෝ වෙති.

## 2. ඊමාන් සහ අමල්

ඉස්ලාම් පවසන කරුණු විශ්වාස කිරීම **ඊමාන්** ලෙසින් එහි දේශනා පිළිපැදීම **අමල්** ලෙසත් සැලකේ.

ඊමානයෙන් තොරව සිදු කරනු ලබන කිසිඳු අමලයක් පිළිගනු නොලැබේ.

ඊමාන් හා අමල් එකට එක් කර ස්ථාන 70 ක පමණ සඳහන් කර ඇත.

**"මුඃමින්වරයෙකු හා කාෆිර්වරයකු අතර ඇති වෙනස සලාතය අතහැරීම වේ." (බුහාරි)**

අමල් නොමැති ඊමාන් ඵල රහිත වන්නාසේම ඊමාන් නොමැති අමල් ද ඵල රහිත වේ. මෙවැනි අමල් අල්කුර්ආනය මිරිඟුවක් යැයි පවසයි.

අල්කුර්ආනය ඊමාන් සමඟ අමල් එක්කර පවසන විට, "ඊමාන් කර (යහපත්) සාලිහ් වන ක්‍රියා ඉටු කරන්නන් යනුවෙන්" පවසයි. "සාලිහ් වන අමල්" යන්න නියමිත කාලය තුළ කරන සුදුසු නිවැරදි ක්‍රියා ලෙස පැහැදිලි කළ හැකිය.

තවද, මෙලොව, පරලොව ජීවිතයටත්, තනි පුද්ගල සාමූහික ජීවිතයටත් ආධ්‍යාත්මික - ලෞකික ජීවිතයටත් ගැළපෙන පරිදි සකස්වන සියළුම ක්‍රියා සාලිහ් වන අමල් ලෙස විස්තර කළ හැක.

මුඃමින්වරයෙකුගේ ක්‍රියාකාරිත්වය හා මුඃමින් නොවන කෙනෙකුගේ ක්‍රියාකාරිත්වය අතර වෙනසක් ඇත.

**මුඃමින්වරයෙකුගේ ක්‍රියාකාරිත්වය පහත සඳහන් කොන්දේසි වලට ඇතුළත් වේ.**

1) අල්ලාහ්ට හා ඔහුගේ දූතයාට යටත්ව සිටීම.
2) මුහම්මද් සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා කළ ආකාරයට එම ක්‍රියා සිදු කිරීම.
3) අල්ලාහ්ගේ තෘප්තිය බලාපොරොත්තුවෙන් සිටීම.
4) අල්ලාහ්ගෙන් පමණක් ප්‍රතිඵලය බලාපොරොත්තුවෙන් සිටීම.

නබි සල්ලල්ලාහු අලෛවසල්ලම් තුමාගේ හා සහාබිවරුන්ගේ ජීවන මාර්ගය හා ජීවන අත්දැකීම් තුළින් අපගේ ඊමානය ශක්තිමත් කරගත හැකි වේ.

එම නිසා අපගේ මුතුන්මිත්තන්ගේ මෙවැනි ආදර්ශ පිළිපදිමින් අපද අපගේ ජීවිතය සාර්ථක කරගත යුතුවේ.

## 03. රිසාලත් හා හිදායත්

**රිසාලත්** යනු දේව ධර්ම දූතයන්ට අල්ලාහ් විසින් ප්‍රදානය කරන ලද මඟපෙන්වීමයි.

මෙම රිසාලත් මිනිසා යහමඟ යැවීමට අත්‍යාවශ්‍ය වේ.

**හිදායත්** යනු අල්ලාහ් තමා ප්‍රියකරන්නන් වෙත පමණක් අවනත වීමේ හැඟීම ඇති කරනු ලැබීමයි.

**රිසාලත් ;**

1) මිනිසාට ගුණාත්මක සාරධර්ම හඳුනාගැනීමටත් ඒවා රැක ගනිමින් ජීවත් වීම අත්‍යාවශ්‍ය වේ.
2) මිනිසාට ඔහු මවන ලද අරමුණ එම පදනම මත ක්‍රියා කිරීමට මඟපෙන්වයි.
3) දේව මඟපෙන්වීම උදෙසා මාධ්‍යයක් ලෙස ක්‍රියා කරයි.
4) මිනිස් සමාජය ආරක්ෂා කර සියළු දෙනා අනිවාර්යයෙන්ම සමඟියෙන් සිටිය යුතු අවස්ථා පෙන්වා දී සියළු දෙනා සාමකාමී කරන්නේය.

මිනිස් සමාජය දේව මඟපෙන්වීම අත්‍යාවශ්‍යම කරුණක් බැවින් අල්ලාහ් ආරම්භයේ සිටම දේව ධර්ම දූතයන් එවමින් සිටියේය. සුහුෆ් හා ආගමික කෘති පහළ කළේය.

**ආගම්වලට කලින් පහළ කළ සුහුෆ් පහත සඳහන් වේ.**

- ආදම් අලෛහිස්සලාම් 10
- ඉද්රීස් අලෛහිස්සලාම් 30
- මූසා අලෛහිස්සලාම් 10
- ෂීද් අලෛහිස්සලාම් 50
- ඉබ්රාහීම් අලෛහිස්සලාම් 10

මේ අතරින් ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාට හා මූසා අලෛහිස්සලාම් තුමාට පහළ කරන ලද සුහුෆ් පිළිබඳ පමණක් අල්කුර්ආනයේ ප්‍රකාශ කර ඇත.

**එලෙස ;**

- මූසා අලෛහිස්සලාම් තුමාට තව්රාත් ආගමික කෘතියද
- දාවුද් අලෛහිස්සලාම් තුමාට සබූර් ආගමික කෘතියද
- ඊසා අලෛහිස්සලාම් තුමාට ඉන්ජීල් ආගමික කෘතියද
- මුහම්මද් සල්ලල්ලාහු අලෛහිස්සලාම් තුමාට ෆුර්කාන් ආගමික කෘතියද පහළ කෙරුණි.

## 4. ඉබාදත්

**මුස්ලිම් බැතිමතකු තුන් ආකාරයට වගකීම් ඉටුකළ යුතු බවට නියම කරනු ලැබ ඇත. ඒවා නම්,**

i. ඉබාදත් - අල්ලාහ් නැමදීම, අවනත වීම.
ii. ඉමාරත් - පොළොව සරු කිරීම.
iii. කිලාෆත් - මෙලොව අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස එය පාලනය කිරීමත් වේ.

**ඉබාදත් නම් අරාබි පදය "අබද" යන ක්‍රියා පදයෙන් බිහි වූවකි.**
**මෙම පදයෙහි ඃ නමදින්නේය,**
**අවනත වූවේය,**
**යටත් වීම, අවනත වීම යන තේරුම් ගෙන දෙයි.**

ඉබාදත් යනු අල්ලාහ් අපට කළ විධාන ගෙන ක්‍රියා කිරීම තුළින් හා වළක්වන ලද දෙයින් වැළකී සිටීමත් තුළින් ඔහුට යටහත්ව ක්‍රියා කිරීම වේ යනුවෙන් ඉස්ලාම් සම්ප්‍රදාය තුළ අර්ථකථනය කර ඇත.

**"මා නැමදීම හැර (වෙන කිසිවක් උදෙසා) මම, ජින්වරු හා මිනිසා නොමැව්වෙමි."**
**අල්කුර්ආන් (51:56)**

මේ අනුව බලන කල, ඉබාදත්හි මුළු ජීවිතයම ඇතුළත් කර ඇත. යන්න අපට වටහා ගත හැක.

සත්‍ය වශයෙන්ම ඉබාදත් යන්නෙන් නිශ්චිත නැමදුම් කීපයක් මෙන්ම දෛනික ජීවිතය තුළ සිදු කරනු ලබන කාර්යයන් සඳහන් වේ.

මුළු ජීවිතයම ඉබාදත් ලෙස සැකසිය යුතු නම් ෂරිආවට අනුව සියළු කාර්ය සකස් කරගත යුතුයි.

### ඉබාදත් හි අරමුණු

අල්ලාහ් අපට අනිවාර්ය කරන ලද සියළු ඉබාදත් දෙලොවෙහිම භාග්‍යය හිමි කර දෙන උසස් අරමුණු සහිත ඒවාය.

**සලාතය, සකාතය, උපවාසය, හජ් වැනි මූලික ඉබාදත් අනිවාර්ය කරන ලද අරමුණු පිළිබඳ වූ අල්කුර්ආන් අදහස් පහත ආකාරයට ගොනු කළ හැකිය.**

- සිත පාලනය කර දේව භක්තිය ඇති කර ගැනීම.
- අල්ලාහ් සමඟින් බැඳීම වර්ධනය කරගැනීම.
- පාපී ක්‍රියාවන්ගෙන් වැළකී ජීවත් වීමට පුරුදු වීම.
- පරිත්‍යාගශීලීත්වය, ඉවසීම, අන්‍යයන්ට යහපත සැලසීම වැනි ගුණාංග වර්ධනය කර ගැනීම.
- දේව තෘප්තිය ලබා ස්වර්ගයට ඇතුළු වීමට මඟ පාදා ගැනීම.

**ඉබාදත් දෙවර්ගයකි.**

1) මූලික නිශ්චිත ඉබාදත්
2) දෛනික ජීවිතය සමඟ සම්බන්ධ ඉබාදත්

**1) මූලික නිශ්චිත ඉබාදත්**

සලාත්, සකාත්, උපවාසය, හජ් යන ඉබාදත් මෙහි අඩංගු වේ.

මෙවැනි ඉබාදත්, මෙලෙසද සැලකිල්ලට ගත හැකිය.

- **ශරීරය හා ක්‍රියාව සම්බන්ධ ඒවා ඃ**
  සලාත්, උපවාසය, හජ් යනාදිය
- **සිත හා සම්බන්ධ ඒවා ඃ**
  ඉඛ්ලාස්, ඉවසීම යනාදිය
- **ධනය හා සම්බන්ධ ඒවා ඃ**
  සකාත්, සදකා, උළ්හියියා යනාදිය.
- **වචනය හා සම්බන්ධ ඒවා ඃ**
  දෙමාපියන් සමඟ යහපත් ලෙස කතා කිරීම, ඔවුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම.
  මෙලෙස වර්ග කර තිබුණ ද මේවා අතරින් සමහරක් අනෙකුත් ඒවා සමඟ ද සබඳතාවක් තිබෙන බව අවධාරණය කළ හැකිය.

  හජ් යන්න ශරීරය, ධනය හා සිත සමඟ සම්බන්ධ යැයි උදාහරණ ලෙස පැවසිය හැකිය.

**2) දෛනික ජීවිතය සමඟ සම්බන්ධ ඉබාදත්**

ආහාර ගැනීම, නිදා ගැනීම, රැකියාවක නිරත වීම යනාදී දෛනික ක්‍රියාකාරකම් ඉස්ලාම් පවසන කොන්දේසිවලට අනුකූල වන විට ඒවා ඉබාදත් බවට පත් වේ.

මෙවැනි දෛනික ක්‍රියාකාරකම් ඉබාදත් යන තත්ත්වයට පත් වීමට නම් ඉස්ලාම් පහත සඳහන් කොන්දේසි ඉදිරිපත් කර ඇත.

**I. <u>ෂරිආවේ අනුමැතිය</u>**

ආර්ථිකය නැතහොත් ඉපයීම "ඉබාදත්වලට" උදාහරණ ලෙස දැක්විය හැකිය. නමුත් ඉස්ලාමීය ෂරිආ (නීතිරීති) අනුමැතිය නොලත් මත්ද්‍රව්‍ය විකිණීම, සූදුව වැනි කිසිදු ක්‍රියාකාරකමක් ඉබාදත්වලට පත් නොවේ.

**II. <u>පිවිතුරු චේතනාව</u>**

උපයා ජීවත් විය යුතුය, හලාල් වූ ක්‍රමයට වස්තුව සොයාගත යුතුය. අල්ලාහ්ගේ මාර්ගයේ වියදම් කළ යුතුය යන යහපත් අරමුණින් අනුමත කරන ලද රැකියාවක හෝ කාර්යයක නියැලෙන විට එම උත්සාහය ඉබාදත් බවට පත් වේ.

**III. <u>ෂරිආ සීමාව ඉක්මවා නොයෑම</u>**

ඉස්ලාම් අපගේ දෛනික ක්‍රියාකාරකම්වලට සීමා පනවා ඇති අතර ඒවා ඉක්මවා යන විට ඉබාදත් ස්වරූපය නොගනී.
උදාහරණ : ව්‍යාපාරයන් හි පොලිය, අපද්‍රව්‍ය කවලම් කිරීම්, සැඟවීම් යනාදිය නොවිය යුතුයි.

## IV. මූලික වතාවත්වලට අවහිර නොවීම

අපට අනිවාර්ය කරන ලද මූලික ඉබාදත්වලට බාධා වන අයුරින් දෛනික ක්‍රියාකාරකම් සිදු වන්නේ නම් එය ඉබාදත් යන සීමාවෙන් පිටතට යයි.

උදාහරණ : යමෙකුගේ ක්‍රියාවක් නිසා පංචකාල සලාතය ඉටුකිරීමෙහි බාධා වන විට.

## V. නිවැරදිව හා පිළිවෙළට ඉටු කිරීම

පිළිවෙළ හා නිවැරදිභාවය රැකගෙන සාධාරණව කටයුතු කිරීම මෙයින් අදහස් වේ.

උදාහරණ : ක්‍රීඩාවකදී නීති රීති උල්ලංඝනය කර තරඟ වදින්නේ නම්, එය ඉබාදත් ලෙස සැලකිය නොහැකිය.

**ඉස්ලාමීය විද්වතුන් ඉබාදත් හි වැදගත්කමට අනුව මෙසේ බෙදා දක්වා ඇත.**

**ඉබාදත්**

**ෆර්ලු**

**ෆර්ලු අයින්**

අනිවාර්ය වේ. (පංචකාල සලාත්/ රාමළාන් / පවුල නඩත්තු කිරීම / දෙමව්පියන්ට සැලකීම.)

**ෆර්ලු කිෆායා**

සමූහ වශයෙන් ද කළ හැකි වගකීම් වේ.
(ජනතා වගකීම් / ආගමික හා වෘත්තීය විද්වතුන් බිහිකිරීම.)

**සුන්නත්**

ෆර්ලු වලට අයත් නොවූ කොටස් මෙයට ඇතුළත් වේ.

(සුන්නත් වන සලාත්, දිකීර්, සලාම් පැවසීම, රෝගීන්ගේ සුවදුක් විමසීම.)

## 05. අත්තහාරත් (පිරිසිදුකම)

ඉස්ලාම් මුළු ජීවිතයේ සියලුම අංශයන්ට අවශ්‍ය මඟ පෙන්වීමකි. ඒ අනුව ඉස්ලාම් එය පිළිපදින සෑම මුස්ලිම් බැතිමතෙකුටම පිරිසිදුභාවය රැකගන්නා ලෙස අවවාද කරයි.
පිරිසිදුව සිටීම ඉබාදතයක් ලෙස ද පෙන්වා දෙයි.

**"නියත වශයෙන්ම අල්ලාහ් විසින් පාරිශුද්ධවන්තයින්ට සෙනෙහස දක්වන්නේය."**
**අල්කුර්ආන් : (9 : 108)**

**"(නබිතුමාණනි !) නුඹගේ වස්ත්‍ර පිරිසිදු කරගනු"**
**අල්කුර්ආන් : (74 : 04)**

**මෙය පිරිසිදුකමෙහි වැදගත්කම පෙන්වන අල්කුර්ආන් වැකි වේ. එමෙන්ම පිරිසිදුකමෙහි වැදගත්කම පෙන්වා දෙන හදීස් ද පහත වේ.**

**"පිරිසිදුකම ඊමානයේ අඩකි" (මුස්ලිම්)**

මෙමගින් පැහැදිලි වන්නේ මුස්ලිම්වරයෙකු තම දෛනික ජීවිතයේදී සෑම අවස්ථාවකම අනිවාර්යයෙන්ම පිරිසිදුව සිටිය යුතුය යන්නයි.

එමෙන්ම පිරිසිදුකම සලාතය, ඉඃතිකාෆ් වැනි ප්‍රධාන ඉබාදත් රැසක් ඉටු කිරීම උදෙසා මූලික කොන්දේසියක් ලෙස පහත හදීසයෙන් ස්ථිර වන්නේය.

**"පිරිසිදුභාවයෙන් තොර වූ කිසිදු සලාතයක් අල්ලාහ් නොපිළිගන්නේය." (මුස්ලිම්)**

මුස්ලිම්වරයෙකු ශරීරය මෙන්ම සිත ද ඊර්ෂ්‍යාව, උඩඟු බව, වැරදි සහගත සිතුවිලි, වෛරය වැනි දුර්ගුණාංගවලින් වැළකී පිරිසිදුව තිබිය යුතුය.

**<u>ජලය හා එහි වර්ග</u>**

මිනිසාගේ බාහිර පිරිසිදුකම රැක ගැනීමට ප්‍රධාන වශයෙන් රුකුලක් වන්නේ ජලයයි.
ජලයේ වර්ග, ඒවා භාවිත කිරීමේදී බලපාන සීමා පිළිබඳව ඉස්ලාම් ඉතාම පැහැදිලිව විස්තර කර ඇත.
ඉස්ලාමීය නීති විද්වතුන් ජලය පහත අයුරින් වර්ග කර ඇත.

1. **<u>අල් මාඋත් තහූර් (ඉතා පිරිසිදු ජලය)</u>**

ස්වාභාවයෙන්ම පිරිසිදු සියල්ල පිරිසිදු කිරීමට ශක්තිය ඇති ජලයේ ස්වභාවයට කිසිඳු වෙනසක් සිදු නොවන ජලයයි.

- වර්ෂාව, හිම, අයිස් කැට යනාදියෙන් ලබා ගන්නා ජලය
- මුහුදු ජලය
- ගංගා ජලය, උල්පත් දිය
- එක් ස්ථානයක දීර්ඝ කාලයක් රැඳී තිබීමෙන් කොළ, පාසි, ගෙඩි යනාදිය වැටී වෙනස් වූ අධික ජලය (වැව)

මෙවැනි ජලය අනිවාර්ය නෑම, ජනාසා නෑවීම යනාදී ආගමික වගකීම් ඉටු කිරීමටත් නජීස් ඉවත් කිරීමටත් භාවිතා කරයි.

මෙම ජලය කොටස් 3 කට බෙදා දක්වා ඇත.

I. **<u>අල් මාඋල් කසීර් (අධික ජලය / මාඋන් මුත්ලක්)</u>**

කුල්ලතෛන් නැතහොත් ලීටර් 210 ක ජල ප්‍රමාණයයි.
මෙම ජලයෙහි නජීසයක් එක් වූ පමණින් එය නොජීස් නොවෙයි.
මෙම ජලයෙහි වර්ණය, සුවඳ, රසය යන ගුණාංග අතරින් එක් ගුණාංගයක් වෙනස් වුවහොත් පමණක් එය නජීස් බවට පත් වේ.

- ❖ මෙම ජලය ස්වභාවිකව හෝ වැඩි ජලයක් එක් වීමෙන් එම ජලය වෙනස් වී පිරිසිදු ජලය (තහූර්) බවට
- ❖ පත් වුවහොත් එම ජලය නැවත වුළු කිරීම, අනිවාර්ය නෑම වැනි ආගමික අවශ්‍යතා සඳහා භාවිත කළ හැක.

**II. අල් මාඋල් කලීල් (අල්ප ජලය)**

කුල්ලතෙන් නැතහොත් ලීටර් 210 කට වඩා අඩු ඉතා පිරිසිදු ජලය වේ.

මෙම ජලයට නජීස් එක්වුවහොත් එහි වර්ණය, සුවඳ, රස වැනි ගුණාංග වෙනස් නොවූවද එම ජලය නජීස් වේ.

නමුත් රුධිර සංසරණයක් නොමැති මැස්සා, කුඹියා, මී මැස්සා වැනි කෘමීන් වැටීමෙන් මෙම ජලය නජීස් බවට පත් නොවේ.

- ❖ කුල්ලතෙන් ප්‍රමාණයට වඩා වැඩි ජලයක් එක්කර එහි වර්ණය, සුවඳ හෝ රසයෙහි වෙනසක් දක්නට නොලැබේ නම් නැවත ආගමික කටයුතු සඳහා භාවිත කළ හැක.

**III. අල් මාඋල් මුස්තඃමල් (පරිහරණය කරන ලද ජලය)**

කුල්ලතෙන් ප්‍රමාණයට වඩා අඩු ඉතා පිරිසිදු ජලය ෆර්ලු වන නෑම, වුළුඃ කිරීම වැනි ෆර්ලු වන වගකීම් උදෙසා භාවිත කළේ නම් තවත් ෆර්ලු වූ කටයුත්තක් සඳහා භාවිතා කළ නොහැකිය.

- ❖ මෙයද කුල්ලතෙන් ප්‍රමාණයට පත්කර ඉතා පිරිසිදු ජලය (තහූර්) බවට පත් වූ පසු නැවත ආගමික අවශ්‍යතා සඳහා භාවිතා කළ හැක.

**2. අල් මාඋත් තාහිර් (පිරිසිදු ජලය)**

ස්වාධීනව පිරිසිදු වුව ද අනෙක් දෑ පිරිසිදු කිරීමට භාවිත කළ නොහැක.

උදාහරණ : තේ, රෝස වතුර, පලතුරු යුෂ, සිසිල් බීම, තැඹිලි වතුර වැනි ස්වභාවයෙන් වෙනස් වූ ද්‍රාවණයන් ද මෙයට අඩංගු වේ.

මේවා ආහාර, ඖෂධ වැනි අවශ්‍යතා උදෙසා භාවිත කිරීමට හැකි වුවද ආගමික වගකීම් වෙනුවෙන් හෝ පිරිසිදු වීමට, භාවිත කළ නොහැක.

**3. අල් මාඋල් මුතනජ්ජිස් (අපිරිසිදු ජලය)**

මෙය අපිරිසිදු ජලයයි. මුත්‍රා වැනි ස්වභාවයෙන්ම අපිරිසිදු ද්‍රාවණ හා මත්ද්‍රව්‍ය වැනි නජීස් මිශ්‍ර වූ ජලයයි. මෙම ජලය ආගමික වගකීම් වෙනුවෙන් හෝ පිරිසිදු වීමට කොහෙත්ම භාවිත කළ නොහැක.

**කිල්ල හා ඉන් මිදීම**

මුස්ලිම් බැතිමතෙකු අපිරිසිදු තත්වයකදී පිරිසිදු වන ක්‍රම දෙකක් ඉස්ලාම් අපට පෙන්වා දී ඇත.

**I. සුළු කිල්ලෙන් පිරිසිදු වන ආකාරය.**

සුළු කිල්ලෙන් පිරිසිදු වීමට වුළුඃ කළ යුතුය. මුහුණ, අත, හිස, කකුල යන අවයව මෙහිදී සම්බන්ධ වේ.

**II. මහා කිල්ලෙන් පිරිසිදු වන ආකාරය.**

මහා කිල්ලෙන් පිරිසිදු වීමට දිය නෑම (ගුසල්) අනිවාර්ය වේ.

මෙය මුළු ශරීරයම පිරිසිදු කරන ක්‍රමයයි.

ස්ත්‍රී පුරුෂ සංසර්ගයේ යෙදීම, ශුක්‍ර ධාතු පිට කිරීම, අලුතින් ඉස්ලාමය වැළඳ ගැනීම, මරණයට පත්වීම, හයිල් හා නිෆාස් වැනි විවිධ අවස්ථාවන් හි දිය නෑම මුස්ලිම් බැතිමතෙකුට අනිවාර්ය වේ.

**පිරිසිදු කරන ආකාරයෙහි දක්නට ඇති විකල්ප ක්‍රම**

මුළුඃ කිරීමේදි හෝ දිය නෑමේදී හෝ අපහසුතාවයක් ඇති වන විට විකල්ප ක්‍රම කිහිපයකට යොමු වීමේ අවකාශය ලබා දී ඇත.

**1) තයම්මුම්**

තයම්මුම් යනු අනිවාර්ය වුළුඃ හෝ අනිවාර්ය නෑම උදෙසා ජලය පරිහරණය කිරීමට නොහැකි වන විට ඊට විකල්පයක් ලෙස පිරිසිදු පස් භාවිත කොට මුහුණ හා දෑත් මුස්හු කිරීම (පිරිමැදීම) වේ.

අසනීප අවස්ථාවක, ජලය නොමැති විට හා පානය කිරීමට පමණක් ජලය තිබෙන අවස්ථාවක තයම්මුම් කර සලාතය හා ඉබාදත් කළ හැක.

**2) ජබීරත්**

ජබීරත් යනු ශරීර අවයව මත තුවාල වෙනුවෙන් දමන ලද වෙළුම හෝ ප්ලාස්ටර් වේ. වුළු කරන ලද අවස්ථාවක මෙම වෙළුම දමා ඇත්නම් තයම්මුම් කර ගැනීමට ඉස්ලාම් අනුමැතිය දී ඇති අතර අනෙකුත් අවයව ජලයෙන් වුළුඃ කර ගත යුතුය.

## 6. <u>අන් නජාසත් (අපිරිසිදුකම)</u>

මුස්ලිම් බැතිමතෙකු සෑම විටම පිරිසිදුව හා නිරෝගීව සිටීමට ඔහු නජීස්වලින් (අපිරිසිදුකමින්) වැළකී ජීවත් වීම අත්‍යාවශ්‍යය.

**නජීස් පිරිසිදු කරන ක්‍රමය සැලකිල්ලට ගෙන එය කොටස් 3 කට බෙදා දක්වා ඇත.**

1) සාමාන්‍ය නජීස්
2) මෘදු නජීස්
3) දැඩි නජීස්

**1. <u>සාමාන්‍ය නජීස් හි අඩංගු වන දේවල්</u>**

- මලපහ
- මුත්‍රා
- රුධිර
- සැරව
- වමනය
- අනුභව කිරීමට අනුමැතිය නොමැති සතුන්ගේ කිරි
- සතුන්ගේ මළකුණු
- ජීවත්ව සිටින ප්‍රාණීන්ගෙන් වෙන් වූ කොටස්
- මදී
- වදී
- මත්පැන්
- තද නින්දේදී මුවින් පිටවන කෙළ

**පහත සඳහන් දෑ සාමාන්‍ය නජීස් තත්ත්වයෙන් මිදේ.**

- ස්වාභාවිකව මිය ගිය මසුන්, පළගැටියා
  (මේවා අනුභව කිරීමට අනුමත කර ඇත.)

- රුධිර සංසරණයක් නොමැති කුහුඹුවන්, මී මැස්සා යනාදිය

- අනුභව කිරීමට අනුමැතිය ඇති මිය ගිය සතුන්ගේ අස්ථි, අං, නිය, රෝම, පිහාටු යනාදිය.

- ඉතාම ස්වල්ප වශයෙන් ඇඳුමෙහි හෝ ශරීරයෙහි හෝ තැවරුණු රුධිරය

- මව් කිරි

**පිරිසිදු කරන ආකාරය**

ඉහත සඳහන් කරන ලද ශරීරයේ හෝ ඇඳුමෙහි හෝ තැවරුණු විට පළමුව එම නජීසය එම ස්ථානයෙන් ඉවත් කළ යුතුය. පසුව නජීසයේ රසය, වර්ණය, සුවඳ යන ගුණාංග තුනම ඉවත් වන තුරු සේදිය යුතුය.

ජලය පමණක් භාවිත කොට නජීස් ඉවත් කළ නොහැකි නම් සබන්, සබන් කුඩු යනාදිය භාවිත කළ යුතුය.

පිරිසිදු කළ පසුවද එම නජීසයේ වර්ණය, සුවඳ යන දෙකම හෝ නැතහොත් රසය පමණක් ඉතිරිව ඇත්නම් එය පිරිසිදු යැයි සලකනු නොලැබේ.

**2. <u>මෘදු නජීස් හි අඩංගු වන දේවල්</u>**

මව් කිරි පමණක් ආහාර ලෙස ගනු ලබන වයස අවුරුදු දෙකට අඩු පිරිමි දරුවෙකුගේ මුත්‍රා.

**පිරිසිදු කරන ආකාරය**

මෙම නජීසය තැවරුණු නිශ්චිත ස්ථානය මිරිකා එය ඉවත් කිරීමෙන් පසුව එම ස්ථානයෙහි ඉතා පිරිසිදු ජලය අවශ්‍ය තරම් ඉසීම ප්‍රමාණවත්ය.

**3. <u>දැඩි නජීස් හි අඩංගු වන දේවල්</u>**

බල්ලා, ඌරා යන සතුන්ගේ මලපහ, සැරව, කෙළ, දහඩිය, රුධිරය වැනි සියල්ලම මෙම ගණයට ඇතුළත් වේ.

**පිරිසිදු කරන ආකාරය**

මෙම නජීසය පිරිසිදු කිරීමේදී ඉහත පවසන ලද ක්‍රමය අනුගමනය කිරීමත් සමඟ තව දුරටත් පස් මිශ්‍ර ජලය භාවිත කරමින් සත් වතාවක් ජලය වත්කර සේදීමත් අනිවාර්ය වේ.

නජීස් තැවරුණු ස්ථානයේ නජීසයෙහි මූලික ගුණාංග නොපෙනුණද එම ස්ථානය සත් වරක් සේදිය යුතුය. විහිදී පවතින (මුහුද, වැව වැනි) අධික ජලය රැඳෙන ස්ථානවල පිරිසිදු කරන විට හා ගංගා වැනි ගලා යන ජලයෙහි පිරිසිදු කරන විට ජලය සුළු වශයෙන් කලතා එම ජලය තුළට සය වරක් දියේ ගිලීම ප්‍රමාණවත් වේ.

**නජීස් දේවල් පිරිසිදු කරන ආකාරය**

පොදුවේ ගත් කළ නජීස් දේ පිරිසිදු කළ නොහැකිය. නමුත් නජීස් වන ද්‍රව්‍ය කිහිපයක් භාවිත කළ හැකිය. ඒවාට උදාහරණ පහත වේ.

**සතුන්ගේ සම්**

බල්ලා, ඌරා හැර අනෙකුත් සතුන්ගේ සම් ගත් කළ හොඳින් පදම් කර ගැනීම තුළින් ආහාරයට ගැනීම හැර වෙනත් අවශ්‍යතා සඳහා භාවිත කළ හැක.

**මත්පැන් (රා)**

ස්වාභාවිකව ගන්නා ලද බාහිර ද්‍රව්‍ය මිශ්‍ර නොකරන ලද රා, ස්වාභාවයෙන් විනාකිරි බවට පත් වන්නේ නම්, එය ආහාර සඳහා භාවිත කළ හැක.

**නජීස් තැවරුණ කැටි වූ කිරි**

මුදවන ලද කිරි, එළඟි තෙල්, බටර්, චීස් වැනි කැටි වූ තත්ත්වයෙහි ඇති කිරි මත නජීසයක් පතිත වූයේ නම් එම නජීසය තැවරුණු කොටස ඉවත් කර ඉතිරිය භාවිත කළ හැකිය.

## 7. සලාතයේ වැදගත්කම

ඉස්ලාම් සලාතය මුඃමින්වරයෙකුගේ ලක්ෂණයක් බවත් මුඃමින් හා කාෆිර් අතර දක්නට ලැබෙන වෙනසයි.

සලාතය සෑම ඉස්ලාම් බැතිමතෙකුම අනිවාර්යයෙන් ඉටු කළ යුතු "ෆර්ලු අයින්" වන ඉබාදතයකි.

සලාතය යනු ඊමානයේ ලක්ෂණයයි.

සලාතය නිවැරදිව ඉටු කරන මුඃමින් මෙලොව හා පරලොව ප්‍රයෝජන රැසක් ලබාගන්නේය. ඒවා නම්,

1. අල්ලාහ් සමඟ සංවාදයේ යෙදීම.
2. අල්ලාහ් සිහිපත් කිරීම හා සැනසුම.
3. දේව දයාව ලැබීම.
4. ස්වර්ගයේ යතුර.
5. පරාර්ථකාමී හැඟීම් හා නොසැලෙන සිත.
6. පාපි ක්‍රියාවන්ගෙන් ආරක්ෂාව.
7. පව් කමාව ලැබීම.
8. බාහිර - අභ්‍යන්තර පිරිසිදුකම.
9. නිරයේ වේදනාවෙන් ආරක්ෂාව.

## 8. සිෆතුස් සලාත්

ඉස්ලාමීය පංච මහා වගකීම් අතරින් දෙවැනි වගකීම පංච කාල සලාතය වේ.

මිහ්රාජ් ගමනේදී සලාතය අනිවාර්ය කරන ලදී.

මිහ්රාජ් ඉටු කරන ආකාරය පහත වේ.

**1) කිබ්ලාව පෙරටු කරගෙන සිටගැනීම.**

සෘජුව සිටගත යුතුය.

පුරුෂයන් තම පාද අතර සුළු ඉඩ ප්‍රමාණයක් තබා, කාන්තාවන් පාද ඉතා සමීපව තබා සිටගත යුතුය.

**2) නියියත් තැබීම.**

නියියත් යනු සලාතය ඉටු කිරීමෙහිලා සිතෙහි ඇතිවන චේතනාව වේ.

**3) දෑත් බැඳීම.**

නියියතය සිතෙහි ස්ථිර කරගෙන "අල්ලාහු අක්බර්" යනුවෙන් තක්බීර් පවසා ආරම්භයේදී දෙඅත් හි ඇඟිලි කෙලින් කර, පහසුවෙන් විහිදුවා දෙඅත්හි අත්ල කිබ්ලාව දෙසට හරවා මහපට ඇඟිල්ලෙහි තුඩ කනෙහි යට පෙදෙසට හෝ උරහිස් දක්වා එසවිය යුතුය.

**4) දුආඋල් ඉෆ්තිතාහ් (ඉස්තිෆ්තාහ්)**

තක්බීර් තහ්රීමා පවසා තක්බීර් බැඳ ගැනීමත් සමඟ සමාරම්භක දුආව පාරායනා කළ යුතුය.

මෙම සමාරම්භක දුආව "දුආඋල් ඉෆ්තිතාහ්" යනුවෙන් හඳුන්වනු ලබයි.

**5) සූරතුල් ෆාතිහා පාරායනා කිරීම.**

**6) රුකූඋ කිරීම.**

සමාරම්භක තක්බීරයේදී දෙඅත් එසවූ ආකාරයට ඔසවා, තක්බීර් පවසමින් රුකූඋ කිරීම උදෙසා නැමිය යුතුය. හිස, බෙල්ල, පිට පෙදෙස යනාදිය එක කෙළින් එකම මට්ටමක පිහිටන සේ නැමී දෙඅත් ඇඟිලි විහිදුවා අල්ල පාදයේ දණහිස මත තබා හොඳින් අල්ලා ගත යුතුය.

**7) ඉඃතිදාල්**

රුකූඋවේ සිට ඉඃතිදාලයට පැමිණෙන විට ඍජුව සිටගන්නා ඉරියව්ව.

**8) සජ්දා (සුජූද්) කිරීම.**

ඉඃතිදාලයේ සිට දෙඅත් ඔසවා "අල්ලාහු අක්බර්" යනුවෙන් පවසා සුජූද් කිරීමට යා යුතුයි.

**9) මැද ඉඳුමට පැමිණීම.**

සුජූද් හි ස්වල්ප වේලාවක් රැඳී පසුව තක්බීර් පවසා හිස ඔසවා දණහිස අල්ලාගෙන මැද ඉඳුමෙහි හිඳ ගත යුතුය.

**10) දෙවන සජ්දා (සුජූද්)**

මැද හිඳුමෙහි ස්වල්ප වේලාවක් රැඳී සිට "අල්ලාහු අක්බර්" යැයි පවසමින් දෙවන සුජූදයට යා යුතුයි. පළමු සුජූදය ඉටු කළ සේ එහි ස්වල්ප වේලාවක් රැඳී සිට "තස්බීහ්" පාරායනය කළ යුතුය.

**11) කුනූත්**

සුබහ් සලාතයේ දෙවන රකඅතයේ දී ද රමළාන් මස 16 වන රාත්‍රියේ සිට අවසන් දින දක්වා විත්ර් සලාතයේ අවසාන රකඅතයේ දී ද රුකූඋ සිට නැගිට ඉඃතිදාලයට අදාළ දුආව පාරායනය කළ පසු දෙඅත් උරහිස් අසළට ඔසවා මුහුණ ඉදිරියේ තබා කුනූත් පාරායනා කිරීම සුන්නත් වේ.

**12) අත්තහියියාත්**

පළමු අත්තහියියාත් හා අවසන් අත්තහියියාත් වේ. රකඅත් තුනකින් හෝ හතරකින් යුක්ත සලාත්වල දෙවන රකඅතයේ දෙවන සුජූදයට පසු ඉෆ්තිරාෂ් හිඳුමෙහි හිඳ ගැනීම පළමු අත්තහියියාත් වේ.

## 09. සලාතයෙන් අනතුරුව උසුරිය යුතු පාරායනාවන්

සලාත් නම් අරාබි පදයට "ප්‍රාර්ථනාව" යන අර්ථකථනය අන්තර්ගත වේ.

පංචකාල සලාතයන් ඉටු කළ පසු නබි (සල්) තුමා දීර්ඝ වේලාවක් එම ස්ථානයේ හිඳ දික්ර් හා අව්රාද් රැසක් පුරුද්දක් ලෙස පාරායනා කළ අතර සහාබාවරුන්ටද එය ඉගැන්වූයේය.

මුහම්මද් (සල්) තුමාණෝ පැවසූහ.

**"යමෙක් සෑම සලාතයකටම පසුව සුබ්හානල්ලාහ් 33 වරක් ද අල්හම්දුලිල්ලාහ් 33 වරක් ද අල්ලාහු අක්බර් 33 වරක් ද පාරායනය කර 100 සම්පූර්ණ කිරීම උදෙසා හතර වන කලිමාව වරක් පාරායනය කළේ නම්, ඔහුගේ පාපී ක්‍රියාවන් මුහුදේ පෙණ මෙන් තිබුණ ද කමා කරනු ලැබේ." යනුවෙන්.**

එමෙන්ම ; **සූරා ඉහ්ලාස්**
**සූරා ෆලක්**
**සූරා නාස්**, යන සූරා තුන සලාතයෙන් පසු පාරායන කළ යුතු බව.

## 10. <u>අත් තස්කියා</u>

තස්කියා යනු පාරිශුද්ධ කිරීම, පිළිවෙලකට සකස් කිරීම යන අර්ථ ගම්‍ය වේ.

"තස්කියතුන් නෆ්ස්" යන්න චිත්ත පාරිශුද්ධිය යන අර්ථය ගෙන දේ.

සිතෙහි නෆස් තත්ත්වයන් 3 ක් පිළිබඳව අල්කුර්ආනයෙහි සඳහන් කර ඇත.

**1. <u>නෆ්සුල් අම්මාරා බිස්සූ</u>**

අයහපතට පොළඹවන සිත යන්නයි. මෙය යහපත උත්සුක නොකරයි. හැඟීම්වලට හා ෂෙයිතාන්ට වහල් වූ තත්ත්වයක් දක්නට ලැබේ.

**2. <u>නෆ්සුල් ලව්වාමා</u>**

යන්න, තමාව රිදව ගන්නා සිතයි. මෙහි හැඟීම්වලට විරුද්ධව සටනක් තිබේ.
හැඟීම් උත්සන්න වී අකුසලෙහි නියළුණේ නම්, එම මොහොතේ ඒ වෙනුවෙන් සිතින් පසුතැවිලි වේ. තමාටම දොස් පවරාගෙන තම තත්ත්වය වටහාගෙන ශෝකයට පත් වේ.

**3. <u>නෆ්සුල් මුත්මඉන්නා</u>**

යන්න, තෘප්තිමත් සිතයි. කලබලයෙන් හා නොසන්සුන් බවින් තොර තැන්පත් තත්ත්වයෙන් දක්නට ලැබේ. මෙහි අයහපතට පෙළඹවීම අඩුය.

**<u>තස්කියාවේ වැදගත්කම</u>**

මිනිසාට මෙලොව හා පරලොව ජය ගැනීමට හැකිවේ.'

අල්ලාහ් තම මැවීම් වන හිරු, සඳු, රාත්‍රිය, දහවල යනාදිය මත දිවුරා පවසා තිබීමෙන් චිත්ත පාරිශුද්ධියෙහි වැදගත්කම වඩ වඩාත් ස්ථිර කරන්නේය.

ස්වර්ගයට පිවිසිය හැකි මූලික සුදුසුකමක් ලෙස සිත පාරිශුද්ධ කරවන ක්‍රියාකාරකම් දැක්විය හැකිය.
එය නිවැරදි මාර්ගයේ යොමු කරවූයේ නම්, පමණක් ස්වර්ගයට යන මාර්ගයේ ගමන් කළ හැකිය.

**නියත වශයෙන්ම ශරීරයෙහි එක මස් පිඬක් ඇත. එය අයහපත් වූයේ නම්, මුළු ශරීරයම අයහපත් වේ. එය යහපත් වූයේ නම්, මුළු ශරීරයම යහපත් වේ. එය සිත වේ.**
**(බුහාරි, මුස්ලිම්)**

මෙම ඉහත හදීසයෙන් පැහැදිලි වන්නේ චිත්ත පාරිශුද්ධයෙහි වැදගත්කමයි.

## 11. යහගුණාංග පිළිබඳ ඉස්ලාමීය දැක්ම I

ප්‍රවේශම් සහගත හා අනුමත කරන ලද ජීවිතයක් කෙසේ සැකසිය යුතුද යන සීමාව පෙන්වා දෙන්නේ යහගුණාංග තුළින්ය.

අනෙකුත් සියළු ජීවීන්ගෙන් වෙනස් වූ මිනිසා, ස්වාධීන උසස් තත්ත්වයක් ලබා ගැනීමට මෙම යහගුණාංග හේතු වී ඇත.

අරාබි භාෂාව තුළ හුලුක් හසන්, අඛ්ලාක් හසනා, මකාරිමුල් අඛ්ලාක්, අදබ්, ආදාබ් ප්‍රමුඛ අරාබි පද යහගුණාංග පෙන්වා දීමට භාවිත කරන්නේය.

නබි (සල්) තුමා යහගුණාංගවල කඳු ගැටයක් යැයි වර්ණනා කරන අල්කුර්ආනය යහගුණාංග නබි (සල්) තුමාගෙන් ඉගෙන ගන්නා ලෙස ආයාචනා කරන්නේය.

කුඩා කළ සිටම නබි (සල්) තුමා යහගුණාංග සපිරි පුද්ගලයෙකු ලෙස දිස් වූ බැවින් “අල් අමීන්” හා “ අස්සාදික්” ලෙසත් එතුමාව හඳුන්වා දෙනු ලැබිණ.

නබි තුමා සතු වූ ගුණාංග ඉස්ලාමයේ පරම සතුරන් පවා ඉස්ලාමය සමඟ එක්ව එහි ආරක්ෂකයන් ලෙස වෙනස් වීමට රුකුළක් විය.

සූරා ලුක්මානි හා සූරා ෆුර්කාන් හි ඉස්ලාම් බැතිමතෙකු තුළ තිබිය යුතු වැදගත් යහගුණාංග පෙන්නුම් කර දී ඇත.

## 12. යහගුණාංග පිළිබඳ ඉස්ලාමීය දැක්ම II

ඉස්ලාම් පවසන යහගුණාංග කිහිපයක් ;

ආදරය

ආදරය පෙන්වීම යනු අල්ලාහ්ගේ ගුණාංගයන්ගෙන් එකකි. මෙම ගුණාංගය සම්බන්ධ විවිධාකාර නාමයන් ;

**අර් - රහ්මාන් (අති කරුණාවන්තයා)අර් - රහීම් (අති දයාවන්තයා)**

**අල් - වදූද් (මහඟු කරුණාවන්තයා)**

“ආදරය නොමැත්තා තුළ පූර්ණ ඊමානයක් නොමැත.” යන්න ද ඊමානය නැති කරගත් තැනැත්තාට

ස්වර්ගයට ප්‍රවේශ වීමට නොහැකිය. යන්න ද ඉස්ලාමයේ උපදේශනයන්ය.

ආදරය දැක්වීම කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

**1. අල්ලාහ් කෙරෙහි ආදරය දැක්වීම.**

"මැවීම් කෙරෙහි මිනිසා දක්වන ආදරයට වඩා ගැඹුරු ආදරයක් අල්ලාහ් කෙරෙහි තැබිය යුතුය" යැයි ඉස්ලාම් අපේක්ෂා කරයි.

**නබි (සල්) තුමාණෝ මෙසේ පැවසූහ. "කරුණු 03 ක් කවරෙකු සතුව පවතී ද ඔහු ඊමානයේ සුවය ලබා ගනියි. එය, අන් සියළු කරුණුවලට වඩා අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට ප්‍රිය වන්නෙකු ලෙස සිටියේ නම්, එක් මිනිසෙකු වෙත අල්ලාහ් වෙනුවෙන් පමණක් සෙනෙහස දැක්වීම, දෙවියන් ප්‍රතික්ෂේප කිරීමෙන් අල්ලාහ් ආරක්ෂා කළ පසු ගින්නට විසි කිරීම පිළිකුල් කරනවා සේ නැවත දෙවියන් ප්‍රතික්ෂේප කිරීමෙහි නිරත වීම පිළිකුල් කිරීමය." (බුහාරි, මුස්ලිම්)**

අල්ලාහ් කෙරෙහි දයාව දැක්වීමෙහි තවත් එක් අදහසක් නම්, අල්ලාහ්ගේ ධර්ම දූතයා කෙරෙහි ආදරය දක්වා එතුමාගේ අණට සම්පූර්ණයෙන් යටත්ව ක්‍රියා කිරීම වේ.

කෙනෙකුගේ ඉබාදතය ප්‍රමාණවත් කිරීමට නම් අල්ලාහ් කෙරෙහි ආදරය දැක්වීම ප්‍රධාන වශයෙන් කළ යුතුය.

මෙම අවස්ථාව ආදරය මිශ්‍ර වූ බියක් (මුහබ්බත්) ලෙස ඉස්ලාමීය විද්වතුන් විසින් පැහැදිලි කෙරේ.

**ආදරය දැක්විය යුත්තේ ;**

1. අල්ලාහ්
2. නබි (සල්) තුමාණන්
3. පවුලේ සාමාජිකයන්
4. උම්මහාතුල් මුඃමීන්වරියන්
5. දෙමව්පියන්
6. නෑදෑයින්
7. අසල්වැසියන්
8. අන්‍ය ආගමිකයන්
9. සතුන් හා සිව්පාවුන්
10. පරිසරය

කෙනෙකු තමා කෙරෙහි දක්වන දයාව යනු තමා කෙරෙහි වූ යුතුකම්, අයිතිවාසිකම් රැක ගැනීම වේ.

ඉස්ලාමීය දැක්මෙන් කෙනෙකු තමා විසින්ම තමාව විනාශ කරගැනීම මහා වරදක් හා පාපයක් ලෙස සලකනු ලැබේ.

දෙමව්පියන් කෙරෙහි තම දරුවන් දයාව දැක්විය යුතුය.

දෙමව්පියන් කෙරෙහි ගෞරවය දැක්වීම සමඟින් ඔවුන් කෙරෙහි නිරන්තරයෙන් අල්ලාහ්ගේ ආදරය, දයාව හා පිහිට ලැබීමට ප්‍රාර්ථනා කළ යුතුය.

"මහ පොළොවේ සැරිසරන කුමන සත්වයෙකු වුවද, තම පියාපත් දෙකෙන් අහසේ පියාඹන කුමන පක්ෂියෙකු වුවද නුඹලා වැනි සමූහ ම මිස වෙනසක් නොවේ." යැයි අල්කුර්ආන් (6.38) පෙන්වා දෙයි.

බල්ලෙක්, ඌරන් වැනි සතුන් නජීස් වූ සතුන් වුවද ඔවුන්ට වද දීමට ඉස්ලාමයේ අනුමැතිය නොමැත.

## 1. පරිත්‍යාගශීලීත්වය

යමක් ලබාගැනීමට තවත් දෙයක් කැප කිරීම පරිත්‍යාගය නම් වේ. ඉස්ලාම් පවසන යහගුණ අතරින් පරිත්‍යාගයට උසස් ස්ථානයක් හිමි වේ.

ඉස්ලාම් ධර්මය පරිත්‍යාගශීලී භාවයෙන් පිදුන ධර්මයක් ලෙස හඳුන්වනු ලැබේ.

අති මහත් පරිත්‍යාගයක් කළ ජනතාව අගයමින් අල්ලාහ් ඔවුන්ව "සාදිකූන්" යනුවෙන් වර්ණනා කළේය.

- **මක්කාවේ නබිතුමාණන් හා සහබාවරුන්**
- **තාබුක් සටන අවස්ථාවේ අබූබකර් (රළි) තුමාණන්**
- **අරාබිකරයේ සාගතය හා නියඟය අවස්ථාවේ උස්මාන් (රළි) තුමාණන්**

පරිත්‍යාගය ඉබාදතයක් මෙන්ම පරිත්‍යාගයට හිමිවන ප්‍රතිඵලය ස්වර්ගය වේ.

## 2. දන් දීම

ආදරය එළි දැක්වීම අතරින් දන් දීමද එකකි.

දන් දීම යනු අල්ලාහ් තමාට ලබා දී ඇති ධනයෙන් එක් කොටසක් අන් අයට දීමය.

අපි අල්ලාහ් තආලාව "අල් මුඃනි" හෙවත් ධනපතියෙකු බවට පත් කරන්නා "අල් මුඃතී" හෙවත් ලබා දෙන්නා යන නම් වලින් ආමන්ත්‍රණය කරන්නෙමු.

මිනිසෙකු තමා ද ජීවත් වෙමින් අන් අයටද දන් දී අන් අයවද ජීවත් කරවන විට ජීවිතය සැබැවින්ම ඵලදායක වන්නේය.

ඔහුගේ මෙලොව ජීවිතයද සතුටින් ගත වේ. පරලොව ජීවිතයද අධික නිදහසක් ලද්දවුන් සේ වෙනස් වේ.

**දන් දීමෙහි නිරත වීමෙන් අත්වන ප්‍රයෝජන ;**

- මෙලොව අල්ලාහ්ගේ ආදරය හා මිනිසුන්ගේ අභිමානය හිමි වේ.
- පරලොව දී විශේෂ දීමනාවක් හිමි වේ.
- ධනයේ වර්ධනයක් ඇති වේ.
- අනතුරු මඟ හැරේ.
- මනසට සතුටක් හා සහනයක් ලැබේ.

## 3. විශ්වාසවන්ත බව

විශ්වාසවන්න බව යනු සත්‍ය, උසස් බව, අවංකත්වය ආදී අදහස් දරණ පුළුල් අර්ථයන්ගෙන් යුත් වචනයකි.

සත්‍යවන්ත බව හා විශ්වාසවන්ත බව එකම කාසියේ පැති දෙකක් සේ මුඃමින්වරයෙකුට තිබිය යුතු අත්‍යාවශ්‍ය අංගයකි.

කුඩා කාලයේ සිටම නබි (සල්) තුමාණන් විශ්වාසවන්තයෙකු ලෙසද සත්‍යවාදියෙකු ලෙසද සිටිය හෙයින් මක්කාවාසීන් විසින් එතුමාණන් "අල් අමීන්" "අස්සාදික්" යන නාමයන්ගෙන් හඳුන්වමින් ප්‍රශංසා කළහ.

ව්‍යාපාර කටයුතුවලදී විශ්වාසනීයව හැසිරෙන්නන්ගේ පරමාන්ත දින තත්ත්වය පිළිබඳව නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ.

**විශ්වාසනීය, සත්‍යවාදී, වෙළෙන්දෙකු පරමාන්ත දින නබිවරුන් සිද්දීක්වරු (සත්‍යවාදීන්) සුහදාවරු (අල්ලාහ්ගේ මාර්ගයේ මරණයට පත් වූවන්) සමඟ සිටින්නේය. (ඉබ්නු මාජාහ්)**

කිසිවෙක් වංචා කරනු ලැබුවේ නම් ඔහු එම වංචා කළ වස්තුවද පරමාන්ත දිනයේදී තමා සමඟ ගෙන යා යුතු තත්ත්වයක් ඇති වේ, යන්න අල්කුර්ආනයේ අවවාද කර ඇත.

**4. <u>ඉන්ද්‍රියයන් රැක ගැනීම</u>**

ඉන්ද්‍රියයන් රැක ගැනීමෙන් සිදු වන යහපත් විපර්යාස මිනිසාගේ යහගුණාංග එළි දැක්වීමට හේතු වේ.

ඉන්ද්‍රියයන් නිසි පරිදි රැක නොගැනීමෙන් අයහපත් ලක්ෂණ කෙනෙකු තුළ මතුවීම වැළැක්විය නොහැකිය.

මිනිසා සිය අසීමිත ආශාවන්, බෙලහීනත්වය, ක්ෂණික හැඟීම් ඔස්සේ වහල් නොවී තම ඉන්ද්‍රියයන් පාලනය කර තම ජීවිතය යහපත් කරගැනීම ඔහුගේ පරම යුතුකමකි.

## 13. <u>ආධ්‍යාත්මික දියුණුව සඳහා වු මගපෙන්වීම</u>

මිනිසා මූලික වශයෙන් සිරුර, ඥානය හා ආත්මය යන ප්‍රධාන කොටස්වලට අන්තර්ගත වන්නේය.

සිරුර හැර ආත්මයද, ආත්මය හැර සිරුරද වැදගත් කොට සලකන්නේ නැත.

ඉස්ලාම් දර්ශනයට අනුව එක් මුස්ලිම් බැතිමතෙකු තම ආධ්‍යාත්මික දියුණුව සඳහා අල්කුර්ආන් හා සුන්නාහ් හි මඟ පෙන්වීම අනුගමනය කළ යුතුය.

ආධ්‍යාත්මික දියුණුව සඳහා ඉස්ලාම් පෙන්වන මගපෙන්වීම් මෙසේය ;

**1. <u>ඉහ්ලාස්</u>**

ඉහ්ලාස් යනු පිරිසිදු චේතනාව, නොකැළැල් සිතුවිලි යන අර්ථය ගෙන දේ.

මුස්ලිම් බැතිමතෙකු විසින් සිදු කරන යහ ක්‍රියා අල්ලාහ්ගෙන් අනුමත වීමට මූලික කොන්දේසියක් ලෙස ඉහ්ලාස්" සලකයි.

ගැත්තකු කුමන ක්‍රියාවක් කරන්නේද එය අල්ලාහ් වෙනුවෙන් යන අධිෂ්ඨානය සිතෙහි තිබිය යුතුය.

යම් ක්‍රියාවක නියැලෙන විට මුනිවිජාව අරමුණ කරගන්නේ නම්, එය "ආදේශ කිරීමක්" බවට පත් වේ."

එබැවින් අපගේ ක්‍රියා පිරිසිදු චේතනාවෙන් කළ යුතුය.

**2. <u>තව්බා</u>**

පාපී ක්‍රියාවන්ගෙන් වැළකී දෙවියන් වෙත මුළුමනින්ම සමීප වීම "තව්බා" වේ.

මිනිසෙකු රහසිගතව හෝ ප්‍රසිද්ධියේ අල්ලාහ් පිළිකුල් කරවන දෙයින් වැළකී ඔහු ප්‍රිය කරවන දේ වෙත හැරිය යුතුයි.

**තව්බා සඳහා කොන්දේසි 4 ක් දක්නට ලැබේ.**

1. අල්ලාහ් වෙතය යන පිරිසිදු චේතනාවෙන් තව්බා කිරීම.
2. තමා කළ පාපයන් අතහැර එයින් සහමුලින්ම ඉවත් වීම.
3. "පෙර කළ ඒ පාපයන් නැවතත් නොකරමි" යනුවෙන් ප්‍රතිඥා දීම.
4. කරන ලද පාපයන් මිනිසා හා සම්බන්ධ වන්නේ නම්, ඔහුගෙන් සමාව ඉල්ලා පසුව අල්ලාහ්ගෙන් කමාව අයැදීම.

තව්බා වෙනුවෙන් වෙන් වූ කාලසීමාවක් නොමැත.

වසරක් පුරා අපට හමුවන රමළාන් මාසය පමණක් ම තව්බා සඳහා වෙන් කර නොමැත.

තව්බාව ඕනෑම කාලයක කළ හැක.

**3. <u>වරූ</u>**

මෙහි අදහස පිළිවෙත් සුරැකීම වේ.

මෙය සම්බන්ධව,
"සැක සහිත දේ අතහරින්න, සැක රහිත දේ පිළිපදින්න." යැයි හදීස් හි සඳහන් වේ.

පිළිවෙත් සුරැකීම යන ගුණය කෙනෙකුගේ සිතින්ද, වචනයෙන්ද, ක්‍රියාවෙන් ද ඇති විය යුතුය.

වචනයෙන් පිළිවෙත් සුරැකීම යන්න අනවශ්‍ය කතාවලින් දිව ආරක්ෂා කර ගැනීමය.

ක්‍රියාවෙන් පිළිවෙත් සුරැකීම යන්න චලනය, ඇඳුම, භාවිතය ආදී සියලුම අංගයන් හලාල් ලෙස සිදු කිරීම.

**4. <u>(Z) සුහුද්</u>**

(Z) සුහුද් යනු ඇල්මක් නොමැති මෙලොව ජීවන ක්‍රමය යන්නයි.

දාරුල් ෆනා - තාවකාලික, විනාශ වන සුළු මෙලොව ජීවිතය
දාරුල් බකා - සදාකාලික, නිමක් නොමැති පරලොව ජීවිතය

මෙලොව ජීවිතයේ ආඩම්බරකාර හා විනෝදය මඟින් දෙවියන් කෙරෙහි වූ සිතුවිල්ල අමතක නොකළ යුතුයි.

මිනිසා මෙලොව භුක්ති විඳීම තම එකම අරමුණ නොකරගත යුතු අතර ඉස්ලාම් පවසන ආකාරයට යුතුකම් හා වගකීම් සහිතව පරලොව ජීවිතය වෙනුවෙන් ජීවත් විය යුතුය.

මෙලොව ඇල්මක් නොමැති ජීවිතය යනු මෙලොව ජීවිතය සහමුලින්ම අතහැරීම නොවේ.

මෙලොව ජීවිතය අතහැර එහි ආශ්වාදයන් සහමුලින්ම ඉවත් කර, කරදර පිරි රළු ජීවිතයක් ගත කිරීම " රහ්බානියියා" යන පැවිදි තත්ත්වය පෙන්නුම් කරයි.

එවන් ජීවිත ගත කිරීම ඉස්ලාම් විසින් තහනම් කර ඇත.

## 14. වහී හි වැදගත්කම

**ඥානය කොටස් දෙකකට බෙදේ.**

1. ඉන්ද්‍රිය ඥානය
2. විචක්ෂණ ඥානය

ඉන්ද්‍රිය ඥානයට මෙන්ම විචක්ෂණ ඥානයට ඉහළින් වූ ඥානය වහී ලෙස හැඳින්වේ.

වහී, ඉහත කී වර්ග දෙකෙහි ඇති ඥානය සම්බන්ධ කර මිනිසාට සත්‍යයේ මඟ පෙන්නුම් කරයි.

වහී, නබිවරුන්ට ලබා දී ඔවුන් එය ගෙනහැර දැක්ම මඟින් අන් මිනිසුන් වෙතට එය ලැබී ඇත.

භාෂාමය වශයෙන් වහී යන පදය සංඥාව, පිබිදීම, සිතෙහි ඇති වීම, පණිවිඩ පැවසීම, රහසිගත කථනය යන අදහස ගෙන දෙයි.

**වහී කොටස් දෙකකි ;**

i. වහී මත්ලූව්
ii. වහී ගෛරූ මත්ලූව්

වහී මත්ලූව් යනු අල්ලාහ් ජිබ්රීල් (අලෛ) මඟින් රසූල්වරුන්ට පාරායනය කර පෙන් වූ වහී වේ.

මිනිසා එය තම අවශ්‍යතාව අනුව වාචිකව ද ලිඛිතව ද ආරක්ෂා කරගන්නේය.

වහී ගෛරූ මත්ලූව් යනු පාරායනය කර නොපෙන් වූ වහී යන්නයි. මෙය විවිධ ආකාරයේ දේව ධර්ම දූතයන්ට හිමි වුණි.

**නිදසුනක් ලෙස ;**
ඉබ්රාහීම් (අලෛ) තුමා තම පුත් ඉස්මායිල් (අලෛ) තුමාව කුර්බාන් කරන ලෙස සිහිනයක් දුටුවේ යැයි සූරතුස් සාෆ්ෆාත් හි 102 වැකියෙහි සඳහන් වේ.
එවැනි සත්‍ය සිහිනයක් මෙහි අන්තර්ගත වේ.

මිනිසාට ඍජු මඟ ලැබීමට නම් වහී හි ඥානය අවශ්‍ය වේ.

වහී දැනුම මිනිසාට හොඳ නරක, හරි වැරදි පිළිබඳ අවබෝධය ලබා දෙයි.

වහී විශ්වාස කර ජීවත් වන මිනිසා ක්‍රමයෙන් මනෝ ඉච්ඡාව ජය ගනියි.

**මිනිස් සිතෙහි උද්ගත වන ගැටළු කිහිපයක් ඇත. එනම්,**
- මා කවුද?
- කොහි සිට පැමිණියෙම්ද?
- යන්නේ කොයි දෙසටද?
- මාගේ උපතේ අරමුණ කුමක්ද?

මෙම ගැටළුවලට වහී හි ආධාරය නොමැතිව නිශ්චිත පිළිතුරු සෙවිය නොහැක.

## 15. අල්කුර්ආනය පහළ කිරීම හා ගොනු කිරීම.

අල්කුර්ආනය අවසන් වරට මුහම්මද් නබි (සල්) තුමාට පහළ කරන ලද ආගම වේ.

මුහම්මද් නබි (සල්) තුමාණන් 40 වන වියෙහි හීරා ගුහාවේ තනි වී සිටිය දී ලෛලතුල් කද්ර් නම් රාත්‍රියෙහි ප්‍රථම වහිය පහළ විය.

වහී රැගෙන එන මලක්වරයා වන ජිබ්රීල් (අලෛ) තුමා නබි තුමාණන් හට සූරා අලක් හි පළමු වාක්‍යයන් 5 කියවන්න. (ඉක්රඃ) යැයි පැවසුවේය.

අල්කුර්ආන් වාක්‍යයන් අවස්ථාවන්ට අනුව තනි වාක්‍යයන් ලෙසත්, සූරාමන් ලෙසත් පහළ විය.

ඒවා සටහන් කර ගැනීමට මුහම්මද් නබි (සල්) තුමාණන් "කුත්තාබුල් වහී" වරුන් පිහටවනු ලැබූහ.

අල්කුර්ආනය පියවරින් පියවර පහළ වූ පිළිවෙල "තර්තීබුන් නුසුල්" යනුවෙන්ද,

අල්කුර්ආනය පාරායනා කිරීම සඳහා මුහම්මද් (සල්) තුමාණන් පෙන්වා දුන් පිළිවෙල "තර්තීබුන් තිලාවත්" යනුවෙන් හැඳින්විය.

නබි (සල්) තුමාගේ කාලයේ අල්කුර්ආනය ග්‍රන්ථාරූඪ නොවීය.

නබි (සල්) තුමාණන්ගේ වෆාතයෙන් පසුව අබුබකර් (රළි) තුමාණන්ගේ කලිෆා සමයේ ව්‍යාජ නබිවරුන් හා ඉස්ලාමය හැරගිය අය කලබල කර ගැනීමත් සමඟ, ඔවුන්ට විරුද්ධව "යමාමා'' නම් ස්ථානයේ සටනක් සිදු විය.

මෙම අවස්ථාවේදී අල්කුර්ආනය වනපොත් කළ කලීෆාවරු අධික ලෙස ෂහීද් වූහ.

මේ නිසා අල්කුර්ආනය නැති වී යයිදෝ යන බියෙන් උමර් (රළි) තුමාණන් කලීෆා තුමාට අල්කුර්ආනය ගොනු කර ලිඛිතව තබා ගත යුතු යැයි උපදෙස් දුන්නේය.

එම වගකීම **zසයිද් බින් ඉබිනු සාබින් (රලි) තුමාගේ** නායකත්වයෙන් යුත් කමිටුවකට පවරනු ලැබූහ.

කඩදාසි මත ලියූ කුර්ආන් පාඨයන් **"මුස්හෆ්"** යනුවෙන් නම් කරන ලදී.

අල්කුර්ආනය ගොනු කිරීමේ පියවර, කලීෆා උස්මාන් (රළි) තුමාගේ කාලයේ සිදුවිය.

අබූබක්ර් (රළි) තුමාගේ කාලයේ මුස්හෆ්ද, කුරෛෂිවරුන්ගේ භාෂා ව්‍යවහාරයද අවධානයට ලක් කරමින් පිටපත් අටක් සකස් කළහ.

පෙර තිබුණු අනෙක් පිටපත් සියල්ල ගිනිබත් කළ යුතුය යැයි අණ කළේය.

සියළු දෙනාම අල්කුර්ආනය එකම ආකාරයෙන් පාරායනය කරන තත්ත්වය නිර්මාණය කළේය.

එම නිසා **උස්මාන් (රළි) තුමාණන් "ජාමිඋල් කුර්ආන්"** යන ගෞරව නාමයෙන් හඳුන්වනු ලැබුණි.

## 16. සුන්නත් හි වැදගත්කම

ඉස්ලාමයේ අල්කුර්ආනයට පසුව දෙවන මූලාශ්‍රය වශයෙන් සුන්නත් (සුන්නා) හැඳින්විය හැක.

නබි (සල්) තුමාගේ ජීවිතය සහ ප්‍රකාශ සුන්නත් යනුවෙන් නිර්වචනය කළ හැකිය.

සුන්නත් "හදීස්" යනුවෙන්ද ව්‍යවහාර කරනු ලැබේ.

සුන්නාව "වහී ගෛරු" මත්ලුව් යනුවෙන්ද හඳුන්වනු ලබයි.

අල්කුර්ආනය සහ සුන්නත් යන දෙක එකින් එක රඳා පවතින පරිපූර්ණ කොටස් දෙකක්ය.
සුන්නත් මඟහැර අල්කුර්ආනය තේරුම් ගැනීමට හෝ ක්‍රියාවේ යෙදීමට හෝ නීති සැකසීමට නොහැකිය.

අල්කුර්ආනය සලාතය නිසි පරිදි අනුගමනය කරන ලෙස මඟ පෙන්වයි. නමුත් සලාතය කෙසේ අනුගමනය කළ යුතු ද යන්න සුන්නත් මඟින් පැහැදිලි කරයි.

නීති සම්පාදනයේදීද සුන්නත් අවශ්‍ය වේ.

සුන්නත් ආරක්ෂා කර ගැනීම සඳහා සහාබාවරු, තාබිඊන්වරු සහ ඉන් පසුව පැමිණි සමාජවල කැපවීම මනාව පැහැදිලි වේ.

අනාගත සමාජයට හදීස් දායාද කිරීම සඳහා විද්වතුන් ඒවා ව්‍යාජ හදීස් අතරින් නිවැරදි හදීස් හඳුනා වෙන්කර හදීස් ග්‍රන්ථ නිර්මාණය කළේය.

## 17. සහය මූලාශ්‍ර

**ඉස්ලාම් හි සහය මූලාශ්‍ර කොටස් දෙකකි.**

i. ඉජ්මාඋ
ii. කියාස්

**ඉජ්මාඋ**

ඉජ්මාඋ නම් අරාබි වදනේ නිර්වචනය එකමුතු කිරීම, ස්ථිරත්වයට එළඹීම තුළ ඒකමතික තීරණයට අවතීර්ණ වීමය.

ඉජ්මාඋ නීති මූලාශ්‍රයක් ලෙස අනුගමනය කළ හැක.

**ඉජ්මාඋ පිළිගෙන එම මඟෙහි ගමන් ගැනීමෙන් අත්වන ප්‍රයෝජන**

1. සමාජයේ සමඟිය රැකෙයි.
2. සමාජයේ හික්මීම බිඳ නොවැටෙයි.
3. එකිනෙකාට උදව් උපකාර ලබා ගැනීමේ අවකාශය සැලසෙයි.

**ඉජ්මාඋ විවිධ අංශවලට බෙදා පැහැදිලි කර ඇත.**

1. ඉජ්මාඋස් සරීහ් (පැහැදිලි ඉජ්මාව)
2. ඉජ්මාඋල් අක්සරිය්යා (බහුතර තීරණය)
3. ඉජ්මාඋස් සුකූති (නිහඬ ඉජ්මාව)

**කියාස්**

කියාස් යනු සසඳා බැලීම, අනුමාන කිරීම යන අරුත් ගෙන දේ.

අල්කුර්ආනය හා සුන්නාවෙහි සඳහන් නොවන ගැටළුවක් මතු වූ විට එය අල්කුර්ආනයේ සුන්නාවෙහි තීරණය හෝ විසඳුම සඳහන් වූ ගැටළුවක් සමග සසඳා බලා එම තීරණය හෝ විසඳුම නව ගැටළුවකට විසඳුමක් ලෙස භාවිත කිරීම මෙම වචනයෙන් පිළිඹිබු වේ.

**කියාස් මූලික කරුණු 4 ට සීමා වේ.**

**1. අල් අස්ල්**
මීට පෙර තීරණය දෙන ලද ගැටළුව.

**2. අල් ෆරු**
අල්කුර්ආනය හෝ සුන්නාවේ හෝ ඉජ්මාවේ හෝ තීරණය නොදක්වා ඇති තීරණය ගත යුතුව නිරාකරණය නොවූ ගැටළුව.

**3. අල් ඉල්ලත්**
ගැටළු දෙකක් අතර තිබෙන්නා වූ පොදු ගුණාංග හෝ පොදු කරුණු.

**4. අල් හුකුම්**
අල්කුර්ආනය සහ සුන්නාවෙන් ලබා ගත් තීරණය.

## 18. අරාබිකරයේ ඉස්ලාම් ව්‍යාප්තිය

අරාබිකරයේ ඉස්ලාම් ධර්මය හඳුන්වා දෙනු ලැබූ කාලවකවානුව **'ජාහිලියියා කාලය'** යනුවෙන් හැඳින්වෙයි.

අරාබිකරයේ ගෝත්‍ර ස්වරූපයෙන් යුත් සමාජයක් දක්නට ලැබිණ.

පවුල් කීපයක් ඒකාබද්ධ වී ශුඋෆබ් (පොකුර) තැනුණෝය.

එම **ශුඋෆබ්** (පොකුරු) කිහිපයක් ඒකාබද්ධ වී **කබීලා** (ගෝත්‍ර) බිහිවිය.
මෙම ගෝත්‍රයන් "ශෛතු'' යන නමින් නායකයකු විසින් පාලනය කරන ලදී.

විධිමත් පාලන ක්‍රමයක් නොතිබුණි.

මෙම ගෝත්‍ර අතර ආරවුල් ද දීර්ඝ සටන් ද තිබුණි.

මෙකල ආගම් ලෙස ක්‍රියාත්මක වූයේ සංස්කෘතික අංගයන් කිහිපයක් පමණයි.

මෙම කාලයේ විධිමත් පවුල් පරිසරයක් නොවීය. ඉහළ පෙළේ ගෝත්‍රවල පමණක් "නිකාහ් සාලිහ්" යනුවෙන් ජාතික විවාහ පද්ධතියක් දක්නට ලැබුණෝය.

ඝාතනය, මත්ද්‍රව්‍ය, පොලිය, ස්ත්‍රී දූෂණය, පළිගැනීම්, මංකොල්ල වැනි ක්‍රියා බහුලව තිබුණු නමුත් භාෂා නිපුණත්වය, නිදහස් ආකල්ප, පොරොන්දු කඩ නොකිරීම්, ආගන්තුක සත්කාර, ධෛර්යය, සරල බව වැනි ගතිගුණද දක්නට ලැබුණි.

මෙවන් සමාජයක් තුළ ඉස්ලාමය හඳුන්වා දී නබි (සල්) තුමන් මෙම සමාජය අල්ලාහ්ගේ ප්‍රශංසාවට ලක් වූ සමාජයක් බවට පත් කළේය.

## 19. නබි (සල්) තුමාගේ දෑවාව සහ අභියෝග

නබි (සල්) තුමාණන්ගේ මූලික අවශ්‍යතාව වූයේ අල්ලාහ් වෙතට ජනතාව කැඳවා ගැනීමයි. මෙය "දෑවා" යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඔහු තම 40 වන වියේ දී අල්ලාහ් තආලාගේ උපදෙස් මත මෙම සේවාව ආරම්භ කළේය.

නබි තුමාණන් පළමුව ඔහුගේ පවුලේ සාමාජිකයන්ටත්, යහළුවන්ටත් මේ ගැන පැහැදිලි කළේය.

පසුව සෆා කන්ද මුදුනට නැග ජනතාව කැඳවා තමාගේ පණිවිඩය පැහැදිලි කළේය.

නමුත් මෙය කුරෙෙෂිවරුන්ට සහ අන් අයට අළුත් මෙන්ම තිත්ත ස්වරූපයක් ගත්තේය.

අබූ ලහබ්, අබූ ජහ්ල් යන අයගේ ප්‍රධානත්වයෙන් විරුද්ධවාදීන් බොහෝ දෙනෙක් නිර්මාණය විය.

ඉස්ලාම් වර්ධනය වීමත් සමඟ විරුද්ධවාදීන් නබි (සල්) තුමාණන්ට මානසික හා ශාරීරික වද හිංසා කරන්නට පටන්ගත්තේය. බොහෝ යුද්ධ හා සටන්ද ඇති විය.

ඒ අතර අරාබිකරයෙන් එපිට රටවලද ඉස්ලාම් ව්‍යාප්ත විය. නබි (සල්) තුමාගේ වෆාතයෙන් පසු කලීෆාවරුන්ගේ කාලයේ ඉස්ලාමීය රාජ්‍ය පැතිර ගියේය.

තමාට හිරිහැර කළ ජනතාව තම පණටත් වඩා ඉහළින් සැලකුවේය. ඒ තුළින් නබි (සල්) තුමාණන් ඔවුන්ගේ සිත් දිනා ගත්තේය.
මෙසේ අභියෝග රැසක් ඉවසමින් සුදුසු පරිදි හැසිරවීමෙන් ඉස්ලාම් ධර්මය ජාත්‍යන්තර බලවේගයක් බවට පත් කළේය.

## 20. සීරාවෙහි වැදගත්කම

සීරා යන්න නබි (සල්) තුමාණන්ගේ ජීවිත කතාවයි.

නබි (සල්) තුමාණන් සමඟ සහාබාවරුන් ඉතාමත් සමීපයෙන් මිත්‍රයන් ලෙසද තමන්ගේ පණටත් වඩා නබි තුමාණන්ට ආදරය දැක්වූයේය.

සහාබාවරුන් විසින් එතුමාගේ ප්‍රතිරූපය, චලනය, ක්‍රියාකාරකම්, දේශන, කැමැත්ත, අකමැත්ත යනාදිය ඉතා සූක්ෂම ලෙස හඳුනා ගනු ලැබිණි.

නබි (සල්) තුමාගේ මිතුරන්, තාබිඊන්වරු ඉන්පසු තබඋත් තාබිඊන්වරු නබි තුමාගේ ඉතිහාසය ආරක්ෂා කිරීම සඳහා අසහාය උත්සාහයන්හි යෙදුනෝය.

ශ්‍රවණය කිරීමෙන් සහ කටපාඩමෙන් ලැබුණු සීරා තොරතුරු මුහම්මද් බින් ඉස්හාෆ් විසින් ලේඛන ගත කළේය.

එහි නම "සීරත් රසූලුල්ලාහ් " යනුවෙන් හඳුන්වයි.

සියළුම දෙනාට ආදර්ශයක් ලෙස ද ජීවන රටාවක් ලෙස ද සීරාව වැදගත් වේ.

නබි (සල්) තුමාණන් මිනිසුන් අතර ශුද්ධ වූ හා ශ්‍රේෂ්ඨ, විවිධ යහපත් ගතිගුණ හිමි පුද්ගලයෙකි.

මුස්ලිම්වරයෙකු වශයෙන් එතුමාට සමීප වීම ඊමානයේ කොටසකි.

## 21. ආර්ථිකය සම්බන්ධ ඉස්ලාමීය දැක්ම

**මිනිසාගේ ආර්ථික අර්බුද විසඳා ගැනීමට යොදා ගන්නා ප්‍රධාන ආර්ථික සංකල්ප දෙකකි.**

1. ධනවාදී ආර්ථික ක්‍රමය
2. සමාජවාදී ආර්ථික ක්‍රමය

නමුත් ඉස්ලාමීය දැක්මෙන් බලන කළ මිනිසා විසින් ගොඩනැගූ සංකල්පයන්ට වඩා ඉස්ලාමීය ආර්ථික ක්‍රමය සර්ව බලධාරී අල්ලාහ් විසින් නිර්මාණය කරන ලද ශ්‍රේෂ්ඨ ආර්ථික ක්‍රමයකි.

**ඉස්ලාමීය ආර්ථිකයේ මූලික සංකල්ප දෙකකි.**

i. (විශ්වාසය හා සම්බන්ධ) ප්‍රතිපත්තිමය කරුණු
ii. ක්‍රියාකාරකම් හා සම්බන්ධ මූලික කරුණු

**1) (විශ්වාසය හා සම්බන්ධ) ප්‍රතිපත්තිමය කරුණු ;**

- සියළුම සම්පත් අල්ලාහ්ගේය. ඒවා මිනිසා වෙනුවෙන් බිහි කළේය.
- ධනවත්කම ගැන කියාමත් දිනයේ විමර්ශනය කරනු ලැබේ.
- පෞද්ගලික දේපල / ධනයෙන් කොටසක අයිතිය සමාජයටද ඇත.
- ධනය ඉපයීමට දරණ උත්සාහය සාර්ථක හෝ අසාර්ථක වන්නේ අල්ලාහ්ගේ අභිමතය පරිදිය.
- ධනය / සම්පත් මිනිසා පරීක්ෂණයට භාජනය කිරීම සඳහා ලබා දී ඇති ඒවා වේ.

**2) ක්‍රියාකාරකම් හා සම්බන්ධ මූලික කරුණු ;**

- අල්ලාහ්ට ස්තූතිය පුද කිරීම.
- සකාත්, සදකා හා වෙනත් දානමාන වලින් සමාජයට හිමි කොටස ලබා දීම.
- වැය කිරීමේදී සහ ඉතිරි කිරීමේදී මධ්‍යස්ථ වීම.
- කුමන හෝ ආර්ථික ක්‍රියාදාමයක වුවද පොලිය අන්තර්ගත නොවීමට වගබලා ගැනීම.
- අල්ලස්, රැවටීම, සූදුව, දූෂණය වැනි වූ ක්‍රියාවලින් සම්පූර්ණයෙන්ම වැළකී සිටීම.
- කාලය හා වාතාවරණය තුළින් ඇතිවන ආර්ථික අවශ්‍යතා, වෙනස් වීම් හා ව්‍යාකූලතා ඉස්ලාමීය විද්වතුන් විසින් ඉජ්තිහාද් කර නිරාකරණය කළ යුතුය.

❖ **ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ වැදගත් කරුණු ;**

- **දේව ගුණාංග**

  ආර්ථික අඩුපාඩු නොමැති වීම.
- **සමාජය තුළ පැන නඟින ආර්ථික උස් පහත්කම් විධිමත් කිරීම.**
- **න්‍යායශීලීභාවය**
- **බරකත් හිමි වීම.**

## 22. ඉපයීමේ වැදගත්කම

ඉපයීම යනු අල්ලාහ්ගේ ආනිශංස දායාද සොයා යන උත්සාහයකි.

වෙනත් කෙනෙකුගෙන් යැපීම ඉස්ලාමීය දැක්මට අනුව පහත් ක්‍රියාවකි.

ඉස්ලාම්, සිඟමන් යැදීම පිළිබඳ තරයේ අවවාද කර සිටින්නේය.

**"කෙනෙක් නොකඩවා සිඟමන් යැදීමේ නිතර වෙයි නම් කියාමා දිනයේ ඔහු මුහුණේ මස් පිඩු නොමැතිව එන්නේය" (බුහාරි මුස්ලිම්)**

මිනිසා තම අවශ්‍යතා තමාම සපුරා ගත යුතුය.

මිනිසා තමාගේ ශක්තිය යොදවා වෙහෙස වී හලාල් වූ ක්‍රමයට අල්ලාහ්ගේ මාර්ගයේ කටයුතු කරමින් තම ධනය හෙවත් ඉපයීම සොයා ගත යුතුය.

ඉස්ලාම්, ඉපයීම ඉබාදතයක් ලෙස සලකයි.

**ඉපයීම යාඥාවක් ලෙස සැලකීමට අනුගමනය කළ යුතු ක්‍රියාවන්** ;

1. පිරිසිදු චේතනාව
2. මූලික වතාවත්වලට පටහැනි නොවීම.
3. ෂරිආ නීති කඩ නොකිරීම.

❖ **ඉපයීමට අදාළ ෂරිආ නීතිරීති;**

1. **හරාම් වූ දෑ අඩංගු භාණ්ඩයක් නොවිය යුතුය.**
   (උදා :- මධ්‍යසාර, ඌරු මස්, සොරකම් කළ භාණ්ඩ)

2. **හරාම් වූ ක්‍රියා මඟින් ලබාගත් දෙයක් නොවිය යුතුය.**
   (උදා :- සොරකම, පොලිය, අල්ලස්)

3. **ජනතාවට හිරිහැරයක් හෝ රැවටීමක් වන දෙයක් නොවීම.**
   (උදා :- පොරොන්දු කඩ කිරීම්, සැඟවීම්, මිශ්‍ර කිරීම්)

4. **පොදු නීති උල්ලංඝනය කිරීමේ ක්‍රියාවන් නොවිය යුතුයි.**
   (උදා :- කළු කඩ, භාණ්ඩ පැන්නීම)

5. **යහපත් සාරධර්ම වලට පටහැනි නොවිය යුතු වීම.**
   (උදා :- බොරුකිරීම්, තණ්හාව, වංචාව, ආත්මාර්ථකාමීත්වය)

## 23. ඉපයීම (1)

කෘෂිකර්මාන්තය ඉතා පැරණි ඉපයීම් ක්‍රමයකි. මෙහි කොටස් 2 ක් ඇත.

1. **ශාක ආහාර ලබා ගැනීම සඳහා වූ බෝග වගාව**
2. **මාංශ ආහාර ලබා ගැනීම සඳහා වූ සත්ත්ව පාලනය**

දෙආකාරයම අල්ලාහ් විසින් අනුමත කළ ඉපයීම් ක්‍රම යනුවෙන් අල්කුර්ආනය සඳහන් කරයි.

හදීස් මූලාශ්‍ර පදනම් කරගෙන ආදම් (අලෛ) තුමා විසින් මේ දෙආකාරයේම කෘෂිකර්මාන්ත හඳුන්වා දී ඇත. ඔහුගේ පුතුන් දෙදෙනා මෙම අංශ විශේෂ රැකියාවක් වශයෙන් කර ඇත.

**හාබීල් - බෝග වගා කිරීම.**
**කාබීල් - සතුන් ඇති කිරීම.**

**කර්මාන්ත යනුවෙන් අදහස් කරන්නේ මිනිසා තම දැනුම හා හැකියාව උපයෝගී කරගෙන යම් අමුද්‍රව්‍යයක් යොදා තමන්ට අවශ්‍ය නිමි භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමය.**

විවිධ වූ කර්මාන්ත වර්ග ඇත.

ඉතාමත් පැරණි කර්මාන්ත ලෙස පේෂ කර්මාන්තය හා වඩු කර්මාන්තය සැලකිය හැක.

| | | |
|---|---|---|
| **ඉද්රීස් (අලෛ) තුමා** | **-** | **පේෂ කර්මාන්තය** |
| **නූහ් නබි තුමා** | **-** | **වඩු කර්මාන්තය** |
| **සකරීයා (අලෛ) තුමා** | **-** | **වඩු කර්මාන්තය** |
| **දාවුද් (අලෛ) තුමා** | **-** | **ලෝහ කර්මාන්තය** |

## 24. ඉපයීම (2)

වෙළඳාම හා සේවා සැපයීම ඉපයීමේ ක්‍රමයන්ය.

**වෙළඳාම**

භාණ්ඩයක හෝ දේපළක අයිතිය ලබාගෙන තවත් කෙනෙකුට එහි අයිතිය ලබා දීම. "වෙළඳාම" වෙයි.
වෙළඳාමෙහි නියැලීමට පෙර වෙළඳාම පිළිබඳ පුළුල් දැනුමක් මිනිසෙකුට තිබිය යුතුය.
වෙළඳාමක් අනුමත වීමට මූලික කරුණු කිහිපයක් හා කොන්දේසි කිහිපයක් සම්පූර්ණ විය යුතුය.

**වෙළඳාමෙහි මූලික කරුණු**

1. ගැනුම්කරු - විකුණුම්කරු
2. වෙළඳ භාණ්ඩ
3. ඊජාබ් - කබූල්

**01. ගැනුම්කරු - විකුණුම්කරු**

I. නිසි වයසට පැමිණි අයෙකු විය යුතුය.
II. සිහි බුද්ධියක් ඇති කෙනෙකු විය යුතුය.
III. වෙළඳාම පිළිබඳ මනා දැනුමක් ඇත්තෙකු විය යුතුය.

**02. වෙළඳ භාණ්ඩ**

I. විකුණුම්කරුට අයිති විය යුතුය.
II. ගැනුම්කරුට භාරදිය හැකි තත්ත්වයක තිබිය යුතුය.
III. අත්පිට තිබිය යුතුය.
IV. ඉස්ලාමීය ෂරිආවට අනුව පිරිසිදු හා ප්‍රයෝජනවත් භාණ්ඩයක් විය යුතුය.

**03. ඊජාබ් - කබූල්**

ඊජාබ් යනු විකුණන්නා තමා විකුණූ භාණ්ඩ විකුණූ බවට කාබුල් යනු මිලදී ගන්නා තමා එය තෘප්තිමත්ව පිළිගන්නා බවත් ප්‍රකාශ වීමය.

**වෙළඳ ගනුදෙණුවලදී තහනම් කළ දේ**

1. අනවශ්‍ය දිවුරුම්
2. කිරුම් මිනුම් වංචා
3. සැගවීම
4. අධික මිල තැබීම.
5. මිශ්‍ර කිරීම
6. බොරු කීම
7. රැවටීම
8. පොදු නීතිරීති උල්ලංඝනය කිරීම.

**වෙළඳාමේ යෙදීමෙන් විවිධ ප්‍රයෝජන ලබා ගත හැකිය.**

1. ඔවුන්ගේ ගනුදෙණු ක්‍රියාවලිය නැමදුමක් බවට පත් වේ.
2. මිලදී ගන්නා සහ විකුණන්නා අතර සුහදතාවයක් ඇති වෙයි.
3. වෙළඳාමේ ස්ථාවරත්වයක් ඇති වෙයි.
4. අනවශ්‍ය දෝෂාරෝපණ වලින් ආරක්ෂාව ලැබේ.
5. හරාම් වන ගනුදෙණුවලින් මිදිය හැකිය.

**සේවාවන්**

ඉපයීමට දරන උත්සාහයන් අතර සේවා සැපයීමද එකකි.

කෙනෙකු තවත් කෙනෙකුට සේවාවක් ලබා දීමයි.

**සේවා කොටස් දෙකකි.**

I. බුද්ධිය සම්බන්ධ (ගුරු වෘත්තිය, ලිපිකාර වෘත්තිය)
II. කායික ශ්‍රමය (සුළු සේවකයන්, කම්කරුවන්, ආරක්ෂක සේවා)

## 25. අජ්නබි - මහ්රම් සීමාවන් අනුගමනය කරමු.

මහ්රම්, වචනය ව්‍යවහාරයේ "හරාම්" යන තේරුම ගෙනදෙයි.

ස්ත්‍රියකට විවාහ කර ගැනීමට තහනම් වූ පිරිමියා පිළිබඳව හා පිරිමියා විවාහ කර ගැනීමට තහනම් වූ ස්ත්‍රිය හැඳින්වීමට මෙම වචනය භාවිත කෙරේ.

**පිරිමින්ට විවාහ කිරීමට නුසුදුසු ස්ත්‍රීන්**

**1. පවුල් නෑකම**

- මව, මවගේ මව
- දුව, දුවගේ දරුවන්, පුතාගේ දරුවන්
- සහෝදරිය, පිය පාර්ශවයේ සහෝදරිය, මව් පාර්ශවයේ සහෝදරිය
- පියාගේ සහෝදරිය
- මවගේ සහෝදරිය
- සහෝදරයාගේ දුව, මව් පාර්ශවයේ සහෝදරයාගේ දුව, පිය පාර්ශවයේ දුව
- සහෝදරයාගේ දුව, මව් පාර්ශවයේ සහෝදරයාගේ දුව, පිය පාර්ශවයේ සහෝදරයාගේ දුව

**2. කිරි නෑකම්**

- කිරි පෙවූ මව, ඇයගේ මව්වරුන්, පියාගේ මව
- කිරි නෑකමේ දුව, දුවගේ දුව, පුතාගේ දුව
- කිරි නෑකමේ සහෝදරිය, මව් පාර්ශවයේ සහෝදරිය, පිය පාර්ශවයේ සහෝදරිය
- කිරි පෙවූ මවගේ සහෝදරිය
- කිරි නෑකමේ පියාගේ සහෝදරිය
- කිරි නෑකමේ සහෝදරයාගේ දුව
- කිරි නෑකමේ සහෝදරියගේ දුව

**3. විවාහ නෑකම්**

- භාර්යාවගේ දුව
- භාර්යාවගේ මව
- දුතාගේ භාර්යාව
- පියාගේ භාර්යාව

මහ්රම් යන ලේඛනයේ ඇතුළත් නොවූ අය **"අජ්නබි"** යන ගණයට අයත් වේ.

අජ්නබි යන වචනය දුර නෑකම, නවකයා, නෑකමක් නැති කෙනා, සම්බන්ධයක් නොමැති කෙනා වැනි තේරුම් දරයි.

**අජ්නබි වූ පිරිමි සමඟ ආශ්‍රය කිරීමේදී අනුගමනය කළ යුතු කරුණු**

1. පහත බැලීම (බැල්ම පාලනය කර ගැනීම)
2. කාන්තාව අව්රතය සම්පූර්ණයෙන් ම වැසෙන පරිදි හා ගරුත්වය රැකෙන පරිදි ඇඳුම් ඇඳීම.
3. ඇවිදීම, ඇඳුම් ඇඳීම, හැසිරීම හා කතා කිරීම වැනි සියළු කරුණු ඉස්ලාමීය චාරිත්‍රයට අනුව පිළිපැදීම.
4. පිරිමින්ගේ හැඟීම් ඇවිස්සෙන ක්‍රියාවල නොයෙදීම.
5. අජ්නබි වූ ස්ත්‍රී පුරුෂ යුගලය හුදෙකලා වීමට ඇති අවස්ථාව සීමා කළ යුතුය.
6. සමාජ යහපත හා අවශ්‍යතා වෙනුවෙන් පමණක් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම හමු වන අවස්ථා සංවිධානය කළ යුතු වේ.

## 26. මානව අයිතිවාසිකම්

මානව අයිතිවාසිකම් අල්කුර්ආනය සහ සුන්නාව තුළින් ලබා ගන්නේය. අල්ලාහ් මිනිසාට අයිතිවාසිකම් ලබා දෙන්නේ උපතේ දීමය.

**ඉස්ලාම් පිළිගැන්වූ අයිතිවාසිකම් කිහිපයක්**

1. **ජීවත් වීමේ අයිතිය**

අල්කුර්ආනය මෙසේ පවසයි ;
**“අල්ලාහ් උතුම් කළ ප්‍රාණය නිසි විභාගයකින් තොරව මරන්න එපා” (6 : 151)**

**“කවරෙක් (අසාධාරණ ලෙස) ප්‍රාණ ඝාතනය කළේ ද ඔහු සියළුම මිනිසුන් ඝාතනය කළා හා සමානය. එසේම කෙනෙක් යම් ප්‍රාණයක් ජීවත් කළේද ඔහු සියළුම මිනිසුන් ජීවත් කළා හා සමානය” (5 : 32)**

2. **සමානාත්මතා අයිතිය**
3. **පෞද්ගලික නිදහසේ අයිතිය**

**“වර්ග තුනක් වන මිනිසුන්ට විරුද්ධව මම කියාමා දිනයේ වාද කරමි. ඉන් එක් පිරිසක් මිනිසුන් වහලුන් බවට පත් කර ඔවුන් විකුණා එම මුදලින් ජීවත් වන අය” (බුහාරි) යනුවෙන් නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළේය.**

4. **නීතියේ පිහිට ලබා ගැනීමේ අයිතිය**

**“විශ්වාසවන්තයිනි, අල්ලාහ් වෙනුවෙන් (සාධාරණ) සත්‍ය සාක්ෂි පවසන පුද්ගලයින්ම වන්න. එක් පාර්ශවයකට ඔබේ ඇති වෛරය නිසා ඔවුන්ට අසාධාරණයක් කිරීමට ඔබව පෙළඹවීමක් නොසිදු විය යුතුයි. (කොපමණ ක්‍රෝධය / වෛරය තිබුණද) නීතිය ක්‍රියාත්මක කරන්න. එය පාරිශුද්ධත්වයට ඉතා ආසන්න වූ තත්ත්වයකි.” (5 : 8)**

5. **ගෞරවය ආරක්ෂා කර ගැනීමේ අයිතිය**
6. **දේපළ ආරක්ෂා කිරීමේ අයිතිය**
7. **ආගමික හැඟීම්වලට ආරක්ෂාව ලබා දීමේ අයිතිය.**

## 27. තරුණකම හා සේවාව

මිනිසාගේ ජීවිතයේ තරුණ අවධිය වැදගත් කාලයකි.

නබි (සල්) තුමාණන් තරුණ විය පිළිබඳ සවිස්තරව පැහැදිලි කර ඇත.

**“මහලු වියට පැමිණීමට පෙර තරුණ විය ප්‍රයෝජනයට ගනු”** (හාකිම්) යන හදීසියෙන් සඳහන් කරයි.

මනුෂ්‍ය ජීවිතයේදී ශරීර ශක්තිය, සමාජ සහයෝගය, දක්ෂතා දියුණු කිරීමේ අවස්ථාවන් බාධාවකින් තොරව බහුලව ලැබෙන්නේ මෙම තාරුණ්‍යයේදීය.

**සමාජය වහල් භාවයෙන් නිදහස් කළ නබි මූසා (අලෛ) තුමාගේ ඉතිහාසය සූරා “ඈරාෆ්” හි සඳහන් වී ඇත.**

**රාජ්‍ය කුමන්ත්‍රණවලින් තම ඊමානය ආරක්ෂා කළ තරුණයන්ගේ ඉතිහාසය සූරා “කහ්ෆ්” හි සඳහන් වී ඇත.**

තරුණයන් ආදර්ශයට ගෙන බිහි වූ ඊළඟ පරම්පරාවේ තරුණයන් විශාල සංඛ්‍යාවක ලේඛන ඇත.

- **උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) - නිර්භීත පාලකයෙක්**
- **තාද්ක් බින් සියාද් - ස්පාඤ්ඤය ජයග්‍රහණය කිරීම**
- **මුහම්මද් බින් කාසිම් - සින්දුව ජයග්‍රහණය කිරීම**
- **මුහම්මද් අල් ෆාතිහ් - කොන්ස්තන්තිනෝපලය ජයග්‍රහණය කිරීම.**
- **ඉමාම් බුහාරි - සහීහුල් බුහාරි ග්‍රන්ථ ගත කිරිම**
- **ඉමාම් ෂාෆිඊ - "උසූලුල් ෆික්හ්" නිර්මාතෘ**
- **ඉමාම් ෂීබවෙහි - අරාබි ව්‍යාකරණ කතෘ**

## 28. ශාරීරික හා මානසික යෝග්‍යතාව

මිනිසා සතු දායාද වලින් නිරෝගීතාවය වැදගත් තැනකි.

මුස්ලිම්වරයෙකුට ඔහු විසින් ඉටු කළ යුතු ඉබාදත්, සමාජ සේවාවන්, ජීවත් වීමට අවශ්‍ය ඉපයීම් රටාව යනාදිය සම්පූර්ණ කිරීමට නිරෝගීකම අවශ්‍ය වේ.

නිරෝගී හදවතක් දැක ගත හැක්කේ නිරෝගී ශරීරයක් තුළය.

**මේ සඳහා විවිධ ක්‍රියා අනුගමනය කළ යුතුය.**

1. **ආහාර ගැනීමේ පුරුදු**
2. **ශාරීරික අභ්‍යාස**

ශරීරය නියමිත මට්ටමට පවත්වා ගැනීම ඉබාදතයක් වේ. යහපත් ශරීර සෞඛ්‍යයට ශාරීරික අභ්‍යාස වැදගත් වේ.

**"ඔබගේ දරුවන්ට පිහිනීමටත්, දුනු විදීමටත්, අශ්වයා පිට සවාරි යාමටත් උගන්වන්න" යැයි නබි (සල්) තුමාණන් අවධාරණය කළේය.**

3. **පිරිසිදු කම**

   ශරීරය, ඇඳුම් මෙන්ම ආහාර, නිදන ස්ථාන, රැකියා ස්ථාන, පරිහරණය කරන භාණ්ඩ යනාදිය ද පිරිසිදුව තබා ගත යුතුය.

   සතියකට වරක් හෝ ස්නානය කිරීම, ජනාබතයෙන් මිදීමට නොතිබුණත් ජුම්ආදීනවල ස්නානය කිරීම, පිරිසිදු සුවඳ විලවුන් ආලේප කිරීම ප්‍රශංසනීය වේ.

4. **විවේකය**

   ශරීර සෞඛ්‍යය ආරක්ෂා කිරීමේදී විවේකයටද මූලිකත්වය හිමි වේ. වෙහෙසට පත් වූ ශරීරයක් විසින් උද්යෝගීමත්ව ක්‍රියා කළ නොහැකිය.

   **"දිවා රාත්‍රී යනුවෙන් කාල දෙකක් ඔහු (අල්ලාහ්) ඔබට ලබා දුන්නේය. රාත්‍රියේදී ඔබ විවේකීව සිටීමත් දිවා කළ ඔබ ඔහුගේ ආනිසංස ලබා ගැනීමටත් තවද ඔහුට තුති පුද කිරීමටත් යොදා ගත හැකිය." බව අල්කුර්ආනය ප්‍රකාශ කරයි. (28 : 73)**

මිනිසුන් නොසැලකිලිමත් වන නිරෝගීකම හා විවේකය අල්ලාහ්ගේ දායාද ලෙස (බුහාරි), නබි (සල්) තුමාණන් පැහැදිලි කළේය.

5. **මානසික යෝග්‍යතාය**

ශාරීරික යෝග්‍යතාව මෙන්ම මිනිසාට මානසික යෝග්‍යතාවයද අත්‍යාවශ්‍ය වේ.

ඉස්ලාම් ශරීරයට මෙන්ම මනසටද මුල් තැනක් දිය යුතු යැයි ඉල්ලා සිටියි.

**"අල්ලාහ් ඔබගේ ශරීරය හෝ ශාරීරික ලස්සන බලන්නේ නැත. ඔබගේ මනස සහ ක්‍රියා ගැන පමණක් බලන්නේය." යනුවෙන් නබි (සල්) තුමා ප්‍රකාශ කළේය. (බුහාරි මුස්ලිම් )**

නිරෝගී මනස තුළින් නිරෝගී යහපත් ක්‍රියාවන් සහ යහපත් සිතුම් පැතුම් බිහි විය හැකිය. රෝගී මනසක් තුළින් පාපය මුසු වූ ක්‍රියා බිහි වෙයි.

**"ශරීරයේ එක්තරා මස් පිඩුවක් තිබේ. එය පිරිසිදු වුවහොත් මුළු ශරීරයම පිරිසිදු වෙයි. එය අපිරිසිදු වුවහොත් මුළු ශරීරයම අයහපත් වෙයි." (බුහාරි)**

## 29. මධ්‍යස්ථභාවය අනුගමනය කිරීම

අන්ත දෙකක එළඹ සිටින පාර්ශව දෙකක් අතර මධ්‍යස්ථභාවය ඇති කිරීම "වසතියා" යනුවෙන් හැඳින්වේ.

**"(විශ්වාසනාවන්තයිනි) එවැනි (උස් පහත්කමක් නොමැති) මධ්‍යස්ථභාවයෙන් යුත් සමාජයක් ලෙස ඔබ බිහි කළෙමු. එම නිසා ඔබලා (අන්) අයට (ආදර්ශයක් දෙන) සාක්ෂියක් වශයෙන් ඉන්න. (අපේ) දූතයා ඔබට (යහමඟ පෙන්නුම් කරන) සාක්ෂියක් ලෙස සිටියි." යනුවෙන් අල්කුර්ආනය සඳහන් කරයි.** (2 : 143)

මෙහිදී මුස්ලිම් සමාජය "උම්මතන් වසතන්" මධ්‍යස්ථභාවයෙන් යුත් සමාජයක් ලෙස හඳුන්වනු ලැබේ.

සමාජීය හෝ තනි පුද්ගල සමාජ ජීවිතය වැනි සියළුම ක්‍රියාවලදී මධ්‍යස්ථභාවය අනුගමනය කරන ලෙස බලාපොරොත්තු වෙයි.

ලෞකික ක්‍රියාකාරකම්වල පමණක් දැඩි ලෙස නිරත වීම වසතියා ක්‍රියාවට පටහැනි වේ.

එක්තරා අවස්ථාවක නබි (සල්) තුමාට සහ අබ්දුල්ලා ඉබ්නු අම්ර් (රළි) තුමා අතර දෙබසක් ඇති විය.

**නබි (සල්) තුමා :-**
ඔබ දවල් කාලය මුළුල්ලේ සෞමයෙහි යෙදී රාත්‍රිය මුළුල්ලේ දේව යාඥාවල නිරත වෙන බව අසන්නට ලැබුණි.

**ඉබ්නු අම්ර් (රළි) :-**
ඔව් අල්ලාහ්ගේ දූතයාණනි !

**නබි (සල්) තුමා :-**
එසේ නොකරනු, සෞමයෙහිද නිරතවන්න. සෞම්‍යය නොමැතිවද ඉන්න (රාත්‍රියේ) සලාතයේද යෙදෙන්න. නිදා ගන්න, ඔබගේ ශරීරයටත්, භාර්යාවටත්, ඔබව හමු වීමට එන අයටත් ඔබ විසින් කළ යුතු යුතුකම් ඇත. (බුහාරි)

මෙය ඇසූ ඉබ්නු අම්ර් (රළි) තුමා ඒ දක්වා ආධ්‍යාත්මික ක්‍රියාවල අධික ලෙස නිරත වී සිටියද ඒවා මඳක් ලිහිල් කළේය. (මුස්නද් අහමද්)

ඉස්ලාම් පෙන්නුම් කර දෙන මැද පිළිවෙත ජීවිතයේ සියළුම අංශවලදී පිළිපැදිය යුතුය.

# 11 ශ්‍රේණිය

## 1. අකීදා

- කිසිඳු සැකයකින් තොරව ස්ථිරව විශ්වාස කර පිළිගැනීම අකීදා යනුවෙන් හැඳින්වේ.
- ''අර්කානුල් ඊමාන්'' යන මූලික ඉස්ලාමීය විශ්වාසයන්හි පදනම් වේ. අකීදා යන පදයෙහි බහු වචනය ''අල්අකාඉද්''
- මිනිස් ඉතිහාසයේ සියලුම කාල යුගවල දේශනා කරන ලද්දේ එකම අකීදාව වේ.
- ඉස්ලාමීය ඉතිහාසයේ පසු කාලයේ - මුස්ලිම් සමාජය තුළ ඇති වුණු දේශපාලන ගැටුම්, පිටස්තරයන්ගේ අදහස්, ආගම් අතර ඇතිවුණු සම්බන්ධතා, බුද්ධියේ සීමාව ඉක්මවා භාවිතා වීම, අන්තවාදී වීම, ස්ව කැමැත්ත අනුව ක්‍රියා කිරීම, සතුරු කුමන්ත්‍රණ, මිත්‍යා විශ්වාස යනාදී හේතූන් නිසා අකීදාවේ චාම් ගතිය අහිමි විය.
- මෙම හේතූන් නිසාම ජනයාව නොමඟ යවන ප්‍රතිපත්ති හා අදහස් ඉදිරිපත් කරන විකෘති කණ්ඩායම් බිහිවිය. නිදසුන් වශයෙන්:- කවාරිජ්, කද්රියියා, ජබරියියා, මුඃතසිලා මුර්ජියියා යනාදීන්ය.
- නබිතුමා (සල්) ගෙන් පසුව කිලාෆතයට සුදුස්සා තෝරා ගැනීමේදී ඇති වුණු දේශපාලන ගැටළු පදනම් කරගෙන බිහිවුණු ''ෂීආ'' කණ්ඩායම පසුව පටහැනි පිරිසක් ලෙස දියුණු විය.
- පටහැනි දාර්ශනික කණ්ඩායම්ගේ බලපෑම්වලින් අකීදාවෙහි පාරිශුද්ධතාවය රැකීමට ඉමාම්වරු දැඩි ලෙස වෙහෙසුනහ. ඔවුන් අතරින් ඉමාම් අහ්මද් බින් හන්බල්, ඉමාම් අබුල් හසන් අල්අෂ්අරි, ඉමාම් අබු මන්සූර් අල් මාතුරූදී, ඉමාම් අබු ජඃෆර් අත්තහාවි.
- මුඃතසිලා චින්තනයට විරුද්ධව සටන් කළ ඉමාම් අහ්මද් තුමා ''මා ජීවත්ව සිටින විට ඉස්ලාම් අභාවයට පත්වනවාට වඩා ඉස්ලාම් ජීවමානව පැවතෙද්දී මා මිය යෑම උතුම්ය'' යනුවෙන් ප්‍රකාශ කිරීම එතුමාගේ පරිත්‍යාගයට සාක්ෂි දරයි.

## 2. අහ්ලුස්සුන්නාහ් වල් ජමාආත්

- අහ්ලුස්සුන්නාහ් වල් ජමාඅත් යනු නබි (සල්) තුමා හා එතුමාගේ හිත මිතුරන් ජීවත් වූ ක්‍රමය අනුගමනය කිරීම වේ.
- අහ්ලුස්සුන්නාහ් වල් ජමාඅත්හි අකීදාවෙහි සාරාංශයඃ-

  **- අල්ලාහ් -**

  අල්ලාහ් සියල්ලෙහි මැවුම්කරුවාය. ඔහුට ආරම්භයක් හෝ අවසානයක් නැත. සියල්ල කෙරෙහි බලය ඇත්තේය. ඔහු පරිපූර්ණ, සර්වඥ, සදා පවතින, සර්ව ශ්‍රාව්‍ය, සර්ව දෘෂ්ටික වූවකි. තවද නැමදුමට සුදුස්සා ඔහුය. ඔහුට කිසිවෙකු කෙරෙහි අවශ්‍යතාව නොමැත. ඔහු අසමසමයකි. ඔහු කිසිවක අරක් ගන්නේ නැත. ඔහු පැතූ දේ සිදු වේ. නොපැතූ දේ සිදු නොවේ. ''රිස්කය'' ලබා දෙන්නේ ඔහුමය. රෝග නිවාරණය, දුක් කරදර තුරන් කරන්නේද ඔහුමය. මුඃමින්වරු කියාමතයේදී ඔහුව දැකීමේ භාග්‍ය ලබති.

  **- මලක්වරු -**

  අල්ලාහ් මලක්වරුන්ව ආලෝකයෙන් මැව්වේය. ඔවුන්ගේ සංඛ්‍යාව අල්ලාහ් හැර අන් කිසිවෙකු නොදනියි. ඔවුන් හට විවිධ කාර්යයන් පවරා තිබේ. ඔවුන් නිතර අල්ලාහ්ගේ අණට කීකරුව ක්‍රියා කරති. අල්ලාහ්ගේ මැවුම් අතරින් ෂෛතාන් හා ජින්වරුන්ද වේ.

**- අල්කුර්ආන් -**

පෙර සිටම අල්ලාහ් විසින් ආගම් රැසක් පහළ කරන ලද්දේ මිනිසාව ඍජු මාර්ගයට යෙදවීම සඳහාය. අල්කුර්ආන් අල්ලාහ්ගේ කලාමයයි. අවසන් ආගම වන අල්කුර්ආන් පහළ වීමත් සමඟ පූර්ව ආගම් අවලංගු වුණි. අල්කුර්ආනය සදා ආරක්ෂා සහිත බව අල්ලාහ් විසින් සහතික කර තිබේ.

**- රිසාලත් -**

ජන සමාජයට යහමග පෙන්වීම සඳහා යුගයෙන් යුගයට රසූල්වරුන් සහ නබිවරුන් පහළ කරනු ලැබුණි. මුඃජිසාත් නැමති ප්‍රාතිහාර්ය ද ලබා සිටියෙහුය. මොවුන් මගින් ජනයාට යහපත පනවා අයහපත වළක්වනු ලැබීය. මොවුහු ඉස්මත් හෙවත් පාපී ක්‍රියාවන්ගෙන් ආරක්ෂා වීම යන ගුණාංගය ලැබ සිටියහ. මෙම සියළු නබිවරුන්වම විශ්වාස කිරීම යුතුකමකි. මුහම්මද් (සල්) තුමා අවසන් නබිවරයා වශයෙන් විශ්වාස කර කටයුතු කළ යුතු අතර එතුමාණන්ගේ පැමිණීමත් සමඟ නුබුව්වත් සම්පූර්ණ වූ බවද අනතුරුව කිසිඳු නබිවරයෙකු නොපැමිණෙන බවද විශ්වාස කළ යුතුයි.

**- කියාමා -**

මරණයෙන් මතු පරමාත්ථ ජීවිතයක් ඇත. එය අරඹන්නේ සොහොන් ගැබ (කබුර්) ජීවිතයේ සිටය. එහි ප්‍රශ්න කිරීම සැබෑය. පරමාත්ථ දිනයේ විනිශ්චය සිදුවේ. සිරාත්, මීසාzන්, ස්වර්ගය, නිරය සත්‍යය. ඒවා ස්ථාවරය. ඒවා මවනු ලැබ ඇත.

**- සහාබාවරු -**

නබි (සල්) තුමාගේ හිත මිතුරන් මෙසේ හැඳින්වේ. මොවුන් අතරින් ස්වර්ගය සඳහා ආශිර්වාද ලද්දන්ද සිටිති. 'අහ්ලුල් බයිත්' හෙවත් නබිතුමාගේ පවුලේ අය කෙරෙහිද, 'උම්මහාතුල් මුඃමිනීන්' හෙවත් විශ්වාසවන්තයින්ගේ මෑණිවරු යන්නෙන් හැඳින්වෙන, එතුමාගේ මහේසිකාවන් කෙරෙහිද ගෞරවාදරය පිදීම අනිවාර්ය කරුණකි.

**- පාපී ක්‍රියාවන් -**

පාපී ක්‍රියාවල නියැලෙන මුස්ලිම්වරයා අල්ලාහ්ගේ අභිමත පරිදි කමාව ලබා ස්වර්ගයට ඇතුළු වේ. නැතහොත් දඬුවමට ලක්වී පසුව ස්වර්ගයට පිවිසෙයි.

**- වලීවරු -**

මොවුහු දේව බැතිමතුන්ය. අල්ලාහ්ගේ ස්නේහයට පාත්‍ර වූවන්ය. 'කරාමත්' හෙවත් හාස්කම ලද්දන් වේ. උසස් ආධ්‍යාත්මිකත්වයට පත් වුවද මූලික වතාවත්වලින් නිදහස් වූවන් නොවේ.

## 3. අත් තෞහීද්

- තෞහීද් යන පදය 'වහාද්' යන ක්‍රියා පදයෙන් විකසන වී ඇත. 'වාහිද්' යනු ඒකයෙකු යන අදහස දෙයි.
- ඉස්ලාමීය ව්‍යවහාරයෙන් එකම දෙවියා අල්ලාහ් ලෙස පිළිගෙන ඔහුට අවනතව ක්‍රියා කිරීම තෞහීද් යනුවෙන් හැඳින්වේ.

- පහත සඳහන් ආකාරයෙන් තෞහීද් යන පදය විස්තර කළ හැකිය.

1. සියල්ලෙහි මැවුම්කරුවා අල්ලාහ්මය. සියල්ලටම හිමිකරුවාද ඔහුමය. සියළුම පහසුකම් සපයා මෙම විශ්වය පාලනය කරන්නේද ඔහුමය.
2. අපි නැමදිය යුත්තේද අල්ලාහ් පමණි.
3. අල්ලාහ් සර්ව සම්පූර්ණවන්තයාය. කිසිඳු අඩුපාඩුවක් නොමැත්තාය.
4. ඉස්ලාමීය දැක්ම අනුව තෞහීද් ඉතා වැදගත් අංගයකි.

**පහත සඳහන් සාධක මගින් එය ස්ථිර කෙරෙයි.**

1. දේව ධර්ම දූතයන් සියල්ලෝම තෞහීද් පිළිගෙන ජනතාවද එය හට කැඳවීම් කළ බව කුර්ආන් ප්‍රකාශ කරයි.
2. තෞහීද් පිළිබඳ අනුශාසනා ගැබ් වූ තනි සූරාවන් හා වැකි බොහොමයක් කුර්ආනයේ අන්තර්ගත වී ඇත.
3. යහ ක්‍රියාවන් පිළිගැනීමට තෞහීද් කොන්දේසියක් වේ.
4. තෞහීද් පිළිනොගන්නන්ට ස්වර්ගය තහනම් වේ.

## 4. ඊමානයට හානි පමුණුවන කරුණු

1. ඉල්හාද් - අදේව වාදය
2. කුෆ්ර් - ප්‍රතික්ෂේප කිරීම.

**මාර්ග තුනකින් කුෆ්ර් සිදුවිය හැකිය.**

1. විශ්වාස සම්බන්ධ කුෆ්ර්
2. වචනය හා සම්බන්ධ කුෆ්ර්
3. ක්‍රියා හා සම්බන්ධ කුෆ්ර්

3. ෂිර්ක් - ආදේශ කිරීම, සමාන කිරීම.

**මෙය වර්ග දෙකකි.**

1. ෂිර්කුල් අක්බර් - මහා ෂිර්ක්
2. ෂිර්කුල් අස්ගර් - සුළු ෂිර්ක්

4. රිද්දත්

   ඉස්ලාමීය ව්‍යවහාරයෙන් මුස්ලිම්වරයෙකු කුෆ්ර් ඇති කරවන වදනක් පැවසීමෙන් හෝ ක්‍රියාවක් කිරීමෙන් ඉස්ලාමය හැර ඉවත් වී යාම රිද්දත් යනුවෙන් හැඳින්වේ. රිද්දත් ක්‍රියාවක නිරතවන්නා 'මුර්තද්' යනුවෙන් හැඳින්වේ.

## 5. අවසාන නබිත්වය

- ලෝ වැසියන් හට යහමඟ පෙන්වීම සඳහා අල්ලාහ් කාලයෙන් කාලයට එවන ලද නබිවරු හා රසූල්වරු විශ්වාස කිරීම ඊමානයේ ඉතා වැදගත් කරුණකි.
- එම නබිවරුන් අතරින් මුහම්මද් (සල්) තුමා අවසාන දූතයා යන්නත් එතුමාගෙන් පසුව තවත් නබිවරු නොපැමිණෙන බවත් ඉස්ලාමීය දැක්ම වේ.
- අවසාන නබිත්වය සනාථ කරන කුර්ආන් වැකි, හදීස් බොහොමයක් ඇත.

- **සමහර ව්‍යාජ නබිවරුන්ගේ නම් :-**

1. අස්වදුල් අන්සි - යෙමන් ප්‍රදේශයට අයත් මොහු ෆෛරූස් තෛලමි නම් සහාභිවරයා විසින් ඝාතනය කරන ලදී.
2. මුසෛලමා - නජ්ද් ප්‍රදේශයට අයත් මොහු, යමාමා සටනේදී වහ්ෂී බින් හර්බ් විසින් ඝාතනය කරනු ලැබීය.
3. සජාහ් - කාන්තාවක් වූ ඇය, ඇයගේ සැමියා මුසෛලමාගේ මරණයෙන් පසු ඉස්ලාමය වැළඳගත්තාය.
4. තුලෛහා - ඉස්ලාමය වැළඳගත් මොහු නහර්වාන් සටනේදී ෂහීද් වූවේය.

## 6. අල් කළා වල් කාදර්

- කද්ර් හි තේරුම ස්ථිර නිගමනය, පෙර මිනුම යනාදීන්ය.
- ඉස්ලාමීය අකීදාවෙහි මෙම පද දෙක අල්ලාහ්ගේ ඥානය (ඉල්ම්), හැකියාවන් (කුද්රතුන්), අභිමත (ඉරාදත්) හා සම්බන්ධ වේ. අකීදා ක්ෂේත්‍රයේ විද්වතුන් කලා කද්ර් ඉලාහියියාත් යන අංශයට ඇතුළත් කර ඇත. එම දෙක විශ්වාසය හා බැදෙන බැවින් වහී පදනම තුළින් විශ්වාස කළ යුතුයි.
- ඉස්ලාමීය ඉතිහාසයේ ජබරියියා, කද්රියියා, මුඃතසිලා, මුර්ජියා යන චින්තන කණ්ඩායම් බුද්ධිය පදනම් කර ගනිමින් ඊමානය හා සම්බන්ධ කරුණු අධ්‍යයනය කළ බැවින් නොමග ගියෙහුය.
- කළා කද්ර් පිළිබඳ තාර්කිකයන් තුළ විවිධ අදහස් පැවතුණි.

❖ මිනිසාගේ කැමැත්තට ප්‍රමුඛත්වය දී කළා කද්ර් විස්තර කරන්නන්.
මොවුහු මිනිස් ජීවිතයේ ඇති වන ජය පරාජයට මිනිසුන්ගේ ක්‍රියාම හේතුවන බව විශ්වාස කරන්නෝ වෙති.

❖ මිනිසාගේ කැමැත්ත ප්‍රතික්ෂේප කර, කළා කද්ර් විස්තර කරන්නන්.
මොවුහු මිනිසා විසින් කරනු ලබන හොඳ නරක සියල්ලට හේතු වන්නේ අල්ලාහ් බව පෙන්නුම් කරති.

- අල්කුර්ආන් හා හදීස් අනුව කළා කද්ර් පිළිබඳ මූලික කරුණු දෙකක් පෙන්නුම් කරයි.

1. සියල්ල අල්ලාහ්ගේ කැමැත්ත පරිදි සිදු වේ.
2. මිනිසාට ක්‍රියා නිදහස ලබා දී ඇති බැවින් ඔහුගේ සියළුම ක්‍රියාවන්ට ඔහුම වගකිව යුතුයි.

## 7. සැකාත්

- ඉස්ලාමීය පස් මහ වගකීම් අතරින් සකාත් ඉතා වැදගත් ස්ථානයක් දරයි.
- අල්කුර්ආන් හා හදීස් සකාතයේ මහිමය හා වැදගත්කම ඉතා පැහැදිලිව විස්තර කර ඇත.

**සකාත්හි යහඵල බොහොමයක් ඇත. ඒවායින් සමහරක් :-**

1. සකාත් ගෙවන්නාගේ සිත පිරිසිදු වේ. ඔහු තෘෂ්ණාවෙන් මිදෙයි.
2. දුගීන්ගේ සිත් පිරිසිදු වී සතුට ඇති කරයි. ඔවුහු ධනවතුන්ට ප්‍රාර්ථනා කරයි.
3. දෙවිඳුන්ට තුති පුදන මානසික මට්ටම සකාත් දියුණු කරයි.
4. සමාජය තුළ අන්‍යෝන්‍ය සෙනෙහස, සාමූහික වගකීම, එකමුතු බව වර්ධනය වේ.
5. සමාජය තුළ ආර්ථික සමබරතාවය තරමකට රැක ගැනීම.

❖ **සකාත් සාමූහිකව ඉටු කිරීමෙන් අත්වන ප්‍රයෝජන :-**

- ධනවතුන් කිසිවෙකුටත් සකාත් වගකීමෙන් මිදී නොසිටීමට මඟ පාදයි.
- දුගීන්ගේ ආත්ම ගෞරවය රැකෙයි.
- දුගීබව නැති කිරීමට විශාල වැඩසටහන් ක්‍රමවත්ව සැලසුම් කිරීමට හැකිවීම.
- සකාත් පිළිබඳව සැලකිය යුතු සියල්ලන්ගේම අවධානයට යොමු කර ගත හැකි වීම.
- සමාජ යහපත රකින සේවාවන්වල අවධානය යොමු කරවා ගත හැකිය.

❖ **සකාත් අනිවාර්ය වීම සඳහා වූ කොන්දේසි :**

1. මුස්ලිම්වරයෙකු වීම.
2. ස්වාධීන පුද්ගලයෙකු වීම.
3. වස්තුවේ හිමිකරු වීම. (කුඩා දරුවෙකුගේ හෝ සිහිවිකල් වූවෙකුගේ වස්තුවලට භාරව සිටින්නා අදාළ සකාත් ගෙවිය යුතුයි.)
4. නිසාබ් තත්ත්වයට පත්ව තිබීම.
5. වසරක් සම්පූර්ණව තිබීම.

❖ **සකාතයේ ෆර්ළු දෙකකි.**

1. (නියියත්) අදිටන් කිරීම.
2. සුදුස්සන්ට ලබා දීම.

❖ **සකාත් අනිවාර්ය වන භාණ්ඩ හා එහි නිසාබ්**

**1. පශු සම්පත් :-**

**- එළුවන්**

40 ට වසර දෙකක් වයසැති එළු දෙනක්.

121 ට වසර දෙකක් වයසැති එළු දෙනුන් 2 ක්.

201 ට වසර දෙකක් වයසැති එළු දෙනුන් 3 ක්.

400 ට වසර දෙකක් වයසැති එළු දෙනුන් 4 ක්.

**- ගවයන්**

30 කට වසරක් වයසැති 1 ගව නාම්බෙක්.

40 කට වසර දෙකක් වයසැති 1 එළදෙනෙක්.

**- ඔටුවන්**

ඔටුවන් 5 දෙනෙකුට එක එළුවෙක් බැගින් 20 කට එළුවන් 4 දෙනෙකු වේ.

ඔටුවන් 25 ක් වූ විට වසරක් වයසැති ඔටු දෙනක්.

**2. ධාන්‍ය :-**

- වසරක් ඇතුලත අස්වැන්න කීපවරක් නෙළන්නේ නම්, සෑම වරක් පාසාම සකාත් ගෙවිය යුතුයි.
- වෙනස් ධාන්‍ය වර්ග දෙකක් එක්කර නිසාබය ගණන් කළ නොහැකිය. (උදා: ඉරිඟු + වී)
- එකම ධාන්‍ය වර්ගයෙහි විවිධ වර්ග එක්කර නිසාබ් ගණනය කරනු ලැබේ. (උදා: නාඩුහාල් + සම්බා)

  -නිසාබ් වසක් 5 කි. = 689.5 කිලෝග්‍රෑම්

**3. පලතුරු වර්ග**

රටඉඳි, මිදි, ධාන්‍ය වර්ගයේ නිසාබ් හා නීති රීති මෙයටත් අදාළ වේ.

**4. රන්, රිදී**

රන් නිසාබ් මිස්කාල් 20 = ග්‍රෑම් 85 = පවුම් 10 $^{1}/_{2}$

රිදී නිසාබ් දිර්හම් 200 = ග්‍රෑම් 595

- එකම වර්ගයේ සියළුම ආභරණ එක්කර ගණනය කළ යුතුයි.
- පරිහරණය කරන රත්‍රන්වලට සකාත් අනිවාර්ය නොවේ.
- වෙනත් ලෝහ වර්ග මිශ්‍ර වී ඇත්නම් එය ඉවත් කර ගණනය කළ යුතුයි.

**5. මුදල්**

රන්වල නිසාබ් මුදල්වලටද අදාළ වේ.

**6. වෙළඳ භාණ්ඩ**

❖ **සකාත් ලැබීමට සුදුස්සන් :-**

1. ෆකීර් - පරම දුගියා
2. මිස්කීන් - ප්‍රමාණවත් ආදායම් නොමැත්තා.
3. ආමිල් - සකාත් එක් රැස් කිරීම, බෙදාහැරීමේ කාර්යයෙහි නිරතවන්නා.
4. මුඅල්ලෆතුල් කුලුබ් - ඉස්ලාම් හා සිත් බැඳුණු අය.
5. අර්රිකාබ් - වහල්භාවයෙන් මිදීමට බලාපොරොත්තුවන්නා.
6. ගාරිමූන් - ණයගැතියන්.
7. ෆීසබීලිල්ලාහ් - අල්ලාහ්ගේ මාර්ගයේ නියැලෙන්නා.
8. ඉබ්නු සබිල් - අනුමත ගමනක යෙදෙන මගියා.

❖ **සකාත් ලැබීමට නුසුදුස්සන්**

1. ධනවතුන්
2. නබිතුමාගේ පවුලේ උදවියන්
3. මුස්ලිම් නොවන්නන්
4. සැකාත් ගෙවන්නාගෙන් යැපෙන්නන්

## 8. උපවාසයේ වැදගත්කම

- උපවාසයෙහි අරාබි පදය ''සවුම්''
- පස්මහ වගකීම් අතරින් එකකි.

**8. උපවාසයේ ප්‍රයෝජන**

- පරලොවෙහි අප යනුවෙන් කන්නලව් කිරීම.
- ස්වර්ගයට විශේෂ දොරටුවකින් ඇතුල්වීම.
- ආධ්‍යාත්මික දියුණුව
- අල්ලාහ්ගේ දායාද හඳුනාගැනීම.
- ශාරීරික නිරෝගීතාවය හිමිවීම.

## 9. හජ් සහ උම්රා

- ඉස්ලාම්හි පස්වෙනි වගකීම හජ් වේ.
- දුල් හිජ්ජා මසෙහි මක්කාවට ගොස් ඉටුකරන වතාවතයකි.
- **හජ් ඉටු කරන්නා**

- මුස්ලිම්වරයෙකු විය යුතුයි.
- පරිණත වූවෙකු විය යුතුයි.
- සිහි බුද්ධියෙන් යුතු වීම.
- නිදහස් පුද්ගලයෙකු විය යුතුයි.
- වත්කම් ඇත්තෙකු විය යුතුයි.
- ශරීර ශක්තිය තිබිය යුතුයි.
- හජ් ඉටුකිරීමට තරම් කාලසීමාව තිබිය යුතුයි.

- **හජ් හි අර්කාන් (ෆර්ළ්)**

❖ නියියත් තැබීම, ඉහ්රාහ් පැළඳීම.

❖ දුල් හජ් 9 දින අරෆා පිටියෙහි රැඳීම.

❖ තවාෆුල් ඉෆාලා ඉටුකිරීම.

❖ සඊ ඉටුකිරීම.

❖ හිස කෙස් ඉවත් කිරීම.

❖ අනුපිළිවෙලට ඉටු කිරීම.

- ඉස්ලාම්හි අනෙකුත් වගකීම්වල ෆර්ළ් තිබුණද හජ්හි ෆර්ළ් (අර්කාන්) වාජිබ් වෙන වෙනම ඇත. ෆර්ළ් මඟ හැරුණු කල හජ් ඉටුනොවේ. නමුත් වාජිබයක් මඟ හැරුණු විට ''ෆිද්යා'' දීමෙන් පිළියම් යෙදිය හැකිය. එනම් අවුරුද්දක් වයසැති බැටළුවෙකු හෝ අවුරුදු දෙකක් වයසැති එළුවෙකු කුර්බාන් කිරීමයි. හරම්හි සිටින දුගීන් 6 දෙනෙකුට ආහාර ලබා දීම. දින තුනක් උපවාස කිරීම යනාදියෙන් එකක් කළ යුතුය.

- **හජ්හි වාජිබයන්**

1. නියමිත මීකාත්හි නිධියත් තැබීම. (ලාංකිකයන් සඳහා යලම්ලම්)
2. දුල්හජ් 10 වන රාත්‍රී මුස්දලිෆාහි රැඳීම.
3. අයියාමුත් තෂ්රීක් දිනයන්හි (11 - 12 - 13) මීනාවෙහි රැඳීම.
4. දුල් හජ් 10 වන දින ජම්රතුල් අකබාවෙහි ගල් විසි කිරීම.
5. අයියාමුත් තෂ්රීක් දිනයන්හි ජම්රත් උලා, ෂිම්රත් වුස්තා, ජම්රත් අකබා යන තුනෙහිම ගල් විසි කිරීම.
6. තවාෆුල් විදා ඉටුකිරීම.

- **හජ් උම්රාවෙහි සුන්නතයන්.**

1. හජ් සඳහා නියියත් තබා ඉහ්රාම් ඇඳීමට පෙරද, හජ් හි විවිධ වතාවත් ඉටුකිරීමටද පෙර දිය නෑම.
2. නියියතයට පෙර සුවඳ විලවුන් තැවරීම.
3. නියියතය මුවින් ප්‍රකාශ කිරීම.
4. තල්බියා ඉසිරීම.
5. මක්කාවට ඇතුල් වූ සැණින්ම තවාෆුල් කුදුම් ඉටුකිරීම.
6. දුල් හජ් 9 වෙනි දින රාත්‍රියේ මුස්දලිෆාහි රැඳීම.
7. නියමිත ස්ථානවලදී අදාළ දුආවන් ඉසිරීම.
8. සැම් සැම් ජලය වැඩි වැඩියෙන් පානය කිරීම.

- **හජ් උම්රාහි මුහර්රමාත් හෙවත් තහනම් කරන ලද කරුණු :-**

1. පුරුෂයින් මසන ලද ඇඳුම් ඇඳීම.
2. සුවඳ විලවුන් ගැල්වීම.
3. හිසකෙස්, රැවුල් වලට තෙල් ගැල්වීම.
4. සිරුරේ කෙස්, ලෝම නිය ආදිය කැපීම.
5. විවාහවීම හා විවාහ කර දීම.
6. ලිංගික ක්‍රියාකාරකම්වල නියැලීම.
7. පුරුෂයන් හිස ආවරණය කිරීම.
8. කාන්තාවන් මුහුණ වැසීම.
9. දඩයම් කිරීම.
10. හරම් සීමාව තුළ ගස්, පැළෑටි කැපීම.

❖ ඉහ්රාම් ඇඳීමෙන් පසු ඉහත කරුණුවලින් යමක් කලේ නම්, ෆිද්යා දිය යුතුය.

❖ බිරිඳ සමඟ ශාරීරිකව එක් වුවහොත් ඔටුවෙකුද, හජ්හි වාජිබ්වලින් එකක් හැරුණු විට එළුවෙකුද දිය යුතුයි. ප්‍රමාද නොවී කළා කිරීමද යුතුකමකි.

- **හජ් හා උම්රා ආකාර තුනකින් ඉටු කළ හැකිය.**
  **(අදිටන් කරනා ක්‍රමයන්)**
  1. ඉෆ්රාද් :- හජ් සඳහා පමණක් නියියත් කිරීම.
  2. කිරාන් :- හජ් හා උම්රා සඳහා එකට නියියත් තැබීම.
  3. තමත්තු :- හජ් හා උම්රා සඳහා වෙන වෙනම නියියත් තැබීම.

- **උම්රා ඉටුකරන ආකාරය :-**
  - නියමිත ස්ථානයේ ඉහ්රාම් පැළඳීම.
  - ඉහ්රාමයට පෙර නිය කපා, ලෝම ඉවත් කර, දිය නා, සුවඳ විලවුන් ගල්වා සිටිය යුතුයි.
  - රකඅත් දෙකක් සුන්නත් ඉටු කිරීම.
  - පිරිමින් නොමසන ලද සුදු ඇඳුම් ඇඳිය යුතුයි. ස්ත්‍රීන් ඉස්ලාම් අනුමත කළ ඇඳුමක් ඇඳිය යුතුයි.
  - කෑබාවේ හජ්ර් අස්වද් ගල අසළ හෝ එයට කෙළින් සිටගෙන එය 7 වතාවක් වම් වට යාම. (තවාෆ් යනුවෙන් හැඳින්වේ.)
  - පසුව ''මකාම් ඉබ්රාහීම්'' අසළ සුන්නත් රකඅත් 2 ක් ඉටු කිරීම.
  - සම් සම් ජලය පානය කර 'සෆා' + 'මර්වා' කඳු දෙක අතර සැහැල්ලු දිවීම. මෙය 'සෑයු'යනුවෙන් හැඳින්වේ. මෙහිදී, තක්බීර්, තස්බීහ්, තහ්මීද්, තහ්ලීල් ඉසිරිය හැකිය.
  - හිසකෙස් කපා උම්රාව නිම කිරීම.

- **හජ් ඉටු කරන ආකාරය :-**

1. ඉහ්රාම් පැළඳගෙන පැමිණීම.
2. සෆා මර්වා අතර සැහැල්ලු දිවීම.
3. දුල් හජ් 8 - මිනාවට යාම.
4. දුල් හජ් 9 - අරෆා පිටියෙහි රැඳීම.
5. මුස්දලිෆාහි රැය ගත කිරීම.
6. 10 වෙනිදා ජම්රා අකබාවෙහි ගල් විසි කිරීම.
7. තවාෆ් ඉෆාළා.
8. මිනාවට ගොස් ජම්රා තුනෙහිම ගල් ගැසීම.
9. තවාෆුල් විදාඃ - සමුගැනීමේ තවාෆ්

## 10. ඉස්ලාමීය සිද්ධස්ථාන

**1. කඃබතුල්ලාහ් - ලොවෙහි ප්‍රථමයෙන්ම ඉදි කරන ලද දේවස්ථානය.**

- ❖ මුලින්ම කඃබාව ඉදි කළේ ආදම් (අලෛ). ඊට පෙර මලාඉකාවරු ඉදි කළ බවද විශ්වාසයක් පවතී.
- ❖ නූහ් (අලෛ) තුමාගේ කාලයේ සිදු වූ ජලගැල්මෙන් පසු ඉබ්රාහීම් (අලෛ) තම පුත් ඉස්මාඊල් සමඟ නැවත එය ගොඩනගන ලදී.
- ❖ කඃබාවට මුහුණ ලා සලාත් ඉටුකළ යුතු බව මුහම්මද් (සල්) තුමාගේ පැතුමකි.
- ❖ හිජ්රි 8 හි මක්කා ජයග්‍රහණයෙන් පසුව ප්‍රතිමාවන් ඉවත් කර, ඒකදේව නැමදුම එහි ස්ථාපිත කරන ලදී.

**2. මස්ජිදුල් අක්සා :-**

- ❖ මස්ජිදුල් අක්සා පලස්තීනයේ පිහිටා ඇත.
- ❖ මුලින්ම ආදම් (අලෛ) තුමා විසින් ඉදි කරන ලදී. පසුව ඉබ්රාහීම් (අලෛ) විසින් ප්‍රතිසංස්කරණය කරනුලදී.
- ❖ ක්‍රි.ව. 620 දී මුහම්මද් (සල්) ගේ මිඃරාජ් ගමන සිදුවිය. මෙම ගමනෙහි පළවෙනි අදියර, මස්ජිදුල් හරාම් සිට මස්ජිදුල් අක්සාවට ගිය ''ඉස්රා'' නම් මැදියම් රෑ ගමනයයි. පූර්ව නබිවරුන්ම නායකත්වය දරමින් සලාතය මෙහෙය වීමෙන් අනතුරුව මුහම්මද්තුමා අහස් කුසෙහි සිද්රතුල් මුන්තහාවෙහි අල්ලාහ් බැහැ දැක, පස් වේල් සලාතය තිළිණයක් වශයෙන් ලබාගත්හ. මෙම මස්ජිදුල් අක්සා මුස්ලිම්වරුන්ගේ ප්‍රථම කිබ්ලා විය.

**3. මස්ජිදුන් නබවි :-**

- ❖ ක්‍රි.ව. 622 සැප්තැම්බර් 27 හි මදීනාවට සංක්‍රමණය කළ නබිතුමා පසුව මස්ජිදුන් නබවි ඉදිකිරීමට කටයුතුකළහ.
- ❖ නබි (සල්) තුමාගේ කාලයේ මස්ජිදුන් නබවි සලාතය සඳහා වූ ස්ථානයක් ලෙස පමණක් නොව, අධ්‍යාපනික කේන්ද්‍රයක් ලෙසද, ජනතා ගැටළුවලට විසඳුම් ලබා දෙන උසාවියක් ලෙසද, රටේ ජනතා ව්‍යවහාරික කටයුතු පිළිබඳ සාකච්ඡා කරන පාර්ලිමේන්තුවක් ලෙසද, සකාත් හා විවිධ බදු එක් රැස් කර බෙදාහරින භාණ්ඩාගාරයක් ලෙසද, යුද පුහුණුව ලබන කඳවුරක් ලෙසද, ආගන්තුක සත්කාර මණ්ඩපයක් ලෙසද, තව විවිධ කටයුතු සඳහා වූ මධ්‍යස්ථාන ලෙසද ක්‍රියාත්මක වුණි.

- ❖ නබිතුමා වදාළ සේක ''මස්ජිදුල් හරම්හි ඉටු කරනු ලබන සලාතයක් සලාත් ලක්ෂයකටද, මාගේ මෙම මස්ජිදයේ ඉටු කරන සලාතයක් සලාත් දාහකටද, මස්ජිදුල් අක්සාවෙහි ඉටු කරන සලාතය සලාත් පන්සීයකටත් සමාන වේ.'' (බුහාරි)

## 11. යහගුණ පිළිබඳ ඉස්ලාමීය දැක්ම

- මෙම අරුත දෙන අරාබි පදයන් 'ආදාබ්', 'අඛ්ලාක්', 'සුලුක්' යනාදියයි.

**යහගුණාංගයන්හි වැදගත්කම :-**

- ඉස්ලාමීය දැක්ම අනුව යහගුණාංගයන්ගෙන් යුතුව ජීවත්වීම ඉබාදතයකි. පහත සඳහන් හදීසය එයුතහවුරු කරයි.
- ''පරමාන්ථ දිනයෙහි මූඃමින්වරයෙකුගේ තරාදිය යහගුණවලට වඩා බරින් වැඩිවෙන යමක් නොතිබෙනුඇත. අල්ලාහ් රළුව හා අසභ්‍ය ලෙස කතා කරන පුද්ගලයා අප්‍රිය කරයි. යහගුණාංගයන්ගෙන් යුතුපුද්ගලයන් සලාත් සෞම් වැනි ඉබාදතයන්හි නිරත වීම මගින් උසස් තරාතිරමට පත් වෙති. එසේනොමැතිව දුර්ගුණාංගයන්ගෙන් යුත්තන් නිරයේ වේදනාවට ලක්වෙති.'' යනුවෙන් නබිතුමා වදාළ සේක.(අහ්මද්)

**ඉස්ලාම් දක්වන සමහර යහගුණාංග :-**

- ඉවසීම
- වීරත්වය (ධෛර්යය)
- කීකරුකම
- සමාව දීම.

## 12. ඉස්ලාමීය ආචාරධර්ම සංවර්ධනය

- අරාබි බසින් මිනිසාගේ බාහිර පෙනුම ''හල්ක්'' යනුවෙන්ද, ඔහුගේ චරිතය ''හුලුක්'' යනුවෙන්ද පැවසෙනුලැබේ.

**13. සමහර ඉස්ලාමීය ආචාරධර්මයන් :-**

- ගරු කළ යුතු ක්‍රියා අගය කිරීම.
- අසභ්‍ය වූ කරුණුවලින් වැළකී සිටීම.
- ශිෂ්ටසම්පන්න නොවන දෙයින් වැළකී සිටීම.

**14. යහපත් ආචාරධර්ම වර්ධනය කරන්නේ කෙසේද?**

- **සලාත් :-** ප්‍රාණවත්ව සලාතය ඉටුකරන්නා දේව භක්තියද, අල්ලාහ්ගේ සමීපතාවයද හිමි කර ගනියි.
- **සකාත් :-** මෙය ඉටුකරන්නෙකු තුළ දිළින්දන් කෙරෙහි ආදරය, කරුණාව ඇති වී, ඔවුන් හට උදව් කළ යුතුයි යන පරෝපකාරී හැඟීම් ඇති වනවා සමඟම මසුරුකමද ඔහුගෙන් තුරන් වෙයි.
- **සෞම් :-** උපවාසය රැකීම මගින් සිත් තුළ මතුවන නරක හැඟීම් පාලනය වී දේව භක්තිය, ඉවසීම, පරිත්‍යාගය යනාදී උසස් ගුණාංගයන් වර්ධනය වීමට පුහුණුව ලැබේ.
- **හජ් :-** මෙය අල්ලාහ් උදෙසා කෙරෙන පරිත්‍යාගශීලී කැපකිරීමකි. මෙමගින් ඓතිහාසික සිදුවීමක් අවබෝධ කර ගන්නා අතර, අල්ලාහ් වෙනුවෙන් කැපවීමට පුරුදු පුහුණුවද ලබා දෙයි. එමෙන්ම ලෝ සතර දිශාවෙන්එක්රොක්වන්නා විවිධ ජන කොටස් අතර සහෝදරත්වය, සමඟිය, සමානාත්මතාව, ඉවසිලිවන්ත බව,හඳුනාගැනීම යනාදී ගුණාංගයන් වර්ධනය වෙයි.

## 13. ආධ්‍යාත්මික අභිවෘද්ධිය සඳහා වූ ක්‍රියාමාර්ග

''මිනිස් ශරීරයේ එක් මාංශ කැබැල්ලක් ඇත. එය යහපත් වුවහොත්, මුළු ශරීරයම යහපත් වේ...'' නබි වදනකි, (බුහාරි)

**14. අස්සබ්ර් :-**

- අස්සබ්ර් යන පදයෙහි තේරුම ''ඉවසීම''
- මෙම ගුණය නරක ගුණාංගයන් පාලනය කරයි.
- යහ ගැත්තන් විවිධාකාරවලින් පරීක්ෂණවලට ලක්වෙති. ඉවසිලිවන්තයින් පමණක් එයින් ජය අත්කර ගනිති.

**15. අත්තවක්කුල් :-**

- මෙම පදයේ අර්ථය වගකීම් පැවරීම යන්නය. මෙය උත්සාහය සහ අල්ලාහ් කෙරෙහි ඇති විශ්වාසය යනු දෙකෙහි සංයුතිය වේ.
- ඒ අයුරින් ඉස්ලාමයට අනුව අපගේ උත්සාහයේ අවසාන ප්‍රතිඵල ලබා දීම අල්ලාහ් වෙත භාර කිරීම තවක්කුල් නම් වේ.
- **මුඃමින්වරයෙකු හේතූන් දෙකක් මත අල්ලාහ් හට තවක්කුල් කරයි.**

❖ සබබ් (හේතුව) ද අල්ලාහ්ගේ සැලැස්මකි. අල්ලාහ්ගේ කැමැත්ත නොමැතිව සබබ් නිසා පමණක් ජය ලබා ගත නොහැකිය.

❖ මෙලොව පරලොව දෙකෙහිම ඒ ඒ කටයුතුවලට අනුව ඵලය ලබා දෙන්නේ අල්ලාහ් යනුවෙන් විශ්වාස කිරීම.

**3. අල් මඃරිෆා**

- මඃරිෆා යන පදාර්ථය 'දැනුම' වේ.
- ඉස්ලාමීය ආධ්‍යාත්මික සංකේතයෙහි ආරක්ෂිතයා වූ අල්ලාහ් ඇසෙන් දකින මෙන් දැකීම සහ එමගින් සැනසීමෙන් චිත්ත ප්‍රීතියට පත්වීම මෙයින් අදහස් වන්නේය.
- මඃරිෆා යන පරම සංතුෂ්ටිය අත් කර ගත් අයකු අල්ලාහ් වෙනුවෙන් තමාට සිදුවන දුකද සතුටක් ලෙස දකින්නේය.
- ඔහු මුළුමනින්ම අල්ලාහ් මත රැඳී සිටින්නේය.

**4. අර්රිළා :-**

- රිළා යන වචනාර්ථය ගැලපීම යන්නයි.
- අල්ලාහ්ගේ සැලැස්ම අනුව සිදුවන්නා වූ සියළු තත්ත්වයන් පිළිගෙන තෘප්තියට පත්වීම 'රිළා' නම් වේ.
- මෙම තත්ත්වය ඊමාන්ධාරී මුස්ලිම්වරයෙකුගේ උසස් මානසිකත්වයකි.

\- ඉහත පවසන ලද ආධ්‍යාත්මික ගුණාංග සියල්ල එකට එක සම්බන්ධ වී, සිත පිරිසිදු කරයි. අනතුරුව ගැත්තාගේ සිත ''කල්බුන් සලීම්'' යන පිරිසිදු තත්ත්වයට පත් කරයි.

## 14. අල්කුර්ආන්

- අල්කුර්ආනය ඉස්ලාමීය නීති රීති සඳහා වූ ප්‍රධානතම නීති මූලාශ්‍රය වේ.
- අල්ලාහ් විසින් සම්පාදනය කරන ලද නීති රීති සියළු ජනයාටද, සියළු යුගවලටද පිළිපැදීමට සුදුසු තත්ත්වයකුපවතිනවා සේම, එහි නීති රීති හා ක්‍රියාපිළිවෙත් මුහම්මද් (සල්) තුමාගේ කාලයේ සිට ලෝකාවසානය දක්වාපිළිපැදීමට සුදුසු ලෙස පවතී.
- **'රිසාලත්' යනු කුමක්ද?**

- මිනිසාට කාලයටත්, පරිසරයටත් ගැලපෙන පරිදි සුදුසු නීති රීති හා මඟපෙන්වීම් අල්ලාහ් එවන ලද රසුල්වරුන් වන දූතයන් මගින් පිරිනැමීම ''රිසාලත්'' යනුවෙන් හැඳින්වේ.

❖ **අල්කුර්ආනය නීති මූලාශ්‍රයක් වශයෙන් දෙයාකාරයකින් ක්‍රියා කරයි.**

- නීති - තීන්දුව සෘජුවම ලබා දීම.
- තීන්දුව උදෙසා පදනම ලබා දී එමඟින් තීන්දුව සොයා ගැනීමට අවස්ථාව සැලැස්වීම. මෙය ඉජ්තිහාදයට මඟ පෙන්වයි.

❖ සාමාන්‍යයෙන් සෑම කාලවකවානුවකම ජනයා කුමන ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධ යැයි සැලකුවේද, එයට ආවේණිකව ඒ ඒ කාල නබිවරුන්ගේ ප්‍රාතිහාර්ය හෙළි කරනු ලැබිණි. හූනියම ප්‍රසිද්ධියක් ඉසිලූ කාලයකදී එය පරාජය කර අයුරින් මූසා (අලෛ) තම විශ්මිතයන් හෙළි දැක්වූවේය. වෛද්‍ය ක්ෂේත්‍රය ප්‍රසිද්ධ වූ යුගයකදී ඊසා (අලෛ) රෝගීන්ව ස්පර්ශ කිරීමෙන් සුව කලේය. අරාබි භාෂා නිපුණත්වය හිස් මුදුනින් ඉසිලූ යුගයක මුහම්මද් (සල්) තුමා අල්කුර්ආනය තම ප්‍රාතිහාර්ය ලෙස ගෙන හැර දැක්වූහ.

❖ ඉමාම් සමඛ්ෂරී සාහිත්‍ය දෘෂ්ටිය ඔස්සේ 'කෂ්ෂාෆ්' නම් විග්‍රහ ග්‍රන්ථය ලේඛන ගත කලේය.

❖ අල්කුර්ආනය, අල්ලාහ්ගේ මැවීම් පිළිබඳව අවධානය යොමු කර, පර්යේෂණ කරන ලෙස ආයාචනා කරයි. එබැවින් සාක්ෂි කිහිපයක් සොයා බැලූ මහාචාර්යවරයෙකු වූ ජේම්ස් ජීන්ස් වසර 50 ක කාලයක සිට විද්‍යාත්මක උපකරණ මගින්ද පර්යේෂණ මගින්ද දැන හැඳිනගත් කරුණු, මුහම්මද් තුමන්ට දැනුම් දුන්නේ කවුරුන්ද යැයි විමතියට පත්වූහ.

## 15. අස්සුන්නාහ්

- නබි (සල්) තුමාණන්ගේ වදන්, ක්‍රියා අනුමත කිරීම යන කරුණු තුනෙහි අන්තර්ගතය ''සුන්නාහ්'' හෙවත් ''හදීස්'' නම් වේ. සුන්නාහ් වහි ගෙරු මත්ලුව් යනුවෙන් පවසනු ලැබේ.
- අල්කුර්ආනයේ ප්‍රකාශිත අදහස් නබි (සල්) ප්‍රායෝගිකව ඉටු කර පෙන්නුම් කළහ.
- හදීස් සංරක්ෂණය කිරීමෙහිලා ප්‍රයත්නය දැරූ කලීෆා උමර් බින් අබ්දුල් අසීස් (රහ්), ඉමාම් ෂිහාබුද්දීන් සුහ්රිතුමාට එය භාර කලේය. තාබිඊන්වරුන්ගේ යුගයෙන් පසුවද එම කටයුත්ත සිදු වූ බැවින් නිවැරදි හදීස් ග්‍රන්ථබිහිවුණි.
- **'සිහාහ් සිත්තා' හදීස් ග්‍රන්ථ සහ ඉමාම්වරු :-**

| හැඳින්වන නම | නම | පියාගේ නම | උපන් ගම | උපත | විපත | කෘතිය |
|---|---|---|---|---|---|---|
| 1. ඉමාම් බුහාරි | මුහම්මද් | ඉස්මාඊල් | බුහාරා | ක්‍රි.ව. 194 | 256 | සහීහ් අල්බුහාරි |
| 2. ඉමාම් මුස්ලිම් | මුස්ලිම් | හජ්ජාජ් | නයිසාබූර් | ක්‍රි.ව. 204 | 261 | සහීහ් මුස්ලිම් |
| 3. ඉමාම් අබුදාවුද් | සුලෙෙමාන් | අශ්අස් | සිජිස්තාන් | ක්‍රි.ව. 201 | 275 | සුනන් අබීදාවුද් |
| 4. ඉමාම් තිර්මිදි | මුහම්මද් | ඊසා | තිර්මිද් | ක්‍රි.ව. 209 | 279 | ජාමිඋත් තිර්මිදි |
| 5. ඉමාම් නසාර් | අහ්මද් | ෂුඅයිබ් | නසාර් | ක්‍රි.ව. 215 | 303 | සුනන් නසර් |
| 6. ඉමාම් ඉබ්නු මාජාඃ | මුහම්මද් | යසීද් | තස්වින් | ක්‍රි.ව. 209 | 273 | සුනන් ඉබ්නු මාජාහ් |

## 16. ඉජ්තිහාද්

- නව ගැටළුවක් මතු වී, එයට කුර්ආන්, සුන්නාහ් මගින් සෘජුව විසඳුම නොලද කල, කුර්ආන්, සුන්නාහ් පිළිබඳගැඹුරු දැනුම ඇති විද්වතුන් එම මූලාශ්‍ර දෙක පදනම් කර ගනිමින් විසඳුම් සෙවීමෙහිලා දරන 'වෑයම' හෝ'ප්‍රයත්නය' ඉජ්තිහාද් වේ.
- ''උලුල් අම්ර්'' (වගඋත්තරකරුවන්) ඉජ්තිහාද් ක්‍රියාවලියෙහි නිරතවීමට සුදුසු මුජ්තහිද්වරුන් වෙති.
- සමාජයක සුදුසු විද්වතුන් ඉජ්තිහාද් කිරීම යුතුකමකි.

## 17. ෆික්හ් කලාව

- ''කවරෙකුට අල්ලාහ් යහපත පතන්නේද, ඔහුට අල්ලාහ් ධර්ම අවබෝධය ලබා දෙන්නෙහුය.''
  (බුහාරි, මුස්ලිම්)
- ඉස්ලාමීය ඉතිහාසයේ ෆික්හ් කලාව ප්‍රථමයෙන්ම බිහි වූ කලාවයි.
- 'ෆික්හ්' යන පදයෙහි අරුතය ''පැහැදිලි කිරීම'' යන්නය.
- තබඋත් තාබිඊන්වරුන්ගේ යුගය, ෆික්හ් කලාවේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙයි.
- විවිධ කාලවල නව ගැටළුවලට ආගමික විසඳුම් විද්වතුන් විසින් ඉජ්තිහාද් පදනමින් ලබා දෙන ලදී. මෙමුතීන්දු, තීරණ පසු කාලවල ගොනු කොට ෆික්හ් නීති පද්ධති ලෙස ප්‍රකාශ විය.
- ඒවායේ පදනමින් මද්හබ් බිහිවීමට හේතු විය.
- ඉතිහාසයේ මද්හම් රැසක් ඇතිවුවද, ස්ථාවරව පැවතියේ මද්හබ් හතරකි.
- මෙම ඉමාම්වරුන්ගේ වෑයම නිසා මුකල්ලිද් වූ ජනතාවට ඉස්ලාමීය පදනමින් ජීවත්වීම පහසු වුණි.

❖ **ඉමාම් අබු හනීෆා (රහ්) හිජ්රි 80 - 150**

- උපත ලද්දේ කුෆාහිය.
- 'ඉමාමුල් අඃළම්' යන විරුදාවලියට පාත්‍ර වූහ.
- හම්මාද් බින් සුලෛම් යන විද්වතාගේ පන්තිවලට සහභාගී වූහ.
- හම්මද් විද්වතාගේ වියෝවයෙන් පසු එම පන්ති මෙතුමා විසින් පවත්වන ලදී.
- මෙතුමාගේ චින්තන විප්ලවය 'මද්රසතුර් රඃයු' ලෙස හැඳින්වේ.
- මෙතුමාගේ මද්හබය හනෆි මද්හබ් යනුවෙන් හැඳින්විය.

❖ **ඉමාම් මාලික් බින් අනස් (රහ්) - හිජ්රි 93 - 179**

- ඉමාම් තුමා උපත ලැබුවේ මදීනාවේ. ''ඉමාමුල් මදීනා'' යනුවෙන් හැඳින්වේ.
- මෙතුමාගේ ෆික්හි චින්තන ''මද්රසතුල් අසර්'' නම් විය.
- මෙතුමන්ගේ මද්හබය මාලිකී යැයි හැඳින්විණි.

❖ **ඉමාම් ෂාෆි (රහ්) - හිජ්රි 150 - 204**

- මෙතුමා උපත ලැබුවේ පලස්තීනයේ ගාසා නගරයෙහිය.
- කුරෛෂි වංශයට අයත් මෙතුමාණෝ ''ආලිමුල් කුරෛෂ්'' යන විරුදාවලියට පාත්‍ර විය.
- මුස්නද් ඉමාම් ෂාෆි, කිතාබ් අල් උම්මු, අර්රිසාලතුල් උසුලියියා යනාදී මෙතුමාගේ සුප්‍රසිද්ධ ග්‍රන්ථයන් වේ.

- මෙතුමාගේ චින්තන ක්‍රම මද්රසතුල් අසර්, මද්රසතුල් රඃයු යන අංශ දෙක අන්තර්ගත වූ බැවින් වඩා නම්‍යතාව සහිතය.
- මෙතුමා බග්දාදයේ ලබා දුන් විසඳුම් ''කදීම්'' යනුවෙන්ද, ඊජිප්තුවේ ලබා දුන් තීන්දු ''ජදීද්'' යනුවෙන්ද හැඳින්වේ.
- මෙතුමාගේ මද්හබය 'ෂාෆි මද්හබ්' වේ.

❖ **ඉමාම් හන්බලි (රහ්) - හිජ්රි 161 - 241**

- මෙතුමා  උපත ලද්දේ බග්දාද් නගරයේය.
- මුස්නද් අහ්මද් මෙතුමාගේ ප්‍රධාන කෘතිය වේ.
- මෙතුමාගේ මද්හබය හන්බලි මද්හබ් වේ.

## 18. අල්-කුලෆාඋර් රාෂිදූන්

- අබු බක්ර් (රලි)
  - මෙතුමා අබ්දුල්ලාහ් බින් අබී කුහාෆා.
  - ක්‍රි.ව 573 හි මක්කාවේ උපත ලැබූහ.
  - පිරිමින් අතරින් ඉස්ලාමය වැළඳගත් ප්‍රථම පුද්ගලයා වේ.
  - හිජ්රි 11 හි කලීෆා ධූරයට පත් වී වසර 2 ක් මාස 3 ක් පාලනය කළේය.
  - නබිතුමාගේ මිඃරාජ් ගමන සම්බන්ධව එසැණින්ම විශ්වාස කළේය.
  - එබැවින් 'සිද්දීක්' නම් විරුදාවලියට පාත්‍ර වූහ.

- **පෞරුෂ ලක්ෂණ**
  - හිජ්රත් අවස්ථාවේ නබි (සල්) ට, අබුබක්ර් (රලි) තුමා උපරිම සහාය දැක්වූහ.
  - තමන් ඉස්ලාමය වැළඳගත් දා සිට වෆාත් වන තෙක් තම මුළු කාලයම, තම මුළු ධනයම ඉස්ලාමය වෙනුවෙන් කැප කළහ.

- **කලීෆා ලෙස පත් කරනු ලැබූ ආකාරය :-**
  - සකීෆතු බනී සාඉදා නම් ස්ථානයේ මුහාජිර්වරු අන්සාරිවරු එක් වී ඒකමතිකව අබුබක්ර් (රලි) තුමාව කලීෆාවරයා වශයෙන් තෝරා පත් කර ගත්හ.
  - නබිතුමාගේ අවසාන මොහොතේ සලාතය මෙහෙය වීම සඳහා ඉමාම් වශයෙන් අබුබක්ර් (රලි) තුමාව නබිතුමා විසින් පත් කරනු ලැබීය.

- **සේවා හා දායකත්වය :-**
  - නබිතුමාගෙන් පසුව මෙතුමා යහපත් පාලනයක් පැවැත්වීය.
  - ව්‍යාජ නබිත්වයට එරෙහිව සාර්ථකව මුහුණ දුන්හ.
  - අල්කුර්ආනය ගොනු කර ග්‍රන්ථාරූඪ කළහ.
  - තමාගෙන් පසුව කලීෆා ධූරයට සුදුසු අයව පත් කළහ.
  - වසර 2 ක පාලනයෙන් පසු තමන්ගේ 63 වන වියෙහි වෆාත් වූහ.

## 19. කලීෆා උමර් (රලි)

- ''නියත වශයෙන්ම අල්ලාහ් විසින් උමර්ගේ සිතෙහි සහ දිවෙහි සත්‍ය ස්ථාපිත කර ඇත.'' (අල්හාකිම්)
- ඉස්ලාමීය රාජ්‍යයේ දෙවෙනි කලීෆාවරයා උමර් (රලි) වේ.
- මක්කාවේ සාමය උදා කිරීම සඳහා සුදුසු මාර්ගය නබිතුමාව මරා දැමීම බවට තීරණය කරන ලද අවස්ථාවේ එය ඉටු කිරීමට ඉදිරිපත් වූ උමර් හිදායත් ලබා ඉස්ලාමය වැළඳගත්තේය.

- **පෞරුෂ ලක්ෂණ**
  - උමර් ඉස්ලාමය වැළඳ ගැනීමත් සමඟ සියළුම කුරෛෂ් නායකවරුන්ම තමාගේ වෙනස්වීම දැනුවත් කළේය.
  - උමර් (රලි) තුමා දුන් උපදෙස් ස්ථිර කරමින් බොහෝ අවස්ථාවල වහී පහළ විය.
  - අබුබක්ර් (රලි) තුමා හට අල්කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමට උපදෙස් දී සහයෝගය දුන්හ.

- **කලීෆා වශයෙන් පත්වීම :-**
  - හිජ්රි 13 හිදී ජමාදුල් ආඛිර් 22 වෙනි දිනෙහි කිලාෆතය භාර ගත්හ.

- **සේවාව හා දායකත්වය :-**
  - නීති ක්ෂේත්‍රය ස්වාධීනව ක්‍රියා කරවීම.
  - රජයේ බදු අය කිරීමට නිලධාරීන් පත් කිරීම.
  - සංවිධානාත්මකව හමුදාව ගොඩනැගීම.
  - ඉස්ලාමීය දින දර්ශනය හඳුන්වාදීම.
  - අවුරුදු 10 $^{1}/_{2}$ ක පාලනයෙන් පසු හිජ්රි 23 දුල්හජ් 26 දී අබු ලුඃලුආ නම් පර්සියානු මජුසිවරයාගේ ප්‍රහාරයෙන් ෂහීද් වූහ.

## 20. කලීෆා උස්මාන් (රලි)

- උස්මාන් (රලි) කුරෛෂි ගෝත්‍රයේ ප්‍රධානතම කුලයක් වන උමෙයියා වංශයට අයත් අයෙකි.
- ක්‍රිව. 576 හි උපත ලැබීය.
- බුද්ධිමත්ය, සාක්ෂරතාව, සාහිත්‍ය ආදියෙහි විශේෂ දැනුමක් ඇත්තෙකු විය.
- ඉස්ලාමයට ප්‍රවේශ වූ ප්‍රථම දස දෙනා අතරින් එක් අයෙකු විය.
- අබුබක්ර් (රලි) තුමාගේ ආරාධනාව පරිදි ඉස්ලාමය වැළඳගත්හ.
- එවිට එතුමාගේ වයස අවුඃ 34 කි.

- **පෞරුෂ ලක්ෂණ**
  - නබිතුමාගේ සහාභාවරුන් අතරින් අබුබක්ර් (රලි), උමර් (රලි) යන දෙදෙනාගෙන් පසු උස්මාන් (රලි)වැදගත් ලෙස සලකන ලදී.
  - හිජ්රි 6 වන වසරෙහි උම්රා ගමනෙහිදී නබි (සල්) තුමාගේ සාම දූතයෙකු ලෙස යවනු ලැබීය.
  - නබිතුමා සමඟ එක් වී කටයුතු කළහ.
  - අබුබක්ර් (රලි) තුමාගේ පාලන සමයෙහි 'ෂූරා' සභාවේ ප්‍රධාන සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය.
  - උමර් (රලි) ගේ පාලන සමයෙහිද එතුමාට ඉතා සමීපව සිය සහය දැක්වූහ.

- **කලීෆා ධූරයට පත්වීම :-**
  - උමර් (රලි) තුමාගේ උපදෙස් අනුව, එතුමාගේ අභාවයෙන් පසු අෂරතුල් මුබෂ්ෂරා සය දෙනාගෙන් එක් අයෙකු වූ උස්මාන් (රලි) තුමාණන් තෝරා පත්විය.
  - ප්‍රථමයෙන්ම අබ්දුර් රහ්මාන් (රලි) බයිඅත් කළ පසු සෙසු සහාභාවරු බයිඅත් කළහ.

- **සේවාව හා දායකත්වය :-**
  - අල්කුර්ආනය ආරක්ෂා කිරීම.
  - නාවික හමුදාව පිහිටුවීම.
  - පාලන ව්‍යාපෘතිය
  - දේශපාලනමය දායකත්වය.
  - සංවර්ධන දායකත්වය.

## 21. කලීෆා අලි (රලි)

- නබිතුමාගේ පියාගේ සහෝදරයෙකු වන අබුතාලිබ්ගේ පුතා අලි.
- නබි (සල්) ට නුබුව්වත් හිමිවන විට අලි (රලි) තුමා දස වියැති දරුවෙකි.
- ඉස්ලාමය වැළඳගත් ප්‍රථම කුඩා දරුවා මොහු වේ.
- කුරෛෂ්වරු නබිතුමාව ඝාතනය කිරීමට තැත් කරන මොහොතේ, එතුමාගේ ස්ථානයේ යහන්ගත වුණේ අලි(රලි) තුමාය.
- මෙතුමාගේ එඩිතර බවට ''අසදුල්ලාහ්'' (අල්ලාහ්ගේ සිංහයා) යන ගරු නාමයෙන් නබිතුමා ඔහුව ඇමතුහ.

- **කිලාෆතය භාර ගැනීමේ අරමුණ :-**
  - දැනුම, අවබෝධයකින් තොර වූ නවක මුස්ලිම් පිරිසක් අතරින් අනතුරුදායක තත්ත්වයක කිලාෆතය භාර ගත් අලි (රලි) තුමා ඉස්ලාම් දහම ආරක්ෂා කර, ඉස්ලාමීය දේශය යථා තත්ත්වයට ගෙන ඒමට පියවර ගත්හ.
  - ජමල්, සිෆ්ෆීන් වැනි සටන්ද මෙම යුගයේ සිදු වුණි.

- **අලි (රලි) තුමාණන්ගේ සේවාවන් :-**
  - අබ්බක්ර් (රලි) ගේ සමයෙහි බෛතුල්මාල් භාරකරු විය.
  - උමර් (රලි) ගේ යුගයේ නීතිපති වශයෙන් කටයුතු කළහ.
  - සියළුම කලීෆාවරුන්ට ශ්‍රේෂ්ඨ උපදේශකයෙකු ලෙස සේවය කළහ.
  - ඉස්ලාමය වරදවා තේරුම් ගෙන කැරලි ගැසූ කවාරිජ්වරුන්ව පාලනය කළහ.
  - කුෆා නගරය සංවර්ධනය කළේය.
  - සිර මැදිරි නිර්මාණය කිරීම.
  - මහාචාර්ය අබුල් අස්වද් අද්දුඅලි ලවා කුර්ආන්හි පිල්ලම් යෙදවීම.
  - හිජ්රි 10 රමළාන් මසෙහි දී අබ්දුල් රහ්මාන් ඉබ්නු මුල්ජම් නම් කාරිජිවරයා විසින් ඝාතනය කරන ලදී.

## 22. ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය හා දායකත්වය

- **අරාබිය හා ශ්‍රී ලංකාව අතර වූ සම්බන්ධතා :-**
  - ඉස්ලාම් දහම ලොවට ව්‍යාප්ත වීමට පෙර සිටම අරාබීන් හා ශ්‍රී ලංකාව අතර සම්බන්ධකම් පැවතුණි.
  - මුහුදු ගමනාගමන කටයුතුවල නියැළුණු අරාබි ජාතිකයින් හට ශ්‍රී ලංකාව ප්‍රධාන කේන්ද්‍රයක් වුණි.
  - නබි (සල්) තුමා තම අවසන් කාල යුගයේ රටවල් රැසකට ඉස්ලාමීය පණිවුඩ යැවූහ. එතුමා විසින් යවන ලද ලිපි මෙයට සාක්ෂි දරයි.
  - වහබ් බින් අබී හෆ්සා නැමති නබි මිතුරා චීනයට ගිය බව ''තෝමස් ඕර්නල්ට්'' නැමැත්තා සඳහන් කළ බව හමීදුල්ලාහ් තම ''Foreign Relations of the Prophet Muhammed'' යන ග්‍රන්ථයේ සඳහන් කරයි.
  - ක්‍රිව. 628 දී වහබ් බින් අබී හෆ්සා නැමති නබි මිතුරාව, නබි (සල්) තුමා ශ්‍රී ලංකාවේ රජතුමා හමුවීමට එවූහ. මෙහි තම සේවාව දියත් කිරීමෙන් පසු ක්‍රිව. 632 දී තම මව් රට බලා පිටත් වූයේය. මෙම සාක්ෂි දෙකම නබිතුමාගේ කාලවකවානුව තුළම ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හැදින්විණි යන්නට ප්‍රමාණවත් සාධක වේ.
  - එවකට ශ්‍රී ලංකාවේ වෙසුණු අරාබිවරු ඉස්ලාම් පිළිබඳ නිවැරදි තොරතුරු දැනගැනීමේ අරමුණින් තමන් අතරින් දක්ෂයන් දෙදෙනෙකු තෝරා අරාබියට යැවූහ. නමුත් ඔවුන්ට නබිතුමා හෝ පළවෙනි කලීෆා හෝ හමුවීමට නොහැකි විය. දෙවෙනි කලීෆා උමර්ගෙන් ඉස්ලාම් පිළිබඳව දැනගත් ඔවුහු නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන විට, පාකිස්ථානයේ මක්රාන්හි එක් අයෙක් මියැදුණහ. අනෙක් තැනැත්තා මෙහි පැමිණ ඉස්ලාම් පිළිබඳ දැනුවත් කළේය.
  - ක්‍රි.ව. 8 වන සියවසෙහි උමෙයා කලීෆාවරුන් වූ අබ්දුල් මලික්, වලීද් යන්නන්ගේ පාලන සමයෙහි, ඉරාකයේ ආණ්ඩුකාරවරයා වූ හජ්ජාජ්ගේ හිරිහැරවලට බිය වී, බනු හාෂිම්වරු ශ්‍රී ලංකාවට පැමිණ, වෙරළ අවට පදිංචි වූහ.
  - ඉහත සිදුවීම් සියල්ල ශ්‍රී ලංකාවේ මුල් කාලයේම ඉස්ලාම් හැඳින්වීම තිබුණු බව නිරූපණය වේ. හිජ්රි 2 වන 3 වන සියවස්වල ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු ජීවත් වුණු බව අරාබි කාසි සනාථ කරයි.
  - ලාංකීය රජවරුන්ට හා ජනයාට අවශ්‍ය කරන පිටරට භාණ්ඩ ගෙනෙන ලද්දේ අරාබිවරුන් විසින් සේම, මෙහි වූ දේශීය නිෂ්පාදන භාණ්ඩ අන්තර්ජාතික වෙළඳපොළට ගෙන යන ලද්දේද ඔවුන් විසින්මය.

- **දේශීය යහපතට දැක් වූ දායකත්වය :-**
  1. මැණික් ගල්, ඇත් දළ, සුවඳ විලවුන් යනාදිය විදේශ රටවල්වලට ගෙන යාම.
  2. ''ආදම්'' ගේ පාද සලකුණු සහිත කන්ද පිහිටීම නැරඹීමට පැමිණෙන අරාබි යාත්‍රිකයන්ගේ චාරිකා මගින් මෙරට ප්‍රචලිත වීම.
  3. මෙරටේ භාණ්ඩ විදෙස් රටවල්වලට අපනයනය කර, විදේශ විනිමය උපයා ගැනීමට දායක වීම.
  4. මෙරටේ නිදහස උදෙසා අනෙකුත් ජාතීන් සමඟ එක්ව සටන් වැදුණු මුස්ලිම්වරුන්ගේ දායකත්වය.
  - ආරම්භයේ කොළඹ, බේරුවල, ගාල්ල, මාතර වැනි වෙරළබඩ නගරවල මුස්ලිම්වරු වෙසුණද, පසුව කුරුණෑගල, ගම්පොළ වැනි කඳුකර ප්‍රදේශවලද පදිංචි වී ඇත.

## 23. ශ්‍රී ලාංකික මුස්ලිම් නායකයින්

❖ **මුහම්මද් කාසිම් සිද්දි ලෙබ්බේ**

- මුල්ක් රහ්මතුල්ලාහ්ගේ පුතණුවන් වන මුහම්මද් ලෙබ්බේ නැමැත්තා ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලයේදී වෙළඳාම අරමුණු කරගෙන මහනුවර පදිංචි වී සිටියේය. ඔහුගේ පුතා සිද්දි ලෙබ්බේ වේ.
- මෙතුමාගේ පවුලේ සහෝදරයන් දෙදෙනෙකු සහ සහෝදරියන් තුන්දෙනෙකු විය. ඔවුන් පස්දෙනාම දැනුමෙන් පෝෂිත උගතුන්ය.
- 1862 වසරෙහි මහනුවර දිස්ත්‍රික්කයේ නීතීඥයෙකු ලෙසට පත් වූ සිද්දි ලෙබ්බේ, 1864 දී මහා අධිකරණ නීතිඥයෙකු ලෙසට උසස්වීම් ලැබුවේය. මහනුවර මහ නගර සභාවේ අධිකරණ විනිසුරුවරයෙකු ලෙසද සේවය කළේ 1894 සිට 1878 දක්වා වේ. පසුව 1884 - 87 දක්වා කොළඹ පදිංචි වුවද, නැවත මහනුවරෙහිම පදිංචි වී ජීවත් වූහ.
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි, අරාබි යන සිව් භාෂා නිපුණත්වය මෙතුමා සතු විය. 'සෙයියිදා උම්මා' යන කාන්තාව විවාහ කර ගත්තේය. මෙතුමාගේ වැඩවලට ඉතාමත් හොඳින් ඇය සහයෝගය දුන්නාය. දරුවන් නොමැති බැවින් ඔවුන් දෙදෙනා ''අබ්දුල් හමීද්'' නම් දරුවෙක්ව හදා වඩා ගත්හ.

❖ **එතුමාගේ සේවාවන් සමහරක් :-**

- කොළඹ සහිරා විදුහල ස්ථාපිත කිරීම.
- මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනික දියුණුව උදෙසා සංවිධානයක් බිහි කිරීම.
- ලාංකික මුස්ලිම්වරුන්ව දැනුවත් කිරීම උදෙසා ''මුස්ලිම් නේෂන්'', ''ඥානදීපය'' යන පුවත්පත, සඟරා නිකුත් කිරීම.
- ශ්‍රී ලාංකික මුස්ලිම් ප්‍රජාවට නීත්‍යානුකූල විවාහ ලියාපදිංචි වීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම.

## 24. ආචාර්ය තුවාන් බූර් හානුද්දීන් ජායා :-

- ආචාර්ය ජායා ශ්‍රී ලාංකික මුස්ලිම් ජනයාගේ අධ්‍යාපනික, දේශපාලනික ඉතිහාසයේ නොමැකෙන සටහන් තැබූ චරිතයක් ලෙස ප්‍රකටය.
- මෙතුමා මහනුවර ගලගෙදර ප්‍රදේශයේ 1890 දී උපත ලද්දේය. මෙතුමා පාසල් වියේ දක්ෂ ශිෂ්‍යයෙකු ලෙස නම් දරා සිටීමට විවිධ ක්ෂේත්‍රවල දැක් වූ හැකියාවන් හා ඒ සඳහා පිරිනමනු ලැබූ ත්‍යාග සාධක විය. ජේ.ඒ. මෙන්ඩිස් ගණිත ත්‍යාග, ආචාර්ය ඊ බෙල් ලතීන් ත්‍යාගය, ක්‍රිස්ටෝෆර් ඔබේසේකර ත්‍යාග ඒ අතරින් කිහිපයකි.
- මෙතුමා නීතිවේදියෙකු ලෙස කටයුතු කළ අතර, ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ ''අධ්‍යාපනඥයකු'' ලෙසද නොමැකෙන සටහනක් තැබීමට සමත් විය.

❖ **මෙතුමාගේ සේවාවන් සමහරක් :-**

1. සහිරා විදුහල කීර්තිමත් පාසලක් බවට පත් කිරීම.
2. සියළුම ආගමික ප්‍රතිපත්තිවලට ගරු කරමින් සහජීවනය රැක ගැනීම.
3. ජාතික නිදහස උදෙසා තමන්ව කැප කිරීම.
4. මුස්ලිම් සමාජයේ අධ්‍යාපනික දියුණුව වෙනුවෙන්ද, සුභ සිද්ධීන් වෙනුවෙන්ද නිතර අවදියෙන් පසුවීම.

## 25. ආර්ථිකය පිළිබඳව ඉස්ලාමීය මඟ පෙන්වීම

- ඉස්ලාමයේ ඉතා වැදගත් අංගයකි. ඉපැයීම සඳහා වූ අනුමත මාර්ග ඉස්ලාම් පෙන්වා දී ඇති අතර, මුස්ලිම්වරු එයට පටහැනි වූ කරුණුවලින් වැළකී සිටිය යුතුයි.
- ඉපැයීම හා වැය කිරීම හලාල් අන්දමින් ඉටුවීම අති වැදගත් වේ. ''විශ්වාසවන්තයිනි! නුඹලාගේ අන්‍යෝන්‍ය එකඟත්වය ඇතිව ව්‍යාපාරයෙන් මිස නීතිවිරෝධී මාර්ගවලින් එකිනෙකාගේ දේපළ නුඹලා ගිල නොගනු.'' (4 : 29)
- ''යමෙක් තවත් පුද්ගලයෙකුගෙන් සිඟමන් නොයැද සිටීම සඳහාද, තම පවුල වෙනුවෙන් ඉපයීම සඳහාද, අසල්වැසියන්ට සැලකීම සඳහාද, අනුමත කරන ලද භාණ්ඩ සොයා උපයන්නේද, ඔහු කියාමා දිනයේ පුන්සඳ මෙන් බැබළෙන මුහුණකින් යුතුව අල්ලාහ්ව හමුවන්නේය.'' යනුවෙන් නබි (සල්) තුමා පැවසුවේය. (අත්තබරානි).
- ''ආගමික නීති රීති (ගනුදෙනු සම්බන්ධ) දන්නා අය පමණක් වෙළඳපොළෙහි ගනුදෙණුවල නිරතවන්න. නොඑසේ නම් වෙළඳපොළට නොඑන්න.'' යනුවෙන් උමර් (රලි) තුමා පැවසුවේය.

❖ **ධනය ඉපැයීමේදී සැලකිලිමත් විය යුතු ෂරීආ ක්‍රමවේදයන්:-**

- මුස්ලිම්වරයෙකු නිතර හලාල් මාර්ගයෙන් ඉපැයිය යුතුයි.
- අවංක වෙළෙන්දාට අල්ලාහ්ගේ දයාව ලැබේ.
- අවශ්‍යතාව තිබෙන්නන්ට ණය දීමද, නැවත ණය පියවීමට උදව් කිරීමද මුඃමින්වරුන්ගේ ගුණාංග වේ.
- උකස හා බදුදීම අනුමත අන්දමින් අනුගමනය කළ යුතුයි.
- පොලිය, සූදු කෙලීම, රැවටීම යනාදී, අනෙකාගේ ධනය අවසරයෙන් තොරව භුක්ති විඳීම නොමනා ක්‍රියාවන් වේ.

❖ **ඉස්ලාම් අනුමත කළ ව්‍යාපාර ක්‍රම කීපයක් :-**

1. **අල් මුලාරබා** : පිරිසකගේ ප්‍රාග්ධනය, පිරිසකගේ ශ්‍රමය
2. **අල් මුරාබහා** : වෙළඳපොළෙහි මල අනුව ලාභයද එක්කර විකිණීම.
3. **අල් මුෂාරකා** : දෙදෙනෙකු හෝ වැඩි පිරිසක් එක්ව ප්‍රාග්ධනය යොදා ව්‍යාපාර කිරීම.

## 26. නිකාහ් - විවාහය

- ඉස්ලාමීය ජීවිතයේ පදනම වන්නේ පවුලය.
  ''නුඹලා අතර සිටින තනිකඩ අයටද, නුඹලාගේ වහලුන් හා වහලියන් අතර දැහැමියන්ටද විවාහ සිදු කර දෙනු... (24 : 32)''
- ''තරුණයනි, ශක්තිවන්තයින් විවාහ වන්න. මක්නිසාද යත් එය බැල්ම පාලනය කරයි. රහස්‍ය පෙදෙස ආරක්ෂා කිරීමද විශිෂ්ටය. ශක්තිය නොමැති පුද්ගලයින් උපවාසය රකින්න.'' එය ඔහුට ආරක්ෂාව ලබා දෙයි. (බුහාරි)
- කායික ශක්තිය හා ආර්ථික වශයෙන් බලවත් යම් පිරිමියෙකු විවාහ වීම සුන්නතයකි. මෙවැනි තැනැත්තකු අකුසල්හි නිරත වීම ගැන බියවන්නේ නම් විවාහවීම වාජිබ් වේ. මෙම කොන්දේසි ස්ත්‍රීන්ටද අදාළය. නමුත් ආර්ථික වශයෙන් වන කොන්දේසිය ඇයට අදාළ නැත.

❖ **ෂරීආ දැක්මෙන් විවාහයේ අරමුණු :-**

1. කායික හා මානසික ශක්තිය ඇති කිරීම.
2. සාලිහ්වූ පරම්පරාව බිහිකිරීම.
3. හොඳ සමාජ ක්‍රමයක් ඇති කිරීම.

- පවුල් ජීවිතය සන්සුන් හා විධිමත් වූ විට සමාජය නිවැරදි මගෙහි මෙහෙයවෙයි. විවාහය වගකීම් සහගත බව ඇති කරමින් හොඳ සමාජ ක්‍රමයක් තහවුරු කරයි.
- විවාහය මිනිසෙකු තුළ සන්සුන් බව හා සවිඥානක බව මෙන්ම, නිසි ලෙස කාර්යයන් ඉටුකිරීමේ හැකියාවද, අපරිමිත වගකීම් සහිත බවක්ද ගෙන දෙයි. මෙබැවින් අල්කුර්ආනය ස්වාමියා හා බිරිඳගේ බැඳීම සකීනා හෙවත් සන්සුන්භාවය යන වදනින් පැහැදිලි කරයි.
- විවාහය ආරක්ෂක කොටුවක් ලෙස සලකනු ලැබේ.
- ''දෙවියනි! අප බිරින්දෑවරුන් හා දරුවන් මගින් අපට ආස්වාදයක් ලබා දෙනු මැන. අප මුත්තකීන්වරුන්ගේ නායකයන් ලෙස පත් කරනු මැනව.'' (ෆුර්කාන් : 74)
- විවාහය නැමදුමකි.
- විවාහයේ අරාබි පදය ''නිකාහ්'' වේ.

❖ **මහ්රම්**

විවාහවීමට අනුමැතිය නොමැති ඉතා සමීප ඥාතීන් ''මහ්රම්'' වේ. මෙය කොටස් දෙකකි.

1. ස්ථිර මහ්රම් 2. තාවකාලික මහ්රම්

❖ **ස්ථිර මහ්රම්**

යම් පුද්ගලයෙකුට යම් යම් ඥාති ස්ත්‍රීන් විවාහ ගිවිස ගැනීම තහනම් වේ. මෙවැන්නක් ස්ථිර මහ්රම් යනුවෙන් හැඳින්වේ. මෙය හේතු තුනක් නිසාවෙනි.

1. ලේ ඥාතීන් 2. විවාහ සම්බන්ධතා 3. කිරි බී වැඩීමෙන්

❖ **(ලේ ඥාතීන්) රුධිර සම්බන්ධතා මහ්රම් :-**

1. මව, මවගේ මව ලෙස ඉහළට යන ඥාති සම්බන්ධතා.
2. දරුවන්, දරුවන්ගේ දරුවන් ලෙස පහළට යන ඥාති සම්බන්ධතා.
3. සීයා, ආච්චිගේ දරුවන්

❖ **විවාහ සම්බන්ධතා මහ්රම් :-**

1. බිරිඳගේ මව, බිරිදගේ මවගේ මව
2. බිරිඳගේ දරුවන් එම දරුවන්ගේ දරුවන්
3. පියාගේ බිරිඳ
4. පුතාගේ බිරිඳ, පුතාගේ පුතාගේ බිරිඳ

**❖ කිරි බීමෙන් වූ මහ්රම් :-**

1. කිරි පෙවූ ස්ත්‍රිය (කිරි මව)
2. කිරි මවගේ මව
3. කිරි මවගේ සැමියාගේ මව
4. කිරි මවගේ සහෝදරිය
5. කිරි මවගේ සැමියාගේ සහෝදරිය
6. කිරි මවගේ සැමියාගේ දරුවන් හා දරුවන්ගේ දරුවන්

**❖ තාවකාලික මහ්රම්**

1. සම කාලයේ එක්කුස උපන් සහෝදරියන් දෙදෙනෙකු බිරින්දෑවරු ලෙස විවාහවීම තහනම්.
2. ස්ත්‍රිය හා ඇයගේ පියාගේ සහෝදරිය.
3. ස්ත්‍රිය හා ඇයගේ මවගේ සහෝදරිය.
4. මුෂ්රික් වූ ස්ත්‍රිය
5. වෙනත් අයෙක්ව විවාහ කරගත් ස්ත්‍රිය

**❖ නිකාහ් හි අර්කාන් (ෆර්ළයන්)**

1. මනමාලයා, මනමාලිය
2. ඊජාබ් කබුල්
3. වලී
4. සාක්ෂිකරු

**❖ මනමාලයා**

- මුස්ලිම්වීම.
- සම කාලයේ සිව් දෙනෙකු (ස්ත්‍රීන්) විවාහ කර නොගත් පුද්ගලයෙකු වීම.
- මනමාලියට අජ්නබි වීම.
- හජ් සඳහා ඉහ්රාම් නොපැළඳූ අයෙකු වීම.

**❖ මනමාලිය**

- මුස්ලිම්වීම හෝ අහ්ලුල් කිතාබ් වීම.
- වෙනත් කෙනෙකුගේ බිරිඳ නොවීම.
- ඉද්දා රකින අයෙකු නොවීම.
- හජ් සඳහා ඉහ්රාම් නොපැළඳූ අයෙකු වීම.

**❖ ඊජාබ් (භාරදීම)**

- මනමාලිගේ භාරකරු වන වලී, ඇයව මනමාලයාට භර දීමේ ප්‍රකාශය.
- 'වලී' යනු නීත්‍යානුකූල භාරකරු

**❖ කබූල් (භාර ගැනීම, පිළිගැනීම.)**

- වලී විසින් භාර දෙනු ලැබූ මනමාලියව භාරගත් බවට මනමාලයා විසින් කෙරෙන ප්‍රකාශය.
- ස්ත්‍රියකට ස්වයංව විවාහවීමට නොහැකිය. ස්ත්‍රියකට තවත් ස්ත්‍රියක් විවාහ කර දීමටද නොහැකිය.
- වලීගේ අනුමැතියෙන් තොරව විවාහයක් වලංගු නොවේ.

❖ **වලී වශයෙන් සිටීමට සුදුසුකම් ලබන්නන් :-**

1. පියා
2. පියාගේ පියා
3. එක්කුස උපන් සහෝදරයා
4. පියාගේ සහෝදරයා
5. පියාගේ සහෝදරයාගේ පුතා
6. මනමාලියගේ සහෝදරයාගේ පුතා
7. මහේස්ත්‍රාත්තුමා (හාකිම්)
8. පියාගේ අඩ සහෝදරයාගේ පුතා

❖ **වලී සඳහා වූ සුදුසුකම් :-**

1. මුස්ලිම්වරයෙකු වීම.
2. පිරිමියෙකු වීම.
3. පරිණත අවධියට පත්ව සිටීම.
4. ස්වාධීන පුද්ගලයෙකු වීම.
5. සිහි බුද්ධියෙන් යුතු අයෙකු වීම.
6. පාප කර්මවල නිරත නොවන්නෙකු වීම.

❖ **සාක්ෂිකරුවන් (ෂාහිද්වරු)**

■ සාක්ෂිකරුවන් දෙදෙනෙක් නොමැති නිකාහ් වලංගු වන්නේ නැත.

❖ **ෂාහිද්වරුන්ගේ සුදුසුකම්**

- වලීවරයාගේ සුදුසුකම් සියල්ල තිබිය යුතුයි. අමතරව

■ ගිවිසුම කෙරෙන භාෂාව දැන සිටිය යුතුයි.

■ කථනය, සවන්දීම, බැලීම වැනි ඉන්ද්‍රිය හැකියාවන් තිබිය යුතුයි.

❖ **මහර් :-**

- විවාහයේදී මනමාලයා මනමාලිට ලබා දෙන අනිවාර්ය තෑග්ග මහර් වේ. මෙය වාජිබ්ය.

''නුඹලා විවාහ වූ කාන්තාවන්ට ඔවුන්ගේ මහ්රය තෑග්ගක් වශයෙන් (ගෞරවයෙන්) ලබා දෙනු'' (අන්නිසා : 5)

❖ **වලීමා :-**

■ විවාහ වූ යුවළ එක්වීමෙන් අනතුරුව දෙනු ලබන සාදය වලීමා වේ.

■ මෙය සුන්නාහ් මුඅක්කදා වේ.

## 27. ආදර්ශවත් මුස්ලිම් පවුල

- (25 අල් ෆුර්කාන් : 74)
  ''අපගේ දෙවියනේ ! අපගේ බිරියන්ද අපගේ දරුවන්ද අප සිත් පිනවන ආකාරයට පත් කරනු මැන.''
- අනස් (රලි) තුමා දෙස බලා නබි (සල්) තුමා වදාළ සේක. ''මාගේ දයාබර පුතේ, නුඹ පවුලේ අය සමඟ සිටින විට සලාම් කියන්න. එය ඔබට හා ඔබේ පවුලට දායාදයකි.''
- මිනිසෙකු සලාම් පවසා එයට යොමු වීම බරකත් ලබා දෙන ක්‍රියාවකි. එමගින් ඔවුන්ගේ ජීවිතයේ සතුට, සාමය ඇති කිරීමට හැකිය.

❖ **යහපත් සැමියෙකුගේ ගුණාංග :-**

1. බිරිඳට ගරු කර, සහයෝගය ලබා දෙයි.
2. බිරිඳ හා දරුවන්ව ආරක්ෂා කර ගනියි.
3. බිරිඳ හා දරුවන් සමඟ ගරුත්වයෙන් ක්‍රියා කරයි.

4. බිරිඳගේ හා දරුවන්ගේ වැරදි මනා ලෙස නිවැරදි කරයි.

5. තමන්ගේ දෙමව්පියන්, බිරිඳ හා දරුවන් අතර සමබරතාවය රකිමින් කටයුතු කරයි.

- බිරිඳ දේව තෘප්තිය අරමුණු කොට නිතරම සැමියාට අවනත වී ඔහුව තෘප්තිමත් කිරීම ඉලක්කය සේ සලකා කටයුතු කරයි.
- සැමියා තමා ගැන තෘප්තිමත් වී, මරණයට පත්වීමෙන් ස්ත්‍රිය ස්වර්ගයට පිවිසෙයි.
- ''මිනිසා වියදම් කරන දීනාර් අතරින් ඉතා විශිෂ්ට වන්නේ තමන්ගේ පවුලට වියදම් කරන දීනාර් වේ.'' (බුහාරි)
- ආදර්ශවත් මුස්ලිම් පවුලක දෙමව්පියන් තම දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලබා දීමට දායක වන අතර, එම දරුවන්ද අවංකව ඉගෙන ගන්නා අතර ආගමික දැනුමද දියුණු කර ගනියි.
- හදීසයකි : ''මිනිසෙකු පැමිණ නබිතුමාගෙන් මා හට ස්වර්ගයට පිවිසීමට අවශ්‍ය වන යමක් දැනුවත් කරනු මැන'' යනුවෙන් ඇසූ විට නබිතුමාණෝ ''නුඹ අල්ලාහ්ව සම කිරීමෙන් තොරව නමදින්න, සලාත් ඉටු කරන්න, සකාතය ගෙවන්න, ඥාතීන් සමඟ සුහද සම්බන්ධතා ඇති කරගන්න.'' යනුවෙන් පැවසූහ. (බුහාරි)

## 28. තලාක් සහ ඉද්දා

- විවාහය උතුම් ගිවිසුමකි. එය සදාකාලික සබඳතාවක් විය යුතු නිසාවෙන්ම අඹුසැමි දෙපළ අතර ඉටු කළ යුතු යුතුකම්, අයිතිවාසිකම් පිළිබඳව වෙන වෙනම පැහැදිලිව ඉස්ලාම් දේශනා කර ඇත.
- නමුත් විකල්පයක් නොමැති තත්ත්වයකදී දික්කසාදය නොවැලැක්විය හැකි අවසරයක් ලෙස යොදා ගැනීමට අනුමැතියද ලබා දී තිබේ. විවාහයක උතුම් අරමුණුවලට ළඟා විය නොහැකි තත්ත්වයකට අඹුසැමි යුවළ පත්වන්නේ නම්, ඔවුන් දෙපළ එක්කිරීමට ගත් උත්සාහයන් පරාජයට පත් වන්නේ නම් ඔවුන් වෙන්වීම උදෙසා ඉස්ලාම් අවසර ලබා දී තිබේ.
- විවාහ බැඳීම නොකැඩී පැවතීම උදෙසා, ඉස්ලාම් විවාහයට පෙර මනාල යුවළගේ ගැලපීම සලකා බැලීම හා දෙදෙනාගේ ස්ව කැමැත්ත හෙළි කිරීම අනිවාර්ය කර ඇත.
- ''අල්ලාහ් අනුමත කළ කරුණු අතරින් ඉතා පිළිකුල් සහගත ක්‍රියාව වනුයේ තලාක් හෙවත් දික්කසාදයයි.'' (අබුදාවුද්)
- ''ෂෙයිතාන් මෙලොව කරන ලද අනිටුකම් පිළිබඳව දිනපතාම ඉබ්ලීස් අසළට ගොස් ප්‍රකාශ කරයි. ඔවුන් අතරින් කෙනෙකු අද මට පවුල වෙන් කළෙමි.'' යනුවෙන් පැවසූ කල ඉබ්ලීස් බෙහෙවින් සතුටට පත්වේ. (මුස්ලිම්)
- ''දික්කසාදය යන්න පාපී ක්‍රියාවක් ලෙස වටහා ගත යුතුයි. නබිතුමා මෙසේ වදාළ සේක'' කරුණු තුනක් රඟපෑමක් ලෙස සිදු කළද, සත්‍ය වශයෙන්ම සිදු කළද, එය සත්‍යයක් වශයෙන් පිළිගැනෙයි. ඒවා අතරින් තලාකයද එකකි. (තිර්මිදි)

❖ **දික්කසාදය අනුමත වීමට තිබිය යුතු පියවර :-**

- සැමියා, බිරිඳ අතර වූ ගැටළුව තමන් අතරම විසඳා ගැනීමට උත්සාහ කළ යුතුයි.
- තමන් අතර විසඳා ගත නොහැකි තත්ත්වයක දෙපාර්ශවයේම අය එක්වී සමාදාන කිරීමට උත්සාහ දැරිය යුතුයි. එම උත්සාහයද බිඳ වැටුණේ නම් සැමියා තලාක් කිරීමට සූදානම් විය යුතුයි.

❖ **දික්කසාද පිළිබඳව නීති රීති පහත සඳහන් පරිදි වර්ග කළ හැකිය.**

1. **වාජිබ් වන තලාක් :-**

   සැමියා, බිරිඳ අතර මතු වූ ගැටළු නිරාකරණය කිරීම සඳහා ඉදිරිපත් වූ සමථකරුවන් ''ඔවුන් දෙදෙනා වෙන්වීම යහපත්, ඔවුන්ගෙන් අරමුණු ඉටුවෙන්නේ නැත.'' යනුවෙන් පැවසෙන විට තලාක් ලබා දීම වාජිබ් වේ.

2. **සුන්නත් වන තලාක් :-**

   යමෙකුගේ බිරිඳ සැමියාට අවනත නොවන්නියක් නම්, ආගමික කටයුතු නොමැත්තියෙක් නම්, දුර්ගුණාංග සහිත තැනැත්තියෙක් නම්, නැතහොත් බිරිඳ වෙත ප්‍රියමනාපව නොමැතිව ඇයගේ අයිතිවාසිකම් සැමියා ලබා නොදෙන්නේ නම් තලාක් කිරීම සුන්නත් වේ.

3. **මුබාහ් වන තලාක් :-**

   බිරිඳ වෙත පූර්ණ සෙනෙහසක් නොදක්වා ඇය වෙනුවෙන් කිසිඳු වියදමක් දැරීමට අකමැති, මසුරු වූ සැමියෙකු ඇයව තලාක් කිරීම මුබාහ් යන වර්ගයට අයත්ය.

4. **හරාම් වන තලාක් :-**

   යමෙක් තම බිරිඳට දේපළින් කොටසක් හිමි නොවිය යුතු අයහපත් අරමුණින් තම මරණය අභියස තලාක් කිරීම හෝ බිරියන් දෙදෙනෙකුගෙන් ඒක අයෙකුට තමන් සමඟ සිටීමටත් අනෙක් බිරිඳව ප්‍රතික්ෂේප කොට තලාක් කිරීම හරාම් වන තලාක් වේ.

❖ **දික්කසාදය ප්‍රධාන කොටස් තුනකට බෙදේ.**

1. **තලාක් :-**

   සැමියා බිරිඳව විවාහ බන්ධනයෙන් නිදහස් කිරීමේ ක්‍රමය. ''මම ඔබව තලාක් කරන්නෙමි.'' යනුවෙන් පැවසුවද එය එක් තලාකයක් වේ. මෙය ලිඛිතවද සිදු විය හැකිය.

2. **ෆස්කු :-**

   නිසි විවාහයක කොන්දේසි අසම්පූර්ණ තත්ත්වයක විවාහය අවලංගු වීම. සැමියා හා බිරිඳ කිරි ඥාතිත්වය යටතේ සහෝදර සහෝදරියන් යන්න විවාහයෙන් පසු හෙළි වුවහොත් වහාම දෙදෙනා වෙන් විය යුතුයි. එම විවාහයද අවලංගු වේ.

3. **කුල්උ :-**

   බිරිඳ සැමියාගෙන් විවාහ බන්ධනයෙන් නිදහස ඉල්ලා සිටීම. මෙවැනි අවස්ථාවේ ඇය සැමියාගෙන් ලබා ගත් මහරය නැවත භාර දිය යුතුයි. මෙය කාළිවරයෙකුගේ ඉදිරියේ සිදුවිය යුතුයි.

   - සැමියා බිරිඳගෙන් නිදහස් වීම. 'තලාක්'
   - බිරිඳ සැමියාගෙන් නිදහස්වීමට අයද සිටීම 'කුල්උ'

❖ **තලාක් පවසන ආකාරය හා අවස්ථාව සලකා බලා තලාකය වර්ග දෙකකට බෙදිය හැකිය.**

1. නිසි පරිදි තලාක් (තලාක් සුන්නි)
2. අනිසි පරිදි තලාක් (තලාක් බිද්ඉ)

1. **නිසි ක්‍රමය (තලාක් සුන්නි)**

1. මෙම වර්ගයේ තලාක් පහත කොන්දේසිවලට යටත්ය.

- කාන්තාව පිරිසිදුව සිටින (තුහුර්) කාලයේදී පැවසීම.
- ශාරීරික සම්බන්ධතාවයක් නොතිබුණු තත්ත්වයක පැවසීම.
- අනෙකුත් පිරිසිදු කාලයේදී (තුහ්රයේ) දෙවන තලාක් පැවසීම.
- ඊටත් පසු එළඹෙන පිරිසිදු කාලයේ තෙවන තලාක් පැවසීම.

❖ **''තුහුර්'' යනු කාන්තාවක් මාසික ඔසප්වීමෙන් මිදී පිරිසිදුව සිටින කාලය.**

2. **අනිසි ක්‍රමය (තලාක් බිද්ඉ)**

2. තලාක් තුනම එක්වර පැවසීම හෝ බිරිඳට මාසික ඔසප් වීම සිදු වූ කාලය තුළ තලාකය පැවසීම හෝ තුහුර් කාලය තුළ ශාරීරිකව එක් වූ තත්ත්වයේ තලාක් පැවසීම.

**තලාක්**

- **(රජ්ඊ) නැවත හැරිය හැකි (නැවත දෙදෙනා එක්විය හැකි)**
- **(බා ඉන්) නැවත හැරිය නොහැකි (නැවත එක්වීමට නොහැකි)**
  - **බා ඉන් සුග්රා (සුළු වෙන්වීම)**
  - **බා ඉන් කුබ්රා (මහා වෙන්වීම)**

**- තලාක් රජ්ඊ :-**

මෙය නැවත එක් වී ජීවත්වීමට අවස්ථාවක් ඇති තලාකයයි. පළමු හෝ දෙවන වර තලාක් පවසා, බිරිඳ ඉද්දා කාලයේ පසුවන විට නැවත ඇය සමඟ එක්වීම මෙසේ හැඳින්වේ.

**- තලාක් බා ඉන්:-**

මෙහි කොටස් දෙකකි.

නිසි ක්‍රමයට තලාක් දී තෙවන තලාක් නොපැවසූ තත්ත්වයක ඉද්දා කාලය සම්පූර්ණ වූයේ නම් නැවත නිකාහ් ගිවිසුමක් මගින් දෙදෙනාට එක්විය හැකිය. මෙය 'බයිනූනා සුග්රා' හෝ බා ඉන් සුග්රා යනුවෙන් හැඳින්වේ.

තෙවන තලාකයද අවසන් වී ඉද්දාද අවසන් වීම, වෙන්වීම ඉතා පැහැදිලි වේ. මෙය බා ඉනුල් කුබ්රා යනුවෙන් හැඳින්වේ. මෙම තත්ත්වයේ නැවත එක්වීමට අදහස් කරන්නේ නම්, ඇය වෙනත් කෙනෙකු සමඟ විවාහ වී, නැවත තලාක් තුනම අවසන් වී, ඉද්දා කාලයද ගත කර අවසන් වීමෙන් පසු පෙර සැමියා සමඟ විවාහ විය යුතුයි.

❖ **තලාක් වෙනත් නාමයන්ගෙන්ද හඳුන්වනු ලැබේ.**

- **ලිහාර්**
- **ලිආන්**
- **ඊලාඋ**

- **ලිහාර් :-**

තම බිරිඳව ශාරීරික වශයෙන් තම මවට සමාන කිරීම වේ. මෙලෙස සම කිරීම වෙනුවෙන් කෆ්ෆාරා හෙවත් වරදට පිළියම යොදා නැවත එක්විය හැකිය. එසේ නොමැති නම් තලාක් සිදුවනු ඇත.

- **ලිආන් :-**
  යනු යමෙක් බිරිඳ වෙත දුරාචාර චෝදනා එල්ල කර දිවුරා, පසුව දෙදෙනා දෙදෙනාට ශාප කර ගනිමින් වෙන්වීම.

- **ඊලාඋ :-**
  යමෙකු තම බිරිඳ අමතා ''අල්ලාහ් වෙත දිවුරා පවසමි. මම නුඹ සමග ශාරීරිකව එක්වන්නේ නැත.'' යනුවෙන් දිවිරීම. මෙම ප්‍රකාශයට සිව් මසක් අවකාශය ඇත. ඒ අතරතුර නැවත එක්විය හැකිය. නැත්නම් තලාක් සිදුවනු ඇත.

❖ **ඉද්දා :-**

- පදාර්ථය :- ''ගණන් කිරීම''
- මාස 3 ලෙස හෝ මාස 4 දින 10 ක් ලෙස සංඛ්‍යාත්මකව ගණන් කිරීමෙන් 'ඉද්දා' යන නම ලබා දී ඇත.
- සැමියා මියැදුණු කාන්තාව හෝ විවාහ බන්ධනයෙන් මිදුනු කාන්තාව නිශ්චිත කාලයක්, විශේෂ කොන්දේසි යටතේ ගත කරන කාලසීමාව ඉද්දා යනුවෙන් ඉස්ලාමීය ව්‍යවහාරයෙන් පැවසෙයි.
- ඉද්දා දේව විධානයකි. එය රැකීම ඉබාදත් වේ.

❖ **ඉද්දා මගින් අත්වන ඵලප්‍රයෝජන :-**

1. දේව විධානයක් බැවින් කුසල් හිමි වීම.
2. කාන්තාව ගැබ්ගෙන තිබේ නම්, දරුවාගේ පියාව තීරණය කර ගැනීමට අවස්ථාව ලැබීම.
3. තලාක් රජ්ඊ තත්ත්වයේ නැවත එක්වීමට අවස්ථාව ලැබීම.

❖ **සැමියා මියැදුණු කාන්තාවගේ ඉද්දා :-**

- මාස 04 ක් හා දින 10 ක් ඉද්දා රැකිය යුතුයි.
- ගර්භණී තත්ත්වයකදී දරු ප්‍රසූතිය දක්වා ඉද්දා රැකිය යුතුයි.

❖ **තලාක් කරන ලද කාන්තාවගේ ඉද්දා :-**

පළවෙනි හා දෙවැනි තලාක් පවසන ලද කාන්තාවද ඉද්දා තුහ්ර් 3 ක් රැකිය යුතුයි.

❖ **ඉද්දා කාලයේ වැළැක්විය යුතු කරුණු :-**

- ශරීරය අලංකාර කිරීම.
- විවාහ වීම.
- විවාහ කතාබහ සිදු කිරීම.
- ආභරණ පැළඳීම.

❖ ඉද්දා රකින බිරිඳ හට නඵකා හෙවත් ජීවන වියදම ලබා දීම සැමියාගේ වගකීමකි.

## 29. ලෞකික ජීවිතය පිළිබඳ ඉස්ලාමීය දැක්ම

- ලෞකික ජීවිතය පිළිබඳව සාමාන්‍යයෙන් මිනිසුන් තුළ විවිධාකාර අදහස් දක්නට හැකිය.
  - ''මෙලොව සහමුලින්ම අතහැර ජීවත්වීම විමුක්තියට මාර්ගයකි'' යනුවෙන් සමහරු පවසති.
  - ''මෙලෝ ජීවිතය අපට හිමිවුණු භාග්‍යයකි. එම අවස්ථාව සහමුලින් භුක්ති විඳිය යුතුයි.'' යනුවෙන් තව පිරිසක් පවසයි.

❖ නමුත් ඉස්ලාම් මධ්‍යස්ථ අදහසක් ඉදිරිපත් කරයි.

පරලොව ජීවිතය විමුක්තිය මිනිසාගේ ඉලක්කය වුවද මෙලෝ ජීවිතය දියුණු කිරීම සඳහා ඉපැයීමද ඉබාදතයක් ලෙස සලකයි.

- ලෞකික ජීවිතයේ ඉපයීම යහපත් සේවයකි. එය මිනිසා මත පැවරුණු වගකීම් තුනෙන් එකක් වන 'ඉමාරත්' හි අංගයකි.

- **අල්කුර්ආන් (6 - අල් අන්ආම් : 32)**

''මෙලෝ ජීවිතයෙහි කෙළි සෙල්ලමත් විනෝදයත් මිස අන් කිසිවක් නැත. සැබැවින්ම (අල්ලාහ්ට) බැතිමත් අය හට පරලොව ඉතා හොඳය. මෙය නුඹලා වටහා නොගන්නෙහිද?''

- **(64 අත්තගාබුන් : 15)**

''නුඹලාගේ වස්තුද නුඹලාගේ දරුවන්ද පරීක්ෂාවකි. අගනා තිළිණ ඇත්තේ අල්ලාහ් වෙතය.''

- මෙලොවෙහි නිසි පරිදි ජීවත්වීමෙන් පරලොවෙහි ජය අත් කරගත හැකි බව අපි වටහාගෙන, දෙලොව කරුණු අතර සමබරතාවයෙන් වෙසිය යුතුයි.

## 30. ඉස්ලාමීය සන්නිවේන මාධ්‍ය

- වත්මන් ලොව තුළ සන්නිවේදන මාධ්‍ය ඉතා ප්‍රබල හා ප්‍රකට බව අවිවාදිත කරුණකි. ඒවායේ විප්ලවීය වෙනස්කම් ඇගයීමට ලක් කළ නොහැකිය. මාධ්‍ය දායකත්වය මගින් අපට දහස් ගණන් අය සමඟ සම්බන්ධ විය හැකිය. මාධ්‍යයෙහි සමහරක් නම් ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය, සමාජ මාධ්‍ය ජාල යන ඒවා කිව හැකිය.
- ඉස්ලාමයේ මූලික මූලාශ්‍රයන් වන අල්කුර්ආන්, අස්සුන්නාහ් යන දෙක ඉතා පැරණි මාධ්‍යයන් වේ. අල්කුර්ආනය අද්විතීය මාධ්‍යයකි.
- නබි (සල්) තුමා රජවරුන්ට, ආණ්ඩුකාරවරුන්ට ඉස්ලාම් සම්බන්ධව දැනුවත් කිරීම පිණිස සන්දේශ යැවූහ. උමර් (රලි) තුමා තැපැල් සේවාව ''දීවානුල් බරීද්'' යන නමින් ආරම්භ කළහ. උමෙයියාවරුන්ගේ පාලන සමයෙහි එය ''දීවානුල් බරීද් වල් අක්බාර්'' යන නමින් දියුණු වුණි. මෙම සමයෙහි පරෙවියන්ද පණිවුඩ හුවමාරුවට යොදා ගැනුණි.

❖ **මාධ්‍ය භාවිතයේ රැකිය යුතු කොන්දේසි :-**

1. තහවුරු වී තිබීම. (සහතික වීම)
2. විශ්වාසනීයත්වය
3. මධ්‍යස්ථභාවය හා නිර්වද්‍යතාවය.
4. ජනතා සුභසෙත රැකීම.
5. සදාචාරය රැකීම.

## 31. උම්මත් ගැන වූ දැක්ම :

- 'උම්මත්' යන පදයෙහි අරුතය ''සමාජය'' යන්නයි.
- සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ විද්වතුන් එය නිර්වචනය කරන්නේ ''පොදු අරමුණක් සහිතව එක් වූ සමාජයක්'' යනුවෙනි.
- එනම් ''පාරම්පරික සිරිත් විරිත් මත, එකම ප්‍රතිපත්තියක් අනුව, එකම ප්‍රදේශයක ජීවත්වීම, එක් පොදු පදනමක් මත පිහිටා සංකේන්ද්‍රණය වන ජන සමූහයක්'' මෙහි අදහස් වේ.

- කාලයාගේ දියුණු වීමත් සමඟ මිනිසා දියුණු වී විවිධ වෙනස්වීම්වලට ලක්වුණි. අදහස්, අරමුණු විවිධ වීමත් සමඟ කුඩා සමාජ බිහි වුණි. මෙලෙස බෙදී වෙන් වුණු පිරිස් එකමුතු කිරීමේ කාර්ය භාරය අල්ලාහ් නබිවරුන්ට පවරා ඇත.
- මුස්ලිම් උම්මත් හි බිහිවීම නබිවරුන්ගේ පියා වන ඉබ්රාහීම් (අලෛ) තුමාණන් හා ඉස්මායිල් (අලෛ) තුමාගේ ඉලක්කයද ඇතුලත් වූ සිහිනය වේ.
- මුස්ලිම් උම්මත් කොටස් වශයෙන් වෙන්වීම සම්බන්ධව නබි (සල්) තුමාණන් අවවාද කර ඇත. ''මාගේ සමාජය කොටස් 73 කට බෙදෙයි. එයින් එක් කොටසක් පමණක් නිරයට පිවිසෙයි.'' යනුවෙන් වදාළ සේක.

❖ **අල්කුර්ආන් හා සුන්නාහ්ව 'උම්මත්' යන ව්‍යුහය ආරක්ෂා කර ව්‍යාප්ත කිරීමට විවිධ මඟපෙන්වීම් ලබා දී ඇත. එයින් සමහරක්**

1. අල්කුර්ආන් හා සුන්නාහ්ව දැඩිව අනුගමනය කිරීම.
2. නායකත්වයට අවනත වීම.
3. එකමුතුව කරන යුතුකම්වලට වැදගත් තැනක් ලබා දීම.
4. තනි පුද්ගල අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දීම.
5. පොදු විෂයක විවිධ අදහස්, විරෝධතා මතුවන කල ඒකමතික තීරණයකට එළඹ පිළිගැනීම.
6. මස්ජිද් මගින් මුස්ලිම්වරුන්ව එක් කිරීම සිදුවීම.
7. සාමය රැකීම.

❖ **ලාංකික ජනයා වශයෙන් අපි අනුගමනය කළ යුතු මඟපෙන්වීම් :-**

1. මාතෘ භූමියට ආදරය කිරීම.
2. ජනතා හැඟීම්වලට ගරු කිරීම.
3. මාතෘ භූමියේ සමඟිය වෙනුවෙන් කටයුතු කිරීම.
4. රට ජාතිය මුහුණපාන අභියෝගවලට එක්ව මුහුණ දීම.
5. රටේ නීතිරීතිවලට ගරු කිරීම.
6. පොදු කටයුතුවලදී පෞද්ගලික, ආගමික, ජාතිවාදී මානසිකත්වයෙන් මිදීම.
7. සමාජ විරෝධි ක්‍රියා තුරන් කිරීමට සහයෝගය දීම.
8. ජාතික භාෂාව ඉගෙන ගැනීම.
9. පොදු අරමුණු අනුගමනය කිරීම.